ISSN 1391 - 1031
2019 ඔක්තෝබර්
25 වෙළුම 06 කලාපය

ආධාරය රු 40/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"සෑම විප්ලවයකින්ම අති විශාල ජන සංඛ්‍යාවක ජීවිත තුළ තියුණු වෙනස්කම් ඇති කෙරෙන්නේය. එවැනි වෙනසක් ඇති වීමට කල් යල් මෝරා තිබේ නම් මිස, නියම විප්ලවයක් සිදු විය නොහැකිය. එසේම, පුද්ගලයෙකුගේ ජීවිතයේ සිදුවන ඕනෑම වෙනසක් ඔහුට බොහෝ දේ උගන්වන, සාරවත් අත්දැකීම් ලබා දෙන සහ බලවත් චිත්ත වේගාත්මක කුහුල් කම් ගෙන එන ලෙසටම, විප්ලවද, කෙටි කාලයක් තුළ මුළු ජනතාවටම සාරවත් හා අගනා පාඩම් උගන්වයි."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**5වැනි වෙළුම,**
**189 පිටුව**

## 03
### ජනාධිපතිවරණය...




නව විකල්ප දේශපාලන බලවේග යකට මෙම ජනාධිපතිවරණයේදී වෙනදා නොතිබූ අවස්ථාවක් හා ඉඩක් ලැබී තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය අපේක්ෂා කරන....

## 07
### බැංකුව විකිණීමේ...




නව සංශෝධනයන් මගින් රජයේ ඇපවීම ඉවත් කර ඇත. භාණ්ඩාගාරයට හා මහ බැංකු මුදල් මණ්ඩලයට ඇති මැදිහත්වීමේ බලතලද ඉවත් කර සීමාකිරීම කර ඇත. වඩා බරපතළ කරුණ වන්නේ,...

## 09
### සමාජවාදී රටක ආගමික...



1972 දී ගන්නා ලද ජන ලේඛනයේදී සෝවියට් පුරවැසියන් සියයට 93කට වැඩි දෙනෙක් ස්වකීය ජාතියට අයත් බස, මව් බස ලෙස...

## 11
### විද්‍යාව බිහිවීමේ...



පාසල් අධ්‍යාපනයේදී සමහර විද්‍යාත්මක සොයා ගැනීම් පුද්ගල කේන්ද්‍ර හා අහම්බීය දේ ලෙස උගැන්වීම නිවැරදි නොවේ. උදාහරණයක් ලෙස ගුරුත්වාකර්ෂණය සොයා ගැනීම...

සංවාදය................................ 05
තරුණ................................ 04
ආවර්ජනා........................ 06
ජාත්‍යන්තර....................... 08
කාන්තා................................ 10
කාලීන....................... 12
වේදිකාව........................... 13
විශේෂාංග...................... 14




# අපි තරඟ වදින්නේ ජයග්‍රහණය වෙනුවෙන්

## ජාතික ජන බලවේගය

ජාතික ජනබලවේගයේ ජනාධිපති ධුර අපේක්ෂකයා ලෙස අනුර කුමාර දිසානායක සහෝදරයා ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ එළඹෙන ජනාධිපතිවරණය ජයග්‍රහණය කිරීම වෙනුවෙන් බව ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, අවුරුදු 71ක් පවතින දේශපාලනයෙන් හෙම්බත් වූ ජනතාවට අනුර සහෝදරයා ජයග්‍රහණය කරවීමෙන් එය ජනතා ජයග්‍රහණයක් බවට පරිවර්තනය කර ගත හැකි යැයි පෙන්වා දුන්නේය.

විජිත හේරත් සහෝදරයා මේ බව පැවසුවේ එළඹෙන ජනාධිපතිවරණය පිළිබඳව නියමුවා කරන ලද විමසුමකට පිළිතුරු දෙමිනි. දැනටමත් බලවේග ගණනාවක් ජාතික ජන බලවේගය වටා ඒකරාශි වී ඇතැයි කියා සිටි විජිත හේරත් සහෝදරයා තවත් සංවිධාන හා සිවිල් පුද්ගලයින් ගණනාවක් ජාතික ජන බලවේගය සමග අත්වැල් බැඳගැනීමට සාකච්ඡා පවත්වමින් සිටින බව සඳහන් කළේය.

"එළඹෙන ජනාධිපතිවරණය මෙරට දේශපාලනයේ තීරණාත්මක මංසංන්ධියක්. නිදහසින් වසර 71කට පසුව සහ නව ලිබරල් ආර්ථිකයේ වසර 40ක විනාශකාරිත්වයෙන් පසුව එළඹෙන තීරණාත්මක අවස්ථාවක්. සැබෑ සමාජ, ආර්ථික, දේශපාලන පරිවර්තනයක් ආරම්භ කිරීමට හොඳම අවස්ථාවක් රටට ලැබී තියෙනවා. මේ අවස්ථාවේ බුද්ධිමත්ව හිතන හැමදෙනාම තම තමන්ට පුළුවන් ආකාරයෙන් මැදිහත් වෙලා ජනතාව හිතන සාම්ප්‍රදායික රටාව වෙනස් කළොත් රටට නිසැක ලෙසම ජයග්‍රහණයක් ගෙන්න පුළුවන්කමක් තියෙනවා.

රට මේ විනාශකාරිත්වයට ඇදගෙන ගිය නිල් කොළ පොහොට්ටු බංකොලොත් දේශපාලනයට තිත තියන එක ආරම්භ කරන්න ජනතාවට පුළුවන්. විශේෂයන්ම රටක් විදිහට තමන් විකල්ප මඟකට හැරෙන්න සූදානම් බව පෙන්වන්න ජනතාවට මේ අවස්ථාව පාවිච්චි කරගන්න පුළුවන්. ජනතාවට ජාතික ජන බලවේගයේ අනුර දිසානායක සහෝදරයා හැරෙන්න තෝරාගන්න වෙනත් විකල්පයක් නැහැ." විජිත හේරත් සහෝදරයා අවධාරණය කළේය.

## යහපත් දේශපාලනයක් වෙනුවෙන් ජාතික ජන බලවේගය සමග එක්වන්න

### ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



ප්‍රතිගාමී කඳවුරු පරාජය කළ හැකි දේශපාලන පරිණත කණ්ඩායම ජාතික ජන බලවේගය බව අවධාරණය කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, රට ගිලී තිබෙන දේශපාලන බේදවාචකය නිමා කර යහපත් දේශපාලනයක් රට තුළ ගොඩනැගීම සඳහා ජාතික ජන බලවේගය සමග එක්වන ලෙස සියලු ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 05වැනිදා බත්තරමුල්ල අවකාශ මධ්‍යස්ථානයේදී පැවති ජාතික ජන බලවේගයේ මාධ්‍ය හමුව අමතමිනි. මෙහිදී තවදුරටත් කරුණු දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද පැවසීය.

"ජාතික ජන බලවේගය වටා එකතු වී ඉන්න සියලුම ප්‍රගතිශීලී වාමාංශික කණ්ඩායම්වල එකඟතාවයෙන් ජනාධිපති අපේක්ෂකයා ලෙස අනුර කුමාර දිසානායක සහෝදරයා ඉදිරිපත් කළා. ඒ සමගම සමාජයේ විශේෂ උනන්දුවක් ඇතිවී තිබෙනවා. මේ ධනේශ්වර කඳවුරේ පක්ෂ දෙකට රට හදන්න බැහැ කියලා ඔප්පු කරලා ඉවරයි. මෙතෙක් කලක් රට පාලනය කරපු අයම නැවතත් රට හදන්න කියලා ජනතාවගෙන් බලය ඉල්ලනවා නම් එම කණ්ඩායම් පරාජයට පත් කරන්න එයම එක හේතුවක් වෙනවා. ඒ නිසා ජනතාව තවදුරටත් එම කණ්ඩායම්වලට රැවටිය යුතු නැහැ. අපේ රටට ආර්ථික සංවර්ධනයක්, ජාතික සමගිය ගොඩනැගීම, දේශපාලන සදාචාරයක් ඇති කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම කළ හැක්කේ ජාතික ජන බලවේගයට පමණයි."

## දේශපාලන මෂමානවක සංස්කෘතියක් නැවත රටට අවශ්‍යයි

### ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා



ජාතික ජන බලවේගය ලෙස ජනතා විමුක්ති පෙරමුණත් තවත් පාර්ශ්ව ගණනාවකුත් එක්ව අපේ රට ගොඩනැගීමේ කාර්යභාරයට උරදී සිටින බවත් එහිදී ජ.වි.පෙ. පළාත් පාලන නියෝජිතයින්ට විශාල කාර්යභාරයක් පැවරෙන බවත් පෙන්වා දුන් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා, දේශපාලන මෂමානවක සංස්කෘතියක් නැවත අපේ රටට හඳුන්වා දිය යුතු බවත් ආරම්භ කරන සටන දේශපාලන ජයග්‍රහණයකින් කෙළවර කළ යුතුව තිබෙන බවත් ප්‍රකාශ කළේය.

වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 01වැනි දින කොළඹ නව නගර ශාලාවේදී පැවති "ගම-රට කොළඹට" ජවිපෙ පළාත් පාලන නියෝජිත හමුව අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් පළ කළ වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා මෙසේද පැවසීය.

"මේ වන විට ජනතාව දේශපාලනය සම්බන්ධයෙන් අතෘප්තියක සිටිනවා. සියලු දේශපාලනඥයන් වැඩක් නැහැ කියලා පොදුවේ කතාබහක් තිබෙනවා. ජනතාවගේ ඡන්දයෙන් බලයට ආපු පිරිස් අපේ රට ගොඩනැගීමට අසමත් වෙලා තිබෙනවා. 2018 පළාත් පාලන මැතිවරණයෙන් පසු දැන් වසර එක හමාරක් ඇතුළත මාධ්‍යවල වාර්තා වුණේ ඒ ජනතා නියෝජිතයින්ගේ සදාචාරය පිළිබඳ ප්‍රශ්නයි. ජනතාවගේ කලකිරීම සාධාරණයි.

ජනතා විමුක්ති පෙරමුණේ අපේ මන්ත්‍රී කණ්ඩායම එවැනි කිසිදු චෝදනාවකට ලක්වුණේ නැහැ. ජනතාව ලබාදුන් ඡන්දයේ ගෞරවය ආඩම්බරයෙන් ආරක්ෂා කළා. එවැනි පිරිසකට විතරයි අපේ රට ගොඩනැගීමේ කාර්යභාරය අතට ගන්න පුළුවන්."

**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# සටන් බිම

## ගුරු විදුහල්පති දෙදින වැඩවර්ජනය රට පුරා සාර්ථකව



ගුරු විදුහල්පතිවරුන්ගේ වසර 22ක් තිස්සේ පවතින වැටුප් විෂමතාවය විසඳීම ඇතුළු ප්‍රධාන ඉල්ලීම් කිහිපයක් මුල්කරගෙන ගුරු විදුහල්පති වෘත්තීය සමිති විසින් පසුගිය සැප්. 26-27 දෙදින අසනීප නිවාඩු වාර්තා කිරීමේ වෘත්තීය ක්‍රියාමාර්ගය රට පුරා ඉතා සාර්ථක බව ලංකා ගුරු සේවා සංගමයේ ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා පවසයි. එමෙන්ම 26 දින මෙම ඉල්ලීම් මුල්කරගනිමින් කොළඹදී දැවැන්ත විරෝධතාවයක් පැවැත්වීමට කටයුතු කර තිබුණි. එහිදී ජනාධිපති ලේකම් කාර්යාලය දක්වා පැවති පා ගමනින් පසු බලධාරීන් සමග සාකච්ඡා කළ නමුදු යහපත් ප්‍රතිඵලයක් නොලැබුණ හෙයින් ජනාධිපතිවරයා සමග සාකච්ඡාවක් ලබාදී මෙම ගැටලුව විසඳීමට කටයුතු නොකළහොත් දින පහක වැඩවර්ජනයක් සඳහා සූදානම් බවද මෙහිදී මහින්ද ජයසිංහ සහෝදරයා පැවසීය.

මෙම වැඩවර්ජන ක්‍රියාමාර්ගය කඩාකප්පල් කිරීම සඳහා ආණ්ඩුව විසින් විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබූ බවද එම සියලුම ක්‍රියාමාර්ග පරාජය කර රට පුරා සියලු ගුරු විදුහල්පතිවරුන් මේ සඳහා සහභාගි වූ බවද මහින්ද ජයසිංහ සහෝදරයා අවධාරණය කළේය.

ගුරු විදුහල්පති ක්ෂේත්‍රයේ වෘත්තීය සමිති 31ක් මෙම ක්‍රියාමාර්ගය සඳහා සහභාගි වී සිටි අතර ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීම් අතර වසර 22ක් පුරා පවතින වැටුප් විෂමතාවය විසඳීමත්, දළ ජාතික නිෂ්පාදිතයෙන් අධ්‍යාපනය සඳහා 6% ක් වෙන් කිරීමත්, දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීම නැවතීමත්, කිසිදු සුදුසුකමක් නොමැති දේශපාලන ගැත්තන් සඳහා අධ්‍යාපන සේවයේ වැටුප් හා වරදාන දීම නතර කිරීමත්, ගුරුවරුන්ගේ අනවශ්‍ය කොළ පිරවීම නැවතීමත්, 2016 දී අහිමි කර ඇති විශ්‍රාම වැටුප යළි ලබාදීමත් යන ඉල්ලීම් විය.

## අපේක්ෂාවේ අපේක්ෂක ජය තහවුරු කරන වැඩකරන ජනතා සමුළුව මුළුදෙයි



ජාතික ජන බලවේගය නියෝජනය කරමින් ජනාධිපතිවරණයට ඉදිරිපත් වන අපේක්ෂාවේ අපේක්ෂක අනුර කුමාර දිසානායක සහෝදරයාගේ ජය තහවුරු කරන 'ජන බල සටන - හෙට දින දිනන' තේමාව යටතේ මුළු දුන් වැඩකරන ජනතා සමුළුව පසුගිය සැප්. 12වැනි දින කොළඹ සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණයේදී පැවැත්විණි.

අනුර කුමාර දිසානායක සහෝදරයා ඇතුළුව ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයා සහ රාජ්‍ය, අර්ධ රාජ්‍ය, වතු, පෞද්ගලික අංශයේ වෘත්තීය සමිති නියෝජනය වෘත්තීය සමිති නායකයින්ගේත් ජාතික විද්වත් සංවිධානය නියෝජනය කරමින් කැළණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය චන්දන අබේරත්න ඇතුළු විද්වත් සංවිධානයේ නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් මෙම සමුළුව පවත්වනු ලැබීය.

## ගැටලු විසඳීමට බලකරමින් ලංගම සේවකයෝ උද්ඝෝෂණයේ



ශ්‍රී ලංගම සේවකයින්ගේ දැවෙන ප්‍රශ්නවලට විසඳුම් ලබාදීම සඳහා වන චක්‍රලේඛයන් නිකුත් නොකිරීමට එරෙහිව කළමනාකාර සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට බලපෑම් කිරීම වෙනුවෙන් සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමය පසුගියදා කොළඹදී උද්ඝෝෂණයක් පැවැත්විය.

ලංගම සේවක ඉල්ලීම් ලෙස රු. 2500/-ක අන්තර් දීමනා මුදල ලංගම සේවකයින්ට ලබාදීමටත්, විධායක සහ විධායක නොවන සේවකයින්ගේ වැටුප් සංශෝධනය කිරීමටත්, අනියම් සහ කොන්ත්‍රාත් සියලු සේවකයින් වහාම ස්ථිර කිරීමත් ඇතුළු ඉල්ලීම් කිහිපයක් මූලික කරගෙන මෙම වෘත්තීය ක්‍රියාමාර්ගය පැවැත්වූ බව සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමයේ ප්‍රධාන ලේකම් සේපාල ලියනගේ සහෝදරයා පැවසීය.

## විශ්වවිද්‍යාල සේවකයින් අඛණ්ඩ වැඩවර්ජනයක




විශ්වවිද්‍යාල සේවයේ පැන නැගී ඇති වැටුප් ගැටලු මූලික කර ගනිමින් පසුගිය සැප්. 10වැනි දින සිට විශ්වවිද්‍යාල වෘත්තීය සමිති එකමුතුව මගින් රට පුරා අඛණ්ඩ වැඩවර්ජනයක නිරතව සිටී. රට පුරා විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවකයින් 16,000ක් පමණ මෙම වැඩවර්ජනය සඳහා එක් වී සිටින අතර ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීම් ලෙස සියලු සේවකයින්ට බලපාන වැටුප් ගැටලුව විසඳීමටත් වැටුප් විෂමතා ඉවත් කිරීමටත් එකඟතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීමටත් අයවැයෙන් වැඩි කළ රු. 2500/- දීමනාව ලබාගැනීමත් ආදී ඉල්ලීම් කිහිපයක් ඇතුළත් බව විශ්වවිද්‍යාල වෘත්තීය සමිති එකමුතුවේ සම කැඳවුම්කරු විජයතිලක ජයසිංහ සහෝදරයා පවසයි. මෙම වැඩවර්ජනයට සමගාමීව සෑම විශ්වවිද්‍යාලයක් ඉදිරිපිට අඛණ්ඩ විරෝධතා උද්ඝෝෂණ පැවති අතර ඉල්ලීම් සඳහා විසඳුම් ලැබෙන තෙක් අඛණ්ඩ අරගලයක නිරත වන බවද ඔහු පැවසීය.

# එතෙරින්...

## අරුන් ග්‍රීසියේ කොමියුනිස්ට් තරුණ උළෙලට



සමාජවාදී තරුණ සංගමයේ අරුන් හේමචන්ද්‍ර සහෝදරයා සහ ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ උප සභාපතිනි, සමාජවාදී ශිෂ්‍ය සංගමයේ කල්පනා මධුභාෂිණි සහෝදරිය ග්‍රීසියේ කොමියුනිස්ට් පක්ෂයේ තරුණ සංගමයේ තරුණ උළෙල සඳහා සහභාගි වූහ. පසුගිය සැප්. 19- 21 දිනවලදී ග්‍රීසියේ ඇතැන්ස් නුවරදී පැවැති මෙම උළෙලට රටවල් 32ක කොමියුනිස්ට් සංවිධාන 35ක් පමණ නියෝජනය කරමින් නියෝජිතයෝ රැසක් එක්වූහ.

## බංගලාදේශ ශිෂ්‍ය සමුළුවට ශානිකා



බංගලාදේශ සමාජවාදී පක්ෂයේ ශිෂ්‍ය අංශය වන සමාජවාදී ශිෂ්‍ය පෙරමුණේ (SSF) 5වැනි සමුළුවට ලංකාවේ සමාජවාදී ශිෂ්‍ය සංගමය සහ සමාජවාදී තරුණ සංගමය නියෝජනය කරමින් ශානිකා හංසිනී සහෝදරිය සහභාගි වූවාය. මෙම සමුළුවට සිසුන් හා තරුණයින් 10,000කට වැඩි පිරිසක් එක්වී සිටියහ. ලංකාවට අමතරව ඉන්දියාව, නේපාලය, මැලේසියාව හා ජර්මනිය රටවලින්ද තරුණ ශිෂ්‍ය නියෝජිතයෝ සමුළුවට පැමිණ සිටියහ.

## මැලේසියාවේ සමාජවාදී පක්ෂය හා ජ.වි.පෙ. අතර හමුවක්



ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මැලේසියානු සමාජවාදී පක්ෂයේ ප්‍රධාන ලේකම් සිවරාජන් සහෝදරයා අතර හමුවක් පසුගියදා මැලේසියාවේ සමාජවාදී පක්ෂයේ ප්‍රධාන කාර්යාලයේදී සිදු විය. ආසියා පැසිපික් කලාපයේ පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා සභාපතිවරුන්ගේ වැඩමුළුවකට මැලේසියාවේ සංචාරයක් සිදුකළ අතරතුර මෙම හමුව යොදාගෙන තිබුණි. මෙහිදී මැලේසියානු වමේ ව්‍යාපාරයේ වත්මන් තත්වය පිළිබඳව සාකච්ඡා කළ අතර ඉදිරියේදී ජ.වි.පෙ. සමග පක්ෂ අතර සබඳතා ඇතිකර ගැනීමටද මූලික සාකච්ඡාවක් මෙහිදී සිදුකර ඇත.

## අනුරට සහායට විදෙස් රටවලින් රැස්වීම්



ජාතික ජන බලවේගයේ අපේක්ෂක අනුර කුමාර දිසානායක සහෝදරයාට සහාය පළකරමින් විදෙස් රටවලත් රැස්වීම් සූදානම් කරනු ලැබ ඇත. කුවේට්, ඉතාලියෙ නගර රැසක හා බෙල්ජියම, ස්වීඩනය, ඩෙන්මාර්ක් රටවල මෙම රැස්වීම් සූදානම් කර ඇත. කුවේට්හි නවාලි බොයිස්කවුට් ශාලාවේ රැස්වීම ඔක්තෝබර් 04 පැවැත්වෙන අතර ඒ සඳහා ජාතික විද්වත් සංවිධානයේ මාධ්‍ය ප්‍රකාශක නීතිඥ හර්ෂණ රාජකරුණාද, ඉතාලියේ රැස්වීම සඳහා කලාශිල්පී ජගත් මනුවර්ණද ස්වීඩන්, ඩෙන්මාර්ක්, බෙල්ජියම, රැස්වීම් සඳහා ජන නියමු කලාකරුවන් වෙනුවෙන් ප්‍රවීන ශිල්පිනී සමන්මලී ෆොන්සේකාද සහභාගිවීමට නියමිතය.

## සයිප්‍රස් වන්දි ඉල්ලා යළි පාරට




සයිප්‍රස්හි සේවය කළ ශ්‍රී ලාංකික විශාල පිරිසකට ලැබිය යුතු වන්දි මුදල් ලබා ගැනීමට මැදිහත්වන ලෙස රජයට බලකරමින් උද්ඝෝෂණයක් යළි පසුගියදා සැප්තැම්බර් 17වැනිදා කොළඹ කොටුව දුම්රියපළ ඉදිරිපිටදී පැවැත්විනි. සයිප්‍රස් - ශ්‍රී ලංකා සේවක එකමුතුව හා එතෙර අපි සංවිධානය මෙම උද්ඝෝෂණය සූදානම් කර තිබූ අතර ශ්‍රමික නියෝජිතයින්, පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, ලක්ෂමන් නිපුණආරච්චි සහෝදරයා ඇතුළු පිරිසක් මෙයට සහභාගි වූහ. උද්ඝෝෂණයෙන් අනතුරුව අදාළ වන්දි පිළිබඳ ලේඛන විදේශ කටයුතු අමාත්‍යාංශයේ උසස් නිලධාරීන්ට භාරදීමක්ද විදේශ කටයුතු අමාත්‍යාංශයේදී සිදු කෙරිණි.

## ජානක අධිකාරී WFTU සමුළුවට



යහපත් රටක්, යහපත් ලෝකයක් ගොඩනැගීමේ අරගලයට දේශසීමා නැහැ" මෙම තේමාව යටතේ ලෝක වෘත්තීය සමිති සම්මේලනයේ ආසියා පැසිෆික් කලාපීය සමුළුව පසුගිය සැප්තැම්බර් 24 - 25 දෙදින තුළ නේපාලයේ කත්මණ්ඩු අගනුවරදී පැවැත්විණි. එම සමුළුවට ලංකාවේ ප්‍රබලම වෘත්තීය සමිති ලෙස සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනයත්, අන්තර් සමාගම් සේවක සංගමයත් නියෝජනය කරමින් සමාජවාදී කම්කරු සංගමයේ නීතිඥ ජානක අධිකාරි සහෝදරයා සහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථා සේවක සංගමයේ උප සභාපති ඉංජිනේරු මංජුල සිරිසෝම සහෝදරයා සහභාගි වූහ.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# සංවර්ධනයේ මිථ්‍යාව හා ඇත්ත...

ලෝකයේ නොදියුණු පසුගාමී ධනවාදී රටවල පාලකයෝ එම රටවල ජනතාව තුළ “සංවර්ධනය” පිළිබඳ මිථ්‍යාවක් තහවුරු කරමින් සිටිති. මේ මොහොතේ ලංකාව තුළද මෙම ‘සංවර්ධන මිථ්‍යාව’ තදින් පවතී. ඒ රටක සිදුකරන සුවිසල් ඉදිකිරීම් සංවර්ධනයේ මිම්ම ලෙස අර්ථකථනය කිරීමය.

රට සිදුකරන ඉදිකිරීම් (මාර්ග, පාලම්, ගොඩනැගිලි, කුළුණු ආදිය) රටක සංවර්ධනයේ එක් පැතිකඩක් මිස සමස්තය නොවේ. කිසියම් ඉදිකිරීමක් රටක සංවර්ධනය නිරූපණය කිරීමට නම් ප්‍රධාන සාධක දෙකක් ඉන් පිළිබිඹු විය යුතුය. එකක් එම ඉදිකිරීම රටේ ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵලයක් විය යුතුය. අනෙක එම ඉදිකිරීම රටේ ආර්ථික සංවර්ධනයට ප්‍රබල දායකත්වයක් සපයන්නක් විය යුතුය. එහෙත් ලංකාවේ පසුගිය කාලයේ ඉදිකළ බොහෝ ඉදිකිරීම් ඉහත සාධක දෙකටම අයත් නොවේ. ඒවා රටේ සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වූ දේවල් නොව පිටින් ණය ගෙන ණයට හැදූ ඒවා විය.

එසේම එකී බොහෝ නිර්මාණ ආර්ථිකයට හෝ සංවර්ධනයට අවම දායකත්වයක්වත් නොදක්වන ‘සුදු අලි’ බවට පත්වූ ඒවා විය. පාලකයාට තිබුණේ ප්‍රධාන අරමුණු දෙකකි. එකක් රට ණය කොට හෝ තමන්ගේ නම ප්‍රසිද්ධ කර ගැනීමත් අනෙක එම ඉදිකිරීම් මගින් විශාල ලෙස මුදල් හොරකම් කර ගොඩගසා ගැනීමත්ය.

ලංකාවේ බොහෝ ඉදිකිරීම් රටේ සංවර්ධනයට දායකවන ඒවා නොව, රටේ ණය බර වැඩිකිරීමටත්, ජනතාව මත පැටවෙන බදු බර වැඩකිරීමටත් දුප්පත්කම වැඩිකිරීමටත්, රටේ ස්වෛරීත්වය දුර්වල කිරීමටත් දායක වූ ඒවා විය. මහින්ද රාජපක්ෂ පාලනය තුළ නිර්මාණය කළ හම්බන්තොට වරාය, රටේ සංවර්ධනයට ලබාදෙන දායකත්වය කුමක්ද? කිසිවක් නැත. ඒ විතරක් නොව අවසානයේ එය කෙළවර වූයේ ණය ගෙවාගත නොහැකිව චීනයේ සමාගමකටම වසර 99කට වරාය බදු දෙනු ලැබීමෙන්ය. මත්තල ගුවන්තොටුපළද ඊළඟට විකුණා දැමීමට නියමිතව ඇත.

මෙම ඉදිකිරීම්වලට අලුතින් එකතු වූ උදාහරණය වන්නේ පසුගියදා විවෘත කළ නෙළුම් කුළුණය. නෙළුම් කුළුණ විවෘත කරමින් වත්මන් ජනාධිපතිවරයා ප්‍රසිද්ධියේ පළ කළ අදහස් අතර ඇඟ කිලිපොළා යන කරුණුද තිබුණි. ඔහුට අනුව මෙම ඉදිකිරීමේදී මූල්‍ය වංචා රැසක් සිදුව තිබේ. ඉදිකිරීමේ ප්‍රමාදයන් නිසා සිදුවූ පාඩුද තිබේ. එසේම, මෙම කුළුණ තවම වැඩ අවසන් කර නැති බවත්, ඒ සඳහා ණය ලබාදීමට එකඟ වූ චීනයේ එක්සිම් බැංකුව ණය ලබාදීම අතරමඟදී නතර කළ නිසා ඉතිරි ඉදිකිරීම් රටේ ජනතාවගේ බදු මුදලින් සිදුකිරීමට සිදුවූ බවත් ඔහු පැවසීය. ජනතාවගේ සේවා සඳහා යොදා ගත යුතු මහජන මුදල් කුළුණක් සඳහා වැයකිරීම ඛේදවාචකයක් නොවේද? මෙහි බරපතළම ප්‍රශ්නය එය නොවේ; දැන් මෙතැන් සිට වසර 10ක් යනතුරු මේ සඳහා ගත් ණයවලට පොලී හා වාරික ලෙස වසරකට රුපියල් කෝටි 240ක් බැගින් ගෙවීමට සිදුවී තිබීමය. එම මුදල මෙම කුළුණෙන් උපයා ගත හැකිද? නැත. ඒ අනුව පාලකයන්ගේ ප්‍රසිද්ධ වීමේ මානසික ව්‍යාපෘතියට වන්දි ගෙවීමට සිදුව ඇත්තේ පීඩාවට පත් ජනතාවටමය. නෙළුම් කුළුණට කිසිදාක පය තැබීමටවත් නොලැබෙන එහි ඊනියා අසිරිය විඳගැනීමට නොලැබෙන විශාල ප්‍රමාණයක් මෙරට ජනතාවට ඒ සඳහා ගත් ණය ගෙවීම සඳහා බදුබර දැරීමට සිදුවනු ඇත. මෙය සංවර්ධනයක් නොව ණය උගුලක් ලෙස සැලකිය යුත්තේ මේ නිසාය.

ණයට සල්ලි ගෙන ආර්ථිකයට දායකත්වයක් නැති ඉදිකිරීම් කොට ඒවා රටේ සංවර්ධනය ලෙස පෙන්වා ජනතාව මුලාකරන පාලකයින් පසුගිය වසර 71 තුළ රට සැබැවින්ම රැගෙනවිත් ඇත්තේ අගාධයක් වෙතය. ලෝකයේ රටවල ආර්ථික සංවර්ධනයේ ප්‍රමාණය මනින නිර්ණායක රැසක් දැන් තිබේ. ඉන් එක් ප්‍රධාන නිර්ණායකයක් වනුයේ ඒක පුද්ගල ආදායම මැනීමය. අනෙක මිනිසුන්ගේ සතුට හෙවත් මිනිසුන් සතුටින් ජීවත් වන්නේද යන්න මැනීමය. මේ දෙකින්ම ලංකාව ඇත්තේ පහළම තැනකය.

ඒක පුද්ගල ආදායමට අනුව 1950 දශකයේදී ආසියානු කලාපයේ ලංකාව දෙවෙනි වූයේ ජපානයට පමණකි. එහෙත් අද ආසියානු කලාපයේ ලංකාව ඉහළින් සිටින්නේ ඇෆ්ගනිස්ථානයට පමණක් වී තිබේ. රට වට්ටවා ඇති ප්‍රමාණය ඉන් පැහැදිලිය. එසේම ලොව සතුටින්ම සිටින මිනිසුන් ජීවත්වන රටවල් ගණනය කිරීමේදී ලංකාව ස්ථාන ගතවී ඇත්තේ අප්‍රිකානු රටක් වන සෝමාලියාවටද පහළටය. ලංකාව සෝමාලියාවටත් පහළ ඇද දැමූවන් නෙළුම් කුළුණු ඉදිකරමින් ඊනියා සංවර්ධනයක් ගැන පතුර වන මිථ්‍යාවන් සරල නොවන්නේ මේ නිසාය.


දැන් රට හමුවේ ජනතාව හමුවේ ඇත්තේ එක් මඟකි. ඒ, රටත් ජනතාවත් ලොව හමුවේ ණයකරුවන් කළ, ආත්ම ගෞරවය කෙළෙසා, ණය නින්දාවක් බවට පත්කළ වැරදි ආර්ථික ක්‍රමයත් එම ක්‍රමය පවත්වාගෙන යමින් මහජන මුදල් නාස්ති කරමින් හා යටිමඩි ගසමින් ගෙන ගිය පාලන ක්‍රමයත් ඉවත් කොට, නව සංවර්ධන උපායමාර්ගයක් වෙනුවෙන් විකල්ප මහජන බලවේගයක් හා එක්වීමය.

# ජනාධිපතිවරණය
# අභියෝග හා අවස්ථා

ජනාධිපතිවරණය සඳහා මැතිවරණ කොමිසම විසින් දැන් දින නියම කරනු ලැබ තිබේ. ඒ අනුව මෙවර ජනාධිපතිවරණය නොවැම්බර් 16 වැනි දින පැවැත්වෙන බව මැතිවරණ කොමිසම කියයි. ආරම්භයේ සිටම මෙම ජනාධිපතිවරණය විශේෂ එකක්ව තිබේ. කලකට පසු ‘ජනාධිපතිවරයෙක්’ ඡන්දයට තරග නොවදින ඡන්දයක් බවට මෙය පත්ව තිබේ. සාමාන්‍යයෙන් මීට පෙර අවස්ථා කිහිපයකම ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කළේ සිටින ජනාධිපතිවරයාමය. ඒ තවත් ධුර කාලයක් සඳහාය. එවිට ඔහු අනිවාර්ය අපේක්ෂකයෙක් විය. මෙවර එසේ නොවේ. මෙම ඡන්දය නියමිත කාලයට පෙර එන්නක් නොව ජනාධිපතිවරයාගේ ධුර කාලයේ නිමාව සමග ව්‍යවස්ථාවට අනුව පැවත්වෙන එකකි. එහිදී වත්මන් ජනාධිපතිවරයා තරග නොකිරීමට බොහෝ දුරට ඉඩ ඇත. ඒ ඔහු නියෝජනය කරන ශ්‍රීල.නි.ප.ය දෙකඩවී තිබීමත් මහින්ද කණ්ඩායම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ මගින් අපේක්ෂකයා ලෙස ගෝඨාභය නම්කිරීමත් මෛත්‍රිපාල මහතාට ඡන්දය සඳහා යාමට බලවේගයක් ඉතුරු නොවීමත් නිසාය.

අනෙක් අතට හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාටද මෙම ඡන්දයට තරග කළ නොහැක. ඒ 19වැනි සංශෝධනයට අනුව එක් පුද්ගලයෙකුට දෙවරකට වඩා මෙම ධුරය දැරීමට නොහැකි නිසාය. ඒ අනුව මෙම ජනාධිපතිවරණය ‘ජනාධිපතිවරයෙක්’ තරග නොකරන ජනාධිපතිවරණයක් වේ. එය විශේෂයකි. මේ නිසා රාජ්‍ය බලය මුළුමනින්ම ඡන්ද සටනට යොදා ගැනීම පහසු නොවන දෙයක් වී තිබේ.

එසේම මෙවර ජනාධිපතිවරණයේදී මෙතෙක් රට පාලනය කළ ධනවාදී කඳවුර නියෝජනය කරන පාර්ශ්ව තුළ අර්බුදයන් රැසක්ද මතුවී තිබේ. එම කඳවුරේ ප්‍රධාන පක්ෂ දෙකටම ප්‍රබල හා අනුහස් සහිත අපේක්ෂකයෙක් නොමැති තත්වයක් මතුව තිබේ. වත්මන් පාලක පක්ෂය වූ එ.ජා.ප.යට අපේක්ෂකයෙක් තෝරා ගැනීමට පවා නොහැකිවී දිගු කලක් කල්මරමින් ‘කඹ ඇදිල්ලක’ නිරතවීමට සිදුවිය. ඒ අනුව එ.ජා.ප.ය සැලකිය යුතු කාලයක් ගතකළේ ඡන්ද උණුසුම තුළ අපේක්ෂකයෙක් හඳුන්වාදීමට නොහැකිවය. එය එ.ජා.ප. පාක්ෂිකයින් පවා කලකිරවන හා මන්දෝත්සාහී තත්වයට පත්කරන්නක් විය. අවසන් මොහොතේ අපේක්ෂකයා ලෙස සජිත් ප්‍රේමදාස නම් කළද එ.ජා.ප.යේ සජිත් - රනිල් සීතල යුද්ධය තවමත් අවසන් වී නැති බව පැහැදිලිය.



මහින්ද රාජපක්ෂ කණ්ඩායම ගෝඨාභය තම අපේක්ෂකයා ලෙස නම් කළද ඔහුට මහින්ද රාජපක්ෂට තිබූ මහජන ප්‍රසාදය ඒ මට්ටමින් නැත. ඔහු හිටපු හමුදා නිලධාරියෙකි. ඔහුගේ මහජන සම්බන්ධතා ඉතාම දුර්වලය. පවුල් අභ්‍යන්තර අර්බුද නිසා ඔහුව තබා තිබෙන්නේ මහින්ද රාජපක්ෂට යටිනි. ඒ නිසා අපේක්ෂකයෙක් ලෙසට මතුවීමට ඔහුට බාධා තිබෙන්නේ තම පක්ෂය තුළින් හා රාජපක්ෂ පවුල තුළින්මය. පොදුවේ ගත්විට ජනාධිපති අපේක්ෂයෙක් ලෙස ඔහු දුර්වල අපේක්ෂකයෙකි. උතුරු නැගෙනහිර ජනතාවගේ ඡන්ද දිනාගැනීම ඔහුට ඉතා දුෂ්කරය. ප්‍රජාතන්ත්‍රවාදී බලවේග ඔහුට විරුද්ධය. 2015 දී පරදින මොහොතේ මහින්දට තිබූ තත්වයවත් පොදුජන පෙරමුණේ අපේක්ෂකයා ලෙස ගෝඨාභයට නැත.

මේ සියල්ල අතර ලංකාවේ පොදු ඡන්දදායකයා තුළද වෙනසක් සිදුවෙමින් තිබේ. ඒ වසර 71 පාලනයේ හිමිකරුවන් වන පැරණි පක්ෂ දෙකම ප්‍රතික්ෂේප කරන තත්වයට ජනතාව පත්වෙමින් තිබීමය. මෙවර ඡන්දයේදී වෙනසක් අපේක්ෂාකරන,උගතුන්ගේ වෘත්තිකයන්ගේ ක්‍රියාකාරිත්වය අපේක්ෂාකරන විකල්ප බලවේගයක් දෙස අවධානය යොමුකරන ඡන්දදායක ප්‍රමාණය නිතිපතා වර්ධනය වෙමින් තිබේ.

මේ අතර මෙතෙක් රට පාලනය කළ කණ්ඩායම් දෙකේම වංචා දූෂණ මගඩි නිතිපතා හෙළිවෙමින් තිබෙන්නේ ඔවුන්ට උත්තර බැඳීමටවත් ඉඩක් නොතබාය.

> නව විකල්ප දේශපාලන බලවේගයකට මෙම ජනාධිපතිවරණයේදී වෙනදා නොතිබූ අවස්ථාවක් හා ඉඩක් ලැබී තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය අපේක්ෂාකරන, සමාජ සාධාරණත්වය ගැන උනන්දුවන ජාතික සමගිය අපේක්ෂා කරන සමාජ බලවේගයන්ට දැන් එ.ජා.ප.ය හෝ පොදුජන පෙරමුණ පිළිතුරක් වන්නේ නැත. මේ නිසා විකල්ප අපේක්ෂකයෙකුට තිබෙන දේශපාලන ඉඩකඩ සුළුපටු නොවේ.

එක් අතකින් සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා සභාපති ධුරය දරන කෝප් කමිටුව සජීව ලෙස විකාශනය කිරීමත්, ඒ තුළ හඳුන්නෙත්ති සහෝදරයාගේ මැදිහත්වීමත් නිසා රාජ්‍ය ආයතන තුළ සිදුවූ මහා පරිමාණ වංචා, දූෂණ හා අක්‍රමිකතා රැසක් එළිවෙමින් තිබේ. ඊට අමතරව කොළඹ නෙළුම් කුළුන විවෘත කරමින් වත්මන් ජනාධිපතිවරයා කළ ප්‍රකාශයෙන් රාජපක්ෂවරුන්ගේ මහා පරිමාණ වංචාවක්ද එළිකරනු ලැබීය.

මේ තත්වය තුළ නව විකල්ප දේශපාලන බලවේගයකට මෙම ජනාධිපතිවරණයේදී වෙනදා නොතිබූ අවස්ථාවක් හා ඉඩක් ලැබී තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය අපේක්ෂාකරන, සමාජ සාධාරණත්වය ගැන උනන්දුවන ජාතික සමගිය අපේක්ෂා කරන සමාජ බලවේගයන්ට දැන් එ.ජා.ප.ය හෝ පොදුජන පෙරමුණ පිළිතුරක් වන්නේ නැත. මේ නිසා විකල්ප අපේක්ෂකයෙකුට තිබෙන දේශපාලන ඉඩකඩ සුළුපටු නොවේ.

මේ මොහොතේ රට තුළ මතුව තිබෙන මෙම දේශපාලන අර්බුදකාරිත්වය හා තත්වයන්ගේ පෙළගැස්ම මගින් මතුකර තිබෙන දේශපාලන අවස්ථාව වඩාත් වාසි ගෙනදෙන්නේ විකල්ප දේශපාලන බලවේගයකට බව ඉතා පැහැදිලිය. එහිදී එම විකල්ප බලවේගයේ භූමිකාව මේ මොහොතේ ඉටුකළ හැකි ප්‍රබල දේශපාලන ව්‍යාපාරය වන්නේ අලුත ගොඩනගන ලද ජාතික ජන බලවේගයයි. ඒ තුළ එක්ව සිටින ජ.වි.පෙ. ඇතුළු වාමවාදී, ප්‍රගතිශීලී, මානවවාදී, බලවේගයන්ටත් උගතුන්, වෘත්තිකයන් හා වැඩකරන ජනතාව ඇතුළු ජනතා බලවේග යන්ටත් ජනතාව තුළ නව බලාපොරොත්තුවක් දැල්වීමට හැකියාව තිබේ. වසර 71 තට්ටුමාරු අසාර්ථක දේශපාලන ගමන වෙනස්කිරීම සඳහා වන ශක්තිමත් සංවිධාන හා දේශපාලනයේ පරිණත, අත්හදා බලනලද නායකයන් හා ක්‍රියාධරයන්ගෙන් සමන්විත බලවේගය වන්නේ,‘ජනතා ජන බලවේගය’පමණක් බව ඉතා පැහැදිලිය. එය හුදු මැතිවරණ පෙරමුණක් ලෙස නොව පුළුල් මහජන ව්‍යාපාරයක් ලෙස ගොඩනැගීමද එහි ශක්තිය හා දිගුකල් පැවැත්ම වැඩිකරන්නකි.

කෙසේ වෙතත් මෙම දේශපාලන තත්වය මත ගොඩනැගෙන ජාතික ජන බලවේගයට අභියෝග නැතිවා නොවේ. ලංකාවේ ඡන්දදායකයාගේ ගතානුගතික බව හා අතාර්කික බව, ප්‍රභූන් වන්දනාමාන කිරීමේ පසුගාමී මනෝභාවය, විකල්ප දේශපාලන බලවේග හමුවේ ඇති එක් අභියෝගයකි. එය ජයගත යුතුය. එසේම දේශපාලන නායකත්වයක් ප්‍රතික්ෂේපකරමින් තනි ප්‍රසිද්ධ චරිතයක් උත්කර්ෂයට නංවා, ඊනියා දියසෙන් කුමාරයෙකු ගැලවුම්කරුවෙකු ලෙස පුද්ගලයෙකු බෞතිස්ම කිරීමට මනෝරාජික සිහිනයක සිටිමින් සමාජයේ උගතුන් අතර කිසියම් කණ්ඩායමක් දරන අසාර්ථක උත්සාහය නව විකල්ප බලවේගයක් වෙත ගොඩනැගෙන ජනතා විශ්වාසය අවුල් කරන්නක් වනු ඇත. සැබෑ විකල්ප ජන බලවේගය පසෙකලා මනෝරාජික නායකයන් සෙවීම තුළ දේශපාලන අත්දැකීම් අඩුකමට, දේශපාලන දෘෂ්ටිමය දුප්පත්කමට

15 වැනි පිටුවට



# YES WE CAN

## BRAND එක මොකක්ද?

ඕනෑම දෙයක් තෝරා ගැනීමේදී, මිලදී ගැනීමේදී අප කවුරුත් සොයන්නේ හොඳම සන්නාමය (BRAND) සහිත ඒවාය. භාණ්ඩයක් මිලදී ගැනීමේදී හොඳම BRAND එක තෝරන්නේ ඒ සඳහා වියදම් කරන මුදල් අපගේ වන නිසාය. ඒවා පරිභෝජනය කරන්නේ අපම නිසාය.

දේශපාලනයේද නානාවිධ BRAND හමුවේ. නමුත් එහිදීනම් හොඳම දේ තෝරාගැනීමට රටක් විදිහට අපි අසමත් වී සිටිමු. දේශපාලනයේදී හොඳම BRAND එක සහිත පුද්ගලයින් හා කණ්ඩායම් තෝරා ගැනීමට ජනතාව අසමත්වන තාක් අපේ රට පත්ව ඇති ඛේදවාචකයෙන් ගොඩ ඒමට නොහැකි වනු ඇත. මෙතෙක් තෝරාගෙන ඇත්තේ හොරකමේ සන්නාමය සහිත, නාස්තියේ හා දූෂණයේ සන්නාමය සහිත, සුහසාධන කප්පාදුවේ සන්නාමය සහිත, මහජන දේපළ විකිණීමේ සන්නාමය සහිත, ඒකාධිපතිත්වයේ සන්නාමය සහිත, පුද්ගලයින් හා කණ්ඩායම්ය.

ඒ සඳහා තවත් උදාහරණ අවැසි නොවේ. ගෙවුණු 71 වසර දෙස ආපසු හැරී බැලීමේදී ඒ බව හොඳින් පෙනෙයි. ඌණ පෝෂණයක් සහිත ගැබිණි මව්වරුන් සිටිනා රටක්, ඌණ වර්ධනයක් හා මන්දපෝෂණය සහිත දරු උපත් සහිත රටක්, ඉගෙනීමට පෙරපාසල් හා පාසල් නොමැති රටක්, නමට හෝ තිබෙන පාසල්වලද පහසුකම්වලින් තොර අධ්‍යාපනයක්, සුදුස්සන්ට යෑමට විශ්වවිද්‍යාලද නොමැති රටක්, උපාධිධාරීන්ට රැකියා නොමැති රටක්, එකම රෝගය වැළඳී දිනෙන් දින වර්ධනය වෙමින් මියයන රටක්, එකිනෙකා මිනීමරාගන්නා රටක්, කුඩු කන්ටේනර් වශයෙන් ආනයනය වන රටක්, අපේක්ෂාභංගත්වයට පත් තරුණ පරම්පරාවක්, ඒ නිසාම දිවිනසාගැනීම්වලින් ලොව ප්‍රමුඛස්ථානය හිමි රටක්, බාල අපචාර හා ස්ත්‍රී දූෂණ වර්ධනය වන රටක් අපට උරුම වී ඇත්තේ මෙම බාල ගණයේ තෝරාගැනීම්වල ප්‍රතිඵලයක් ලෙසය.


නැවතත් ජනතාවට තෝරාගැනීමේ අවස්ථාව උදාවී ඇත. ඒ අපේ රටේ පළමු පුරවැසියා තෝරා ගැනීමේ අවස්ථාවයි. BRAND රැසකි. හොඳම සන්නාමය සහිත පුද්ගලයා කවුද?


එක් අයෙක් තාත්තා ජනාධිපති වී සිටි සමයේ රාජ්‍ය දේපළ සමඟ සෙල්ලම් දැම්මේය. ඇමතිකම් දරමින් රාජ්‍ය දේපළ අවභාවිතා කළේය. තමන් ඇමතිකම් දැරූ සමයේ කිසිදු රාජ්‍ය ආයතනයක් ලාභ කිරීමට අසමත් වූ මෙන්ම එම ආයතන කඩාවැට්ටීමට සමත් වූ පුද්ගලයෙකි. දැනටද තමන් දරන අමාත්‍යංශය හොර ගුහාවක් බවට පත්කළ පුද්ගලයෙකි.

අනෙක් පුද්ගලයා විදෙස් රටක පුරවැසිභාවය සහිතය. මෑත ඉතිහාසයේ සිදු වූ මිනීමැරුම් හා අතුරුදහන් කිරීම් ගණනාවකටම චෝදනා ලැබුවෙකි. හොරකම්, දූෂණ හා වංචාවලට චෝදනා ලැබුවෙකි. රටේ නීතිය අතට ගෙන මහ දවාලේ රටේ නීතිය කුණුකූඩයට දැමුවෙකි. රජයේ නිලධාරියෙකුව සිටි සමයේ ඒකාධිපතිත්වය එළිපිට ක්‍රියාවට නැගුවෙකි. ජනතා දේපළ තම පුද්ගලික වුවමනාකම් සඳහා යෙදවූ පුද්ගලයෙකි.

මෙම පුද්ගලයින් දෙදෙනාට එරෙහිව ජනතාව වෙනුවෙන් ඉදිරිපත් වන පුද්ගලයා රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලද, දැනට ඇමතිවරු හත් දෙනෙක් වගකීම් දරනා අමාත්‍යංශ විෂයන් තනියෙන් දැරූ ඇමතිවරයාය. එම අමාත්‍යංශයට අයත් ආයතන ලාභ ලබන තත්වයට ගෙන, ඇමතිකම් දැරූ කාලසීමාවේ සතයකවත් වංචාවක් සිදු නොවීමට වගබලාගත් පුද්ගලයාය. ඇමති ධුරයට හිමි ප්‍රතිපාදන ඉතිරි කර අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ ප්‍රවාහන පහසුකම් වෙනුවෙන් බස් රථ දෙකක් මිලට ගෙන දුන් හිටපු ඇමතිවරයෙකි. ලංකා පාර්ලිමේන්තුවේ පිට පිට සෑම වසරකම අංක එකට සක්‍රීයම මහජන නියෝජිතයාය.

ශිෂ්‍ය, කාන්තා, තරුණ, ගොවි, ධීවර, වතු කම්කරු, රාජ්‍ය සේවක හා විද්වත් වෘත්තික අයිතිවාසිකම් වෙනුවෙන් තම දේශපාලන ඉතිහාසය තුළම හඬ නැගූ නායකයෙකි. ඒ, අනුර කුමාර දිසානායක නාමයයි. AKD BRAND එකයි. ඔහු තෝරාගැනීම ජනතාව සතු කාර්යයකි. 71 වසරක් අත්හදාබැලූ බංකොලොත් BRAND වෙනුවට නව BRAND එකක් තෝරාගැනීමට කාලය උදා වී ඇත. ඒ වෙනුවෙන් පෙළගැසෙමු.



## නුඹ පැතූ ලොව...

================

ජය පෙනෙන මානයක
ජාත්‍යන්තරවාදයේ
අනුරුවකි නුඹ...
හදවත් එකිනෙක
යා කොට...
ලෝ පුරා තාරුණ්‍යයේ
වීරත්වය දරාගෙන..
බියගන්වමින්
ධනවාදයේ කඳවුරු
භීතියේ සෙවනැල්ලක්ව
අධිරද බල බිඳහෙළන
අසිපතක්ව...
පංති පීඩනයට එරෙහි
ධෛර්යයේත්
ආදරයේත්
කැඩපත...
ආදරණීය වේ...

# බාහිර සටන ජයගනී...



වත්මන් ආණ්ඩුව විසින් පසුගිය 2016 අගෝස්තු 06 ගැසට් නිවේදනයක් මගින් උපාධිධාරීන්ට රැකියා ලබාදීම සඳහා ක්‍රියාමාර්ගයක් ගන්නා ලදී. එහි දී බාහිර උපාධිධාරීන් මහත් අසාධාරණයට ලක් වූහ. එහි පළමු අදියර යටතේදී රැකියා 4053 ලබා දුන් අතර එහි සිටි බාහිර උපාධිධාරීන් ඉන් ඉවත් කරන ලදී. අනතුරුව දෙවන අදියරේ දී 16,800කට පත්වීම් ලබාදීමට සූදානම් විය. එම පිරිසෙනුත් බාහිර උපාධිධාරීන් ඉවත් කරන ලදී. මේ ගැටලුව පිළිබඳව බාහිර උපාධි සුරැකීමේ සංවිධාන එකතුව විසින් දිගින් දිගටම ප්‍රශ්න කරන ලදී. එයට කන් නොදුන් ආණ්ඩුවට එරෙහිව රට පුරා විරෝධතා ව්‍යාපාර දියත් කෙරිණි. පසුව කොළඹ මූලික කරගනිමින්ද විරෝධතා ව්‍යාපාර හා වීදි සටන් දියත් කෙරිණි. එයින් නොනැවතුනු සටන පාර්ලිමේන්තුව තුළටද රැගෙන යනු ලැබිණි. ඒ සඳහා මැදිහත් වූයේ පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයාය.

පසුව මෙම අරගලයේ ප්‍රතිඵලයක් ලෙස බාහිර උපාධි සුරැකීමේ සංවිධානය සහ අමාත්‍යවරයා සමග සාකච්ඡා කරනු ලැබීය. එහි දී 16,800ක් රැකියා ලබාදීමේදී ඇතිවන පුරප්පාඩු සඳහා රැකියා ලබාදීමට අමාත්‍යවරයා විසින් පොරොන්දු විය. පසුව එහි පුරප්පාඩු ඇති 4667 ඇති බවත් එම පුරප්පාඩු 2012 සිට වර්ෂ පිළිවෙළට ලබාදෙන බවටත් කැබිනට් පත්‍රිකාවක් මගින් දැනුම්දෙන ලදී. බාහිර උපාධි සුරැකීමේ සංවිධාන එකතුවේ කැඳවුම්කරු මහේෂ් අබේපිටිය සහෝදරයා ප්‍රකාශ කළේ "බාහිර උපාධිධාරීන්ට රැකියා ලබානොදෙන බවට ප්‍රකාශ කළ ආණ්ඩුවේ තීරණය වෙනස් කිරීමට අපට හැකි වුණා. එම සටනින් සියට සියක් ජයග්‍රහණය කිරීමට නොහැකි වුණත් විශාල ජයග්‍රහණයක් ලබාගත්තා. ඒවගේම ඉතිරි අයටත් රැකියා ලබාගැනීමේ අරගලය අපි දිගටම කරනවා. මෙම රැකියා ලබාදීමේදී වයස අවුරුදු සීමා ඉක්ම වූ පිරිසකට අසාධාරණයක් වෙලා තියනවා. ඒ වෙනුවෙන් අපි අරගලය කරනවා. අපි මේ සටන අත්අරින්නේ මේ සටන ජයග්‍රහණයෙන් කෙළවර කරලා" යනුවෙන් ප්‍රකාශ කළේය.

# ඇල්ලට හුස්ම ගන්න ඉඩක්

සමාජවාදී තරුණ සංගමය හා ප්‍රගතිශීලී සංවිධාන එක්ව පසුගිය 16-17 දෙදින තුළ "ඇල්ලට හුස්ම ගන්න ඉඩ දෙන්න" මැයෙන් පරිසරය සුරැකීමේ වැඩසටහනක් ඇල්ල නගරය ආශ්‍රිතව දියත් කරන ලදී. එහිදී ඇල්ල නගරය පුරා ජනතාව දැනුවත් කරමින් අත්පත්‍රිකා බෙදාහැරීම, ඇල්ල නගරය හා පුංචි සිරිපාදය අවට පිරිසිදු කිරීම හා වීදි නාට්‍ය දර්ශනයක් පැවැත්වීම 16 දිනය පුරා සිදුකෙරිණි. 17වැනි දින ඇල්ල මහ විද්‍යාලයේ සිසුන් දැනුවත් කිරීමේ වැඩසක් පැවැත්වනු ලැබිණි. මේ සඳහා සමාජවාදී තරුණ සංගමය, ඇල්ල වෙළඳ සංගමය, ඇල්ල සංචාරක හා වාණිජ සංගමය, ජීවයේ අයිතිය සංවිධාන, යුතුකම නොනැවති ඉදිරියට සංවිධාන, දුංහිඳ සහෘදයෝ සංවිධානය , ඉහළ ඌවේ පරිසර මිතුරෝ සංවිධානය හා ඇල්ල පොලීසිය ඇතුළු සංවිධාන හා ආයතන සම්බන්ධ විය. ඊට අමතරව විශ්වවිද්‍යාල ආචාර්යවරු හා දිවයිනේ නන්දෙසින් පැමිණි තරුණ තරුණියෝ රැසක් සහභාගි වූහ.











# පරිවර්තනය ආරම්භ කිරීමට හොඳම අවස්ථාව මෙයයි

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්
**ටිල්වින් සිල්වා සහෝදරයා**



***නියමුවා:- මේ වනවිට ජනාධිපතිවරණය සඳහා දින නියම කර තියෙනවා. ජනාධිපතිවරණය සඳහා ඔබේ පක්ෂයේ සූදානම කොහොමද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මෙම ජනාධිපතිවරණයේදී අපි තරග වදින්නේ ජ.වි.පෙ. හැටියට සීනුව ලකුණින් නෙවෙයි, ජ.වි.පෙ.ත් ඇතුළු තවත් වමේ හා ප්‍රගතිශීලී සංවිධාන, විද්වත් හා වෘත්තික සංවිධාන රැසකින් සැදුම් ලත් ජාතික ජන බලවේගය ලෙසටයි. ජාතික ජන බලවේගය ලෙස අපි පසුගිය අගෝස්තු 18දා කොළඹ ගාලුමුවදොර පැවති දැවැන්ත රැලියකදී අපේ අපේක්ෂයා ලෙස අනුර දිසානායක සහෝදරයා ඉදිරිපත් කළා. මේ වනවිට අපි එක් අතකින් අපේ අපේක්ෂකයාගේ ජයග්‍රහණය සඳහා කම්කරු, ගොවි, වතු ආදී ක්ෂේත්‍ර නියෝජනය කරන සමුළු ඉතා සාර්ථකව පවත්වා තිබෙනවා. ඉදිරියට භික්ෂු, තරුණ, කාන්තා, ධීවර ආදී ක්ෂේත්‍රවල සමුළු පැවැත්වෙනවා. ඒ වගේම විශාල දිස්ත්‍රික් රැලි හා ප්‍රාදේශීය මට්ටමේ සංවාද සාකච්ඡා සභා පවත්වමින් ජනතාව සමග සංවාදයක් සහිතව අපේ මැතිවරණ ව්‍යාපාරය ඉතාම හොඳින් කරගෙන යනවා. මෙවර ඡන්දයේදී වෙන කිසිම පක්ෂයකට වඩා හොඳ සූදානමක් හා කල් ඇතිව ආරම්භ කළ මැතිවරණ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට ජාතික ජන බලවේගයට හැකිවෙලා තිබෙනවා.

***නියමුවා:- ඒකාධිපතිවාදය පරදා ප්‍රජාතන්ත්‍රවාදය රැකගැනීම සඳහා ඉදිරිපත් වන වෙනත් අපේක්ෂකයෙකුට සහය පළ කර ජාතික ජන බලවේග යේ අපේක්ෂකයා අතරමැදදී ඉවත්වේවි කියල සමහර අය මතයක් පතුරුවනවා. ඒක එහෙම වෙයිද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** නැහැ. කිසිසේත්ම නැහැ. ඒක බංකොලොත් කණ්ඩායම් පතුරුවන සාවද්‍ය මතයක්. අපේ අපේක්ෂක අනුර දිසානායක සහෝදරයා මොන තත්වයක් තුළ හෝ ජනාධිපතිවරණ සටනින් ඉවත්වෙන්නේ නැහැ. ඒ ගැන කිසිවෙකුත් සැකයක් තබා ගත යුතු නැහැ.

මේ රටේ ඒකාධිපතිවාදය පරදා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමේදිත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ කාර්යයේදීත්, ජාතික සමගිය ගොඩනැගීම පිළිබඳ ප්‍රශ්නයේදිත්, රට හැදීම හා රට රැකීම පිළිබඳ කාර්යයේදීත් දැන් රටට, ජනතාවට විශ්වාසය තැබිය හැකි එකම අපේක්ෂකයා අනුර දිසානායක සහෝදරයා විතරයි. 2015 ජනතාවගේ ජනවරම පාවාදුන්න කිසිවකුට යළි මේ ගැන කථාකරන්නවත් අයිතියක් නැහැ. ඒ නිසා රටේ ඒකාධිපතිවාදය පැරදවීමට, විධායක ජනාධිපති ක්‍රමය අහෝසිකිරීමට, ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජ සාධාරණත්වය තහවුරු කිරීමට, ජාතික සමගිය ගොඩනැගීමට අවංකවම කැමති කවුරුන් හෝ ඉන්නවා නම් දැන් කළ යුත්තේ අනුර දිසානායක සහෝදරයාට සහාය දැක්වීම පමණයි. දේශපාලනයේ 'හෝද හෝදා මඩේ දාන්න' කවුරු සූදානම් වුවත් අපි සූදානම් නැහැ.

***නියමුවා:- ජාතික ජන බලවේගයේ අපේක්ෂකයා තරග වදින්නේ දිනන්න නොවෙයි ඡන්ද කඩන්නයි කියල මතයක් තියෙනවා. මේ ගැන ඔබේ අදහස කුමක්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මේකත් අර වගේම වැරදි මතයක්. අපේ අපේක්ෂකයා වූ අනුර දිසානායක සහෝදරයා තරග වදින්නේ දිනන්න. අපව දිනවන එක ජනතාවගේ වගකීමක්. අවුරුදු 71ක දේශපාලනයේ කටුක හා අමිහිරි අත්දැකීම් ඇති අපේ රටේ ජනතාව මෙතෙක් රට පාලනය කළ රට විනාශයට හා අගාධයට ඇද දැමූ ප්‍රතිගාමී හා කොල්ලකාරී දේශපාලන කඳවුරේ අපේක්ෂකයන්ට ඡන්දය දෙනවා වෙනුවට අලුත් දේශපාලන ගමනක් වෙනුවෙන් අපට ඡන්දය දේවි කියල අපි විශ්වාස කරනවා. එලෙස අපට ඡන්දය දෙන්න කියල අපි ඉල්ලා සිටිනවා. ඒ නිසා 71 වසරක මෙම තට්ටුමාරු දේශපාලනයේ බේදවාචකය අවසන් කර රට යහමඟට ගැනීමට කැමති හැමෝටම අපි කියනවා, වෙන වෙනම තරග කර ඡන්ද කඩන්නේ නැතුව දැනටමත් ජනතා විශ්වාසය දිනාගනිමින් ඉදිරියට යන අපේ අපේක්ෂකයාට ඡන්දය දෙන්න, සහාය පළකරන්න කියලා.

***නියමුවා:- ඔබේ පක්ෂය මුල සිටම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට සටන් කළ පක්ෂයක්. ඒත් මේ ජනාධිපතිවරණයත් සමග ජාතික ජන බලවේගයේ අපේක්ෂකයා එය අමතක කරලද කියල සමහරු අහනවා.***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මේක ඉතාම හොඳ ප්‍රශ්නයක්. අපි හැමදාම සැබෑලෙසම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා පෙනී සිටියා. අදත් පෙනී සිටිනවා. ඒ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන තුරු අපි ඒ උත්සාහය අත්හරින්නේත් නැහැ. සමහරුන්ට විධායක ජනාධිපති ක්‍රමය අහෝසිකිරීම මතක් වෙන්නේ, ඒකට තදියම හැදෙන්නේ තමන්ට ජනපති වෙන්න බැහැ කියලා දැනුනම. ඉල්ලන්නටත් බැහැ කියල දැනුනම. ඒව පෞද්ගලික අරමුණු. අපි එහෙම නොවෙයි. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම අපේ ප්‍රතිපත්තියක්. ඒ නිසා තමයි අපි මේ පාර්ලිමේන්තුවට 20වැනි සංශෝධනය ගෙනාවේත්. වත්මන් පාර්ලිමේන්තුවේ ඊනියා ලොකු පක්ෂ ඒක සම්මත කරගන්න උනන්දු වුණේ නැහැ. ඒකයි ඇත්ත.

මේ ජනාධිපතිවරණයේදී අපි අපට බලය ඉල්ලනවා. ජනතාව අපිව ජයග්‍රහණය කෙරෙව්වොත් අපේ අපේක්ෂක අනුර දිසානායක සහෝදරයා ජනාධිපති සටනින් දිනුවොත් ලබන වසරේ මුල එළඹෙන මහ මැතිවරණයත් අනිවාර්යෙන් අපි දිනනවා. ඉන්පසු අප ජාතික ජන බලවේගයේ මූලිකත්වයෙන් ජනතාවාදී පාලනයක් ගොඩනගනවා. එම පාලනයට රට හදන, රට රකින වැඩපිළිවෙළක් හා සැලැස්මක් තියෙනවා. එම වැඩපිළිවෙළේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමේ ක්‍රියාමාර්ගවල ප්‍රථම ක්‍රියාමාර්ගය ලෙස අපි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා. ඒක ස්ථිරයි. එසේ නැතිව අපේ අපේක්ෂකයා තරග වදින්නේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරලා ආපසු යන්න නොවෙයි. අපි බලය ඉල්ලන්නේ රට හදන්න. රට හදන ක්‍රියාවලියෙ එක් පියවරක් ලෙස ස්ථිර ලෙසම ප්‍රථමයෙන්ම අපි විධායක ජනාධිපති ක්‍රමය අපේ ආණ්ඩුවක් යටතේ අහෝසි කරනවා. ඒ ගැන කවුරුත් සැක පහළකරගත යුතු නැහැ.

***නියමුවා:- හොඳයි මේ වනවිට ජාතික ජන බලවේගයෙ අපේක්ෂකයා ලෙස අනුර දිසානායක සහෝදරයාට ලැබෙන ජනතා ප්‍රතිචාරය හා සහයෝගය කෙබඳුද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඉතාමත් ඉහළ ප්‍රතිචාරයක් හා සහයෝගයක් අපට තියෙනවා. ඔබ දන්නව අපේ ගෝල්ෆේස් රැලිය අතිසාර්ථක වුණා. ඒ ගැන බොහෝදෙනා තවමත් කථාකරනවා. ඉන්පසු අප පැවැත්වූ රැලි හා සාකච්ඡා සභාවලට ඉහළ ජනතා සහභාගිත්වයක් හා ඉහළ ප්‍රතිචාරයක් තිබුණා. ජනතාවගේ උනන්දුව ඉතාම ඉහළ මට්ටමක පවතිනවා. එය අපිට ලොකු ධෛර්යයක්. ඒ වගේම දැනට ජාතික ජන බලවේගය සමග නිල වශයෙන් එක් නොවූ සංවිධාන කිහිපයක්ම, විශේෂයෙන්ම දෙමළ හා මුස්ලිම් ජනතාව නියෝජනය කරන සංවිධාන ඇතුළු සංවිධාන කීපයක්ම ඉදිරියේදී අනුර දිසානායක සහෝදරයට සහාය දැක්වීමට කැමැත්ත පළ කර තිබෙනවා. ඒ වගේම රට ගැන අවංකව හිතන අපේ රටේ සිවිල් ක්‍රියාකාරීන්, බුද්ධිමතුන්, වෘත්තීයවේදීන් විශාල ප්‍රමාණයක් දිනපතා අපට සහයෝගය පළකරමින් අප හා එක්වෙමින් සිටිනවා. මේ තත්වය තුළ මේ මොහොතේ අලුත් බලවේග රැසක සහය ලබන හොඳම හා වැඩිම සංවිධාන හා පුද්ගලයන්ගේ සහය ලබන අපේක්ෂකයා වීමට අපේ අපේක්ෂකයාට හැකි වෙලා තියෙනවා.

***නියමුවා:- ජනාධිපතිවරණයට දින නියම කර තිබුණත් තවම මේ ඡන්ද ව්‍යාපාරය තුළ ප්‍රතිපත්තිමය සංවාදයක් පේන්න නැහැ. ඒ ඇයි?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඔබ කියන දෙය බැලූ බැල්මට ඇත්ත තමයි. අවසන් මොහොත දක්වා එ.ජා.ප.යේ සංවාදය තිබුණේ අපේක්ෂකයා තෝරාගැනීම පිළිබඳව මිස ප්‍රතිපත්ති ගැන නොවෙයි. සජිත් අපේක්ෂකයා වුණාට ඔහුට රට හදන ප්‍රතිපත්ති නැහැ; රටේ ප්‍රශ්න ගැන අවබෝධෙකුත් නැහැ. ඒ නිසා ප්‍රතිපත්ති ගැන කථාකරනවා වෙනුවට වෙනත් දේශපාලන කරුණු, අර්බුද කථාකරමින්, ජනතාවගේ කුතුහලය අවුස්සමින් ඉන්න ඔවුන් කැමැතියි.

ඒ වගේම මහින්ද පිලේ ගෝඨාභය රාජපක්ෂත් සරල ඡන්ද පොරොන්දු දෙමින් පන්සල් ගානෙ දේවස්ථාන ගානෙ යනවා මිස ප්‍රතිපත්තිමය සංවාදයකට එන්නේ නැහැ. ඔවුන් යන්න හදන්නේ ජනප්‍රිය දේශපාලනය තුළ මිස ප්‍රතිපත්ති දේශපාලනය තුළ නොවෙයි. මේ කණ්ඩායම් දෙකේ බූදල් බවට පත්ව සිටින අපේ රටේ ප්‍රධාන ජනමාධ්‍ය ආයතනත් දේශපාලන ඕපාදූප, අවලාද මතුකරමින්, දේශපාලන ඕපාදූප උත්කර්ෂයට නංවමින් එකිනෙකාට එරෙහිව අවලාද පන්නයේ ප්‍රකාශ ප්‍රචාරය කරමින් ලාභ හා බාල මාධ්‍ය භාවිතාවක් පවත්වාගෙන යනවා. මේ නිසා රට තුළ ප්‍රතිපත්තිමය සංවාදයකට ඉඩ ඇහිරිලා තියෙනවා. ජාතික ජන බලවේගයේ අපේ අපේක්ෂක අනුර දිසානායක සහෝදරයා පසුගිය දිනවල සහභාග වූ රූපවාහිනී නාලිකාවල දේශපාලන සංවාද හැම එකකදීම වාගේ සුපුරුදු අවලාද හා ඕපාදූප ගැන ප්‍රශ්න කළා මිස ප්‍රතිපත්තිමය කරුණු සාකච්ඡා කිරීමට ප්‍රමාණවත් ඉඩක් නොදීම මීට හොඳම උදාහරණයක්.

කොහොම වුණත් අප ජාතික ජන බලවේගය හැටියට ප්‍රතිපත්තිමය සංවාදයක් අපට තිබෙන මාධ්‍ය හා අවස්ථා උපයෝගී කරගෙන පටන්ගෙන තිබෙනවා. ඉදිරියේදී රටේ එක් එක් ප්‍රශ්න (උදාහරණ අධ්‍යාපනය, සෞඛ්‍යය පරිසරය) වෙන වෙනම ගෙන ජනතාව අතරට සංවාදයක් ගෙනයාමටත් අදහස් කරනවා.

***නියමුවා:- හොඳයි අවසන් වශයෙන් මේ ජනාධිපතිවරණයේදී රටවැසියාගේ වගකීම කුමක් කියලද ඔබ හිතන්නෙ?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මේ රට දැන් වැටී තිබෙන තත්වය හොඳයි කියල කිසිම කෙනෙක් කියන්නේ නැහැ. පවතින සමාජ ආර්ථික තත්වය තමන්ට හොඳයි කියල පාලක පංතියේ කීපදෙනෙක් හැර වෙන කවුරුත්

**15 වැනි පිටුවට**

ඔබට ජාතික ජන බලවේගය සමග නිල ලෙස එකතුවීමට නොහැකි නම් ඔබ හැම ස්වාධීන ලෙස ඔබ හැමට හැකි තැන්වල හැකි විදිහට මේ සටන දිනවීමට කටයුතු කරන්න කියලා අපි සැමගෙන් ඉල්ලනවා. රට දිනවන මෙම සටනේදී හැම දෙනාම ස්වේච්ඡාවෙන් කටයුතු කරන ක්‍රියාධරයන් වුණොත්, ජාතික ජන බලවේගය සමග සම්බන්ධවී හෝ එසේ නැතිව පවා ක්‍රියාශීලී ලෙස කටයුතු කළොත් රටේත් ජනතාවගේත් ජයග්‍රහණය ස්ථිරයි.

# ජනතා සභාවෙන් ජනතාව සමග සංවාදයක්

ඇතැම් ජනාධිපතිවරණ අපේක්ෂකයින් තමන්ගෙන් ප්‍රශ්න ඇසීමට මාධ්‍යවේදීන්ට පවා ඉඩ නොතබා කටයුතු කරමින් සිටියෙදී ජාතික ජන බලවේගය රටේ ජනතාවට ජනාධිපතිධූර අපේක්ෂකයා සහ එම බලවේගයේ නියෝජිතයින් සමග සංවාදයක යෙදිය හැකි වේදිකාවක් "ජනතා සභාව"නමින් කරළියට ගෙන ඇත.

ජනාධිපතිවරණ උණුසුම වර්ධනය වෙමින් පවතින මේ මොහොත වන විටත් ජාතික ජන බලවේගයේ අපේක්ෂක අනුර කුමාර දිසානායක සහෝදරයා දිනවන සහ රට ගොඩනැගීමේ වැඩපිළිවෙල ජනතාවට තහවුරු කරන "ජනතා සභා" රාශියක් දිස්ත්‍රික්ක ගණනාවක සාර්ථකව පවත්වා අවසන් කර තිබේ.

මෙහි පළමු සභාව පසුගිය සැප්තැම්බර 08 වැනිදා අනුරාධපුර යොවුන් නිකේතන පරිශ්‍රයේදී "බිඳ වැටුණු රට ගොඩනගමු" යන තේමාව යටතේ අනුර කුමාර දිසානායක සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබිණි. කලාකරුවන්, විද්වතුන්, ව්‍යාපාරිකයන්, සිවිල් සංවිධාන නියෝජිතයින් ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක නියෝජිතයින් මේ සඳහා සහභාගි වී සිටි අතර බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා වැඩි පිරිසක් පැමිණ සිටීම හේතුවෙන් ශාලාවෙන් පිටතද විශාල පිරිසකට අසුන් පැනවීමට සංවිධායකයින්ට සිදුවිය.



# කඳුකර කඳුළට නිමාවක්



වතුකරය සම්බන්ධයෙන් පොදුවේ සිංහල කථාබහ කරන සමාජය තුළ ඇත්තේ මෙහෙකාරකමට කවුරුන් හෝ සොයාගත හැකි ජනතාවක් වෙසෙන පෙදෙසක් ලෙසයි. මෙවැනි අදහසක් ජන මනස තුළ රෝපණයට වීමට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ ක්‍රියා කලාපය සේම ඔවුන්ගෙන් පසු පුරා 71 වසරක් මෙරට පාලනය කළ නිල් සහ කොළ දේශපාලකයන්ගේ ක්‍රියාවන්ද එක සේ බලපෑවේය.

විශේෂයෙන්ම දැඩි සූරාකෑමකට ලක්වන වතු කරයේ ජනයා තරම් රැවටීමක ලක්වන කොටසක්ද නැති තරම්ය. සෑම මැතිවරණයකදී මෙන්ම වතු හාම්පුතුන් සමග සාමූහික ගිවිසුම් ගැසීමේදීත් රැවටීමකට ලක්වන්නේ වතුකරයේ ජනයාය. මේ රැවටීමට සහ සූරාකෑමට තිත තැබීම සඳහා ජනතාව පෙළගැස්සවීමට ජාතික ජන බලවේගය පෙරට පැමිණ තිබේ.

මෙවන් වටපිටාවක් තුළ ඉදිරි ජනාධිපතිවරණයේදී අනුර කුමාර දිසානායක සහෝදරයාගේ ජය තහවුරු කරන අති උත්කර්ෂවත් රැලියක් පසුගිය සැප්තැම්බර් 22වැනිදා හැටන් නගරයේදී පැවැත්විණි. මෙය කඳුරට සහෝදරත්ව ව්‍යාපාරය විසින් සංවිධාන කර තිබුණු අතර රැලිය සඳහා වතු කම්කරුවන්, ව්‍යාපාරිකයන්, වෘත්තීයවේදීන්, නීතිවේදීන් සහ සිවිල් සංවිධාන ක්‍රියාකාරීහු ඇතුළු විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

කඳුරට සහෝදරත්ව ව්‍යාපාරයේ කැඳවුම්කරු මුනියන්ඩි කාලිදාස්, සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ සභාපති කිට්නට් සෙල්වරාජ්, හැටන් වෙළඳ සංගමයේ එස්. ප්‍රභාකරන්, වතු සේවා සමුපකාර වෘත්තිය සමිතියේ නුවරඑළිය දිස්ත්‍රික් සම්බන්ධිකාරක සෙල්වදොරෙයි මනෝහරන් නීතිඥ අනුෂා දර්ශනී තිලකරත්න, ජනතා විමුක්ති පෙරමුණේ නුවරඑළිය දිස්ත්‍රික් සංවිධායක මංජුල සුරවීර ආදීහු මෙහි මුලසුන හෙබවූහ.

# වැඩ කරන ජනතා බලයක් උදෙසා

වෘත්තීය අයිතීන් වෙනුවට දේශපාලන අයිතිය වෙනුවෙන් වැඩ කරන ජනතාව පෙළගස්වන සමුළුවක් පසුගිය සැප්තැම්බර් 12 වෙනිදා කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී මුළු දුනි. පොදුවේ වෘත්තීය සමිති යනු වෘත්තීය අයිතිවාසිකම් සඳහාම පමණක් සටන් කරන සංවිධාන වුවත් එදින මෙම සමුළුව පෙළගැසී තිබුනේ එයින් ඔබ්බට ගිය පුළුල් අරමුණක් වෙනුවෙනි. එනම් ජාතික ජන බලවේගය නියෝජනය කරමින් ජනාධිපතිවරණ සටනට අවතීර්ණ වී සිටින අනුර කුමාර දිසානායක සහෝදරයාගේ ජය තහවුරු කිරීම සඳහායි.

"ජන බල සටන හෙට දින දිනන"යන තේමාව යටතේ මෙම වැඩ කරන ජනතා සමුළුව පැවති අතර රාජ්‍ය, පෞද්ගලික සහ වතු යන ක්ෂේත්‍ර යටතේ වෘත්තීය සමිති නියෝජිතයෝ රාශියක් මේ අවස්ථාව සඳහා සහභාගි වී සිටියහ.

ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය විසින් සංවිධානය කර තිබු මෙම සමුළුව එහි සභාපති කේ.ඩී. ලාල්කාන්ත, අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ, ලංකා ගුරු සේවා සංගමයේ ලේකම් මහින්ද ජයසිංහ, සමස්ත ලංකා වරාය පොදු සේවක සංගමයේ ලේකම් චන්ද්‍රසිරි මහගමගේ ඇතුළු වෘත්තීය සමිති නායකයින් රැසකගේ සහභාගිත්වයෙන් පැවැත්වුණි.







# සේනා හානියට වන්දි ඉල්ලා

කම්කරු ජනයා අරගල කරන අතීතයක් හා වර්තමානයක් මෙරට ඉතිහාසයේ සනිටුවහන්ව තිබුණද ගොවි ජනයා තම ඉල්ලීම් වෙනුවෙන් සටන් කරන ඉතිහාසයක් එතරම් හුරුපුරුදු නැත. එහෙත් මෑතක සිට ගොවි ජන සටන් සක්‍රිය වෙමින් පවතින බව අපට පෙනෙන්නට තිබේ. මෙසේ වීමට හේතු සොයා යෑමේදී පෙනීයන්නේ නිවැරදි නායකත්වයක් වටා ගොවිජනයා එක් රැස් වෙමින් තිබීමය. ඒ වෙන කිසිවෙකුගේ නොව සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ නායකත්වය යටතේය.

එම සම්මේලනය නායකත්වය දුන් තවත් උද්ඝෝෂණයක් පසුගිය සැප්තැම්බර් 18වැනිදා අම්පාර නගරයේදී පැවැත්වුණි. අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිරිපිට මේ විරෝධතාවය පැවති අතර සේනා දළඹුවාගෙන් හානි වූ බඩ ඉරිඟු ඇතුළු වගාවන් සඳහා ආණ්ඩුව පොරොන්දු වූ වන්දි මුදල් නොගෙවීම මෙම විරෝධතාවයට හේතු විය.

මේ අවස්ථාව සඳහා සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න සහෝදරයා ඇතුළු පිරිසක් සහභාගි වී සිටියහ.

# බැංකුව විකිණීමේ බාධා ඉවත් කිරීම




රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලීකරණය කිරීම විවෘත ආර්ථික මොඩලයේ ආර්ථික උපායමාර්ගය ලෙස පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම පැවති සියලු ආණ්ඩුවල අඛණ්ඩ ක්‍රියාමාර්ගය විය. 1977න් පසු හඳුන්වා දුන් එම විවෘත කිරීමේ හා විකිණීමේ වැඩපිළිවෙළ රාජ්‍යය දුර්වල කරන, රජයේ ආර්ථික සම්පත් දේශීය හා විදේශීය සුළු ජාවාරම්කරුවන් පිරිසකට අත්පත් කරගැනීමට පාර කපන සැලැසුමක් බව ජනතාව හොඳින්ම වටහා ගත්තේ 90 දශකයේ මුල් වකවානුවේදීය. ඒ වනවිට මහා පරිමාණ රාජ්‍ය ව්‍යාපාර වූ වානේ, පිඟන්, ටයර් වැනි කර්මාන්ත නිෂ්පාදන සංස්ථා පෞද්ගලීකරණයට ලක්කර තිබූ අතර රාජ්‍ය වතු සමාගම් විකිණීමෙන් මහත් පාඩු සිදුවිය. ආසියාවේ විශාලතම සීනි කර්මාන්ත ශාලාව හා පිඟන් සංස්ථාවද තුනී ලැලි සංයුක්ත මණ්ඩලය, හා තුල්හිරිය, පූගොඩ පෙහෙකම්හල්ද ඒ ඉරණමටම ලක් වූ රාජ්‍ය ව්‍යාපාරයන්ගෙන් කිහිපයකි.

එම පෞද්ගලීකරණ සැලැස්මට අදාළ විකිණීමේ දෙවැනි අර්ධය අරඹන්නේ 1994න් පසු බලයට පත් චන්ද්‍රිකා කුමාරතුංග පාලනයෙන් වන අතර, ඔවුහු තවදුරටත් රාජ්‍ය කර්මාන්ත විකිණීම සමගම සේවා ක්ෂේත්‍රය විකිණීමේ කටයුත්තට අත ගැසූහ. චන්ද්‍රිකා ජනාධිපතිනියගේ ළඟම මිතුරන් වූ තාරාද මෙල්, මනෝ තිත්තවැල්ල වැනි අය එම ක්‍රියාවලිය පිඹුරුපත් කිරීමේ මූලිකයෝ වූහ. තාරාද මැල් මගින් (අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්) ඉදිරියේ කළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා ඍජු ලෙසම පාසල් අධ්‍යාපනයේ සිට විශ්වවිද්‍යාල දක්වාම පෞද්ගලීකරණය කිරීම මූලික අරමුණ කරගත්තේය. නමුත් 90 දශකයේ මුල සිටම ශිෂ්‍ය ව්‍යාපාරය ඊට එරෙහිව සක්‍රීයව මැදිහත්වීමේ ප්‍රතිඵල ලෙස මුළුමනින්ම එම විකිණීමේ ප්‍රයත්නය 'සාර්ථකව' නිමකිරීමට ඔවුන්ට නොහැකි විය.

නමුත් විදුලිය, දේශීය ආදායම් එක්රැස් කිරීමේ යාන්ත්‍රය, ජල කළමනාකරණ පනත් මගින් ජල සම්පත, සෞඛ්‍ය සේවයේ විවිධ අංශ පෞද්ගලීකරණයට ඔවුන් දරන ලද උත්සාහයන් අසීමිතය. 90 දශකයෙන් පසු ජනතා විමුක්ති පෙරමුණ හා ඊට අනුබද්ධ වෘත්තීය සමිති හා ජනතා බලවේග සක්‍රීයව මැදිහත්වීමේ ප්‍රතිඵල ලෙස ආණ්ඩුව බොහෝ උත්සාහයන් යටපත් කිරීමට සමත් වුවද මේ පාලනයන් විසින් තමන්ගේ විකිණීමේ වුවමනාව අත්හැර නොමැත.

**මූල්‍ය ක්ෂේත්‍රය විකිණීම**

කර්මාන්ත, හා සේවා ක්ෂේත්‍ර මෙන්ම ඊළඟට වැදගත්ම අංශය වන්නේ මූල්‍ය ක්ෂේත්‍රයයි. බැංකු හා රක්ෂණ සේවා ඉන් ප්‍රධාන වේ. රාජ්‍ය බැංකු ලෙස ප්‍රධාන මහජන බැංකුව හා ලංකා බැංකුව රටේ සාමාන්‍ය ජනතාවගේ ප්‍රයෝජනයට ඇති ප්‍රධාන බැංකු දෙකය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ලංකාව තම ණය උගුලේ හිරකර ගැනීමට කැමති පරිදි කටයුතු කිරීමට මෙතෙක් කාලයක් නොහැකි වී ඇති එක් ප්‍රධාන හේතුවක් වන්නේ මෙම බැංකු දෙකෙහි ඇති මූල්‍ය ස්ථාවරත්වයයි. විශාල ප්‍රමාණයේ දේශපාලන බලය සහිත පොලුකාරයින් කිහිපදෙනෙකු මෙම රාජ්‍ය බැංකුවලින් තම දේශපාලන හිතවත්කම් මත ණය ලබාගෙන නොගෙවා පැහැර හැර තිබුණත් සාමාන්‍ය ජනතාවගේ 90%කට වඩා නිසි පරිදි ණය ආපසු ගෙවීමත්, රාජ්‍ය බැංකුවල මුදල් තැන්පත් කිරීම පිළිබඳව විශ්වාසයෙන් කටයුතු කිරීමත් නිසා මෙම බැංකු මෙතෙක් රජයේ අයිතිය යටතේ ආරක්ෂිතව පැවැතිණි.

එසේ පැවැතීමේ වාසිය වී ඇත්තේ හදිසි අවශ්‍යතා සඳහා භාණ්ඩාගාර බිල්පත් මගින් රජයේ කටයුතුවලට කෙටිකාලීනව භාණ්ඩාගාරයට ණය දීමට හැකි වීමත්, විශේෂයෙන්ම පාඩු ලබන රාජ්‍ය ව්‍යාපාර අවසන් හුස්ම හෙළීමට පෙර යම් තරමකින් හෝ රාජ්‍ය අයිතිය යටතේ පවත්වා ගෙන යාමටත් රාජ්‍ය බැංකු මහත් ප්‍රයෝජනවත් වී තිබේ. උදාහරණ ලෙස දැනට පාඩු ලබා තිබෙන ශ්‍රීලංකන් ගුවන් සමාගමට පමණක් රාජ්‍ය බැංකුවලින් ලබාදී ඇති ණය පහසුකම රු. කෝටි 10,200කි. ඊට අමතරව විදුලි බල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, තෙල් සංස්ථාව වැනි අත්‍යාවශ්‍ය සේවා සපයන රාජ්‍ය ව්‍යාපාරයන් බොහොමයක් අද පවතින්නේ රාජ්‍ය බැංකු දෙකෙහි පිහිටෙනි. 2019 - ජූලි 31 දිනට රාජ්‍ය ව්‍යාපාරවලට ලබාදී ඇති ණය මහජන බැංකුවෙන් පමණක් රු. මිලියන 1214කි.

**මහජන බැංකුව විකිණීම (පළමු පියවර)**

පසුගිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 1961 අංක 29 දරණ මහජන බැංකු පනතින් නව සංශෝධන මගින් මහජන බැංකුවද ඉතිහාසය පෞද්ගලීකරණය කළ ආයතන ලැයිස්තුවට ඇතුළත් කිරීමේ පළමු පියවර තබා ඇත. ඒ බාසෙල් ජාත්‍යන්තර සම්මුතියට හා මහා බැංකුවේ නියාමනයන්ට අනුකූල වන ලෙස බැංකුවේ ප්‍රාග්ධනය පැවැතිය යුතුය යන කොන්දේසිය පාවිච්චි කරමින් බැංකුවට ප්‍රාග්ධනය එකතු කරන මුවාවෙන් බාහිර පාර්ශවයන් කොටස්වලට මැදිහත්වීම මගින් පෞද්ගලීකරණ ක්‍රියාවලියට බැංකුව ලක් කිරීමයි.

> නව සංශෝධනයන් මගින් රජයේ ඇපවීම ඉවත් කර ඇත. භාණ්ඩාගාරයට හා මහ බැංකු මුදල් මණ්ඩලයට ඇති මැදිහත්වීමේ බලතලද ඉවත් කර සීමාකිරීම කර ඇත. වඩා බරපතළ කරුණ වන්නේ, ඍණපත්‍ර නිකුත් කිරීම ඉදිරි අවස්ථාවකදී කොටස් බවට පරිවර්තනය කර පරිවර්තනික ඍණ පත්‍ර බවට පත් කළහොත් එය වක්‍රාකාරයකින් මහජන බැංකුවේ කොටස් අයිතියට බාහිර පාර්ශවයන්ට ඇතුළත්වීමට ඉඩහදා දීමය.

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ සංශෝධනයේ මූලික අරමුණු 2ක් විය. ඉන් පළමු වැන්න රු. බිලියන 50ක් දක්වා කොටස් ප්‍රාග්ධනය ඉහළ දැමීමයි. දෙවැන්න ඒ සඳහා බැංකු ඍණපත්‍ර (Debertures) නිකුත් කිරීමට බැංකුවට හැකියාව ලබා දීමයි. ඒ සඳහා බැංකු පනතේ 20වැනි වගන්තිය සංශෝධනය කරන ලදී. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව බැංකුවේ ප්‍රාග්ධනය ඉහළ දැමීම ගැටලුවක් නොවන නමුත් එය සිදුකර ඇත්තේ බැංකුවට ප්‍රාග්ධනය ලබාගැනීමේ මුවාවෙන්, එසේ ලබාගැනීමේදී මෙතෙක් නීතිමය වශයෙන් පනතේම සඳහන් කර ඇති දැනට ඇති බලතල විශාල ප්‍රමාණයක් කප්පාදු කරමිනි. නැතහොත් එසේ ප්‍රාග්ධනය ලබා ගැනීමේ ක්‍රියාවලියේදී රජයේ මැදිහත්වීම සීමා කරමින්ය.

මහජන බැංකු පනත අනුව දැනටමත් ඍණ පත්‍ර නිකුත් කිරීමට බැංකුවට හැකියාව ඇතත් එය සිදුකළ යුත්තේ, මුදල් අමාත්‍යාංශයේ අනුමැතියට යටත්ව මහා බැංකුවේ මුදල් මණ්ඩලයේ මගින් කලින් අනුමත කරගෙන වන අතර එම නිකුත් කරන ඍණපත්‍ර සඳහා රජයේ භාණ්ඩාගාර ඇප වීමක්ද ලබා ගත යුතුව තිබුණි. **නව සංශෝධනයන් මගින් රජයේ ඇපවීම ඉවත් කර ඇත. භාණ්ඩාගාරයට හා මහ බැංකු මුදල් මණ්ඩලයට ඇති මැදිහත්වීමේ බලතලද ඉවත් කර සීමාකිරීම කර ඇත. වඩා බරපතළ කරුණ වන්නේ, ඍණපත්‍ර නිකුත් කිරීම ඉදිරි අවස්ථාවකදී කොටස් බවට පරිවර්තනය කර පරිවර්තනික ඍණ පත්‍ර බවට පත් කළහොත් එය වක්‍රාකාරයකින් මහජන බැංකුවේ කොටස් අයිතියට බාහිර පාර්ශවයන්ට ඇතුළත්වීමට ඉඩහදා දීමය.**

මෙම අවදානම දකිමින් විපක්ෂයේ තවත් මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු සමග ජනතා විමුක්ති පෙරමුණේ බිමල් රත්නායක මන්ත්‍රීවරයා මෙම පනතට සංශෝධනයක් ඇතුළත් කරමින් ඉල්ලා සිටියේ මෙම ඍණ පත්‍ර කිසිම ලෙසකින් කොටස් බවට පරිවර්තනයක් නොකළ යුතු බවයි. ආණ්ඩුව එසේ සිදුනොවන බව වාචිකව කියමින් අදාළ සංශෝධනය බහුතර ඡන්දයෙන් පරාජය කරනු ලැබීය. එසේ ඍණ පත්‍ර (ණයකර) කොටස් බවට පත් නොකරන බවට ආණ්ඩුවට සහතිකයක් දිය හැකි නම් එවැනි අවශ්‍යතාවයක් ආණ්ඩුවට ඇත්තේ නැත්නම් වඩා හොඳම දේ බිමල් රත්නායක මන්ත්‍රීවරයාගේ සංශෝධනය පනතට ඇතුළත් කිරීමයි. නමුත් එසේ නොකර අදාළ සංශෝධනය පරාජයට පත්කිරීමෙන්ම ආණ්ඩුවේ ඇත්ත වුවමනාව තේරුම් ගත හැකිය.

**මුදල් නීති සංශෝධනය**

මහජන බැංකුවට අදාල නීති සංශෝධනය කරමින් බැංකුවේ අයිතියට බාහිර පාර්ශවයන්ට ඇතුල් වීමට ඉඩ විවෘත කරන අතරේම, මහ බැංකුව දුර්වල කිරීමේ යෝජනාවක්ද මුදල් නීති සංශෝධනයන් මගින් ගෙන ඒමට ආණ්ඩුව උත්සාහ දරමින් සිටී.

එහි පළමු හා බරපතළම සංශෝධනය ලෙස යෝජනා කර ඇත්තේ මහා බැංකුව රජයෙන් ස්වාධීන කිරීමේ වුවමනාවෙන් භාණ්ඩාගාරයේ ලේකම්වරයා මුදල් මණ්ඩලයෙන් ඉවත් කිරීමයි. නව යෝජනා අනුව මූල්‍ය මණ්ඩලය වෙනුවට යෝජනා කර ඇත්තේ පාලක සභාවකි. ඊට අමතරව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයක් යෝජනා කර ඇති අතර, එහි අධිපති, නියෝජ්‍ය අධිපති හා පාලක මණ්ඩලයේ සාමාජිකයින්ද ඇති අතර, ආර්ථික විද්‍යාව පිළිබඳ බාහිර විශේෂඥයකුද ඇතුළත් කරයි. එයින් බාහිර පුද්ගලයින්ට මූල්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීමට ඇතුළත්වීමට ඉඩ සලසා තිබේ. නමුත් එම මණ්ඩලයට (මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය) මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා ඇතුළත් කර ගෙන නැත. ඒ වෙනුවට මුදල් ඇමති, මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා ආර්ථික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් ඇතුළත් කර සම්බන්ධීකරණ මණ්ඩලයක් සකස් කරයි. එම සම්බන්ධීකරණ මණ්ඩලයේ කටයුතු ලෙස නම් කර ඇත්තේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ගනු ලබන තීරණ හැර අනිකුත් තීරණ ගැනීමයි. තවදුරටත් භාණ්ඩාගාර ලේකම් මුදල් මණ්ඩල සාමාජිකයකු ලෙස ප්‍රතිපත්ති තීරණ ගැනීමට මැදිහත් නොකරන නමුත් විශේෂඥයකු ලෙස බාහිර අයෙකු ඇතුළත් කිරීමට ඉඩ සලසා තිබීම සැක සහිතය.

මහා බැංකු මුදල් මණ්ඩලයේ සමාජිකයකු ලෙස වර්තමානයේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා කටයුතුද කරන තත්වය යටතේත් දූෂිත මහා බැංකු බැඳුම්කර මංකොල්ලය පවා සිදුකළේ නම්, ඍජුව මුදල් අමාත්‍යාංශයේ වගකීමෙන් නිදහස් කර ස්වාධීන කළ පසු හුදෙක් නිලධාරින්ගේ හා මූල්‍ය අරමුදලේ කොන්දේසිවලින්ම පාලනය කරන ආයතනයක්ද විය හැකිය. මේ සියලු කරුණුවලින් පෙන්නුම් කරන එක් යථාර්ථයක් ඇත. එනම්, ධනවාදී

15 වැනි පිටුවට



"අධිරාජ්‍යවාදයේ ස්වභාව නිරූපී අංග ලක්ෂණය රැඳී පවතින්නේ, අපට පෙනෙන්නට තිබෙන පරිදි, ලෝකය පීඩිත ජාතීන් විශාල ගණනක්ද, පීඩක ජාතීන් ඉතාමත් කුඩා සංඛ්‍යාවක්ද, වශයෙන් බෙදී තිබීම සහ මෙහි පසු කී ජාතීන්ට යෝධ ධනස්කන්ධයක් සහ බලවත් යුද්ධ හමුදා තිබීම කෙරෙහිය."

**ලෙනින්**
**පෙරදිග ලෝකයේ ජාතික විමුක්ති ව්‍යාපාර, 326 පිටුව**

# ඉරානය: යේමන අර්බුදයේ බලපෑමට හසුවී



පසුගිය සැප්තැම්බර් 14වැනි දින සෞදි අරාබියේ අබ්ක්වායික් ඛනිජ තෙල් පිරිපහදු සංකීර්ණයට කෲස් මිසයිල ප්‍රහාරයක් සහ ඩ්‍රෝන ප්‍රහාරයක් එල්ල විය. ලෝකයේ ප්‍රධානතම ඛනිජ තෙල් අපනයනකරු වන සෞදි අරාබියේ ඛනිජ තෙල් නිෂ්පාදනයෙන් අඩක් සහ ලෝක ඛනිජ තෙල් සැපයුමෙන් 5%ක් එනම් දිනකට තෙල් බැරල් මිලියන 5.7ක් නිෂ්පාදනය කෙරෙන්නේ මෙහිදීය. සෞදි අරාබිය එම ප්‍රහාරයට වගකිව යුත්තේ ඉරානය යයි වහාම ප්‍රකාශ කළාය.

සෞදි අරාබිය දැවැන්ත ආරක්ෂක වියදමක් දරමින් ඉතාම නවීන තාක්ෂණයෙන් යුක්ත ගුවන් ආරක්ෂණ පද්ධතියක් නඩත්තු කරයි. එවන් නවීන ගුවන් ආරක්ෂක පද්ධතියක් මඟහරිමින් මේ ආකාරයේ ප්‍රහාරයක් එල්ල කිරීමට හැකි වූයේ කෙසේද යන්න ගැටලුවකි. සෞදි අරාබි බලධාරීන් ඒ පිළිබඳ විවිධ පැහැදිලි කිරීම් සිදුකළද ඒවාද පරස්පර විරෝධීය.

මේ අතර යේමනයේ හුති ව්‍යාපාරය (Houthi movement) ප්‍රහාරයේ වගකීම භාරගනිමින් ප්‍රකාශයක් නිකුත් කර තිබුණි. ඉරානය ප්‍රහාරය සම්බන්ධයෙන් තමන් වෙත එල්ල කළ චෝදනා තරයේ ප්‍රතික්ෂේප කළද සෞදි අරාබිය දිගින් දිගටම එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ට බලකළේ ප්‍රහාරය සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන ලෙසටය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සැප්තැම්බර් 21වැනිදා එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් සෞදි ගුවන් ආරක්ෂක පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා එක්සත් ජනපද හමුදා යැවීම අනුමත කරනු ලැබිණි. ඒ අනුව ඉදිරියේදී සෞදි ආරක්ෂාව වෙනුවෙන් THAAD මිසයිල ආරක්ෂණ පද්ධතියක්ද පේට්‍රියොටික් මිසයිල ආරක්ෂණ පද්ධති දෙකක්ද හමුදා සෙබළුන් 200ක්ද යැවීමට නියමිතය.

2015 මාර්තු මාසයේ සිට සෞදි අරාබිය යේමනයේ සිවිල් යුද්ධයට මැදිහත් වී සිටී. යේමනයේ වැඩි කොටසක පාලන බලය පවතින්නේ ඉරානයේ සහය ලබන හුතිවරුන් අතය. සෞදි අරාබිය යේමනයේ යුද්ධය සඳහා යොදවන්නේ එක්සත් ජනපදය විසින් සපයනු ලබන යුධ උපකරණයි. සෞදි අරාබිය යේමනයේ හොඩෙයිඩා වරාය අවුරමින් සිටින අතර ශතවර්ෂයේ දරුණුතම සාගතයට යේමනය ගොදුරු කර ඇත. යුනිසෙෆ් සංවිධානයට අනුව යේමනයේ සමස්ත ජනගහනයෙන් 80%කට, මිලියන 12ක් වූ කුඩා දරුවන්ද ඇතුළුව මානුෂික ආධාර අවශ්‍ය තත්වයකට පත්ව සිටී.

මෙම සිදුවීම සෞදි අරාබියට, යේමනයට හෝ ඉරානයට පමණක් බලපාන ප්‍රශ්නයක් නොවේ. මෙය ජාත්‍යන්තර දේශපාලනය තුළ ප්‍රධාන කාර්යභාරයක් සිදුකරන සිදුවීමක් බවට පත්ව තිබේ. මේ මොහොතේදී පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මහා සභාවාරයේදී පවා ප්‍රධාන මාතෘකාවක් බවට මෙම සිදුවීම පත්වූයේ එබැවිනි.

ඉරානය මේ මොහොතේ මුහුණ දී සිටින්නේ අර්බුදකාරී දේශපාලන වටපිටාවකටය. සිරියානු අර්බුදය, යේමන අර්බුදය සේම එක්සත් ජනපදය විසින් පැනවූ සම්බාධක පිළිබඳ අර්බුදයකටද ඔවුහු මුහුණ දී සිටිති. සිය පාර්ශ්වික න්‍යෂ්ටික එකඟතාවන්ගෙන් ඒක පාර්ශ්විකව ඉවත් වූ එක්සත් ජනපදය ඉරානයට එරෙහිව සම්බාධක පනවා තිබේ. ඉරානයට එරට ආර්ථික සංවර්ධනය සඳහා කාර්මික සාමය අවශ්‍ය වුවද එය දිගින් දිගටම අහිමිව යමින් සිටී. එවැනි තත්වයක් තුළ ඉරානය මේ ආකාරයේ අනුවණ ප්‍රහාරයක් එල්ල කිරීමට ඇති ඉඩකඩ අල්පය. එහෙත් මේ මොහොතේදී මෙම තත්වය යොදා ගනිමින් එක්සත් ජනපදය සමග යළි සාකච්ඡා කිරීමට හා එමගින් න්‍යෂ්ටික ගිවිසුම පිළිබඳ නව එකඟතාවකට පැමිණීමට ඉරානය උත්සාහ කිරීමට ඉඩ තිබේ.

යුරෝපා සංගමයේ රටවල් මෙම ප්‍රශ්නයේදී බෙදී සිටින අතර ප්‍රංශ ජනාධිපති මැක්‍රෝන් උත්සාහ කරමින් සිටින්නේ යළි කොසේ හෝ ඉරානය හා එක්සත් ජනපදය න්‍යෂ්ටික එකඟතාවකට ගෙන ඒමටය.

චීන මෙම ගැටලුව සාමකාමීව විසඳා ගත යුතු බවට ප්‍රකාශයක් නිකුත් කර තිබුණි. මේ අතර සෞදි අරාබිය සහ ඊශ්‍රායලය වැනි රටවල් මෙම සිදුවීම පාදක කරගනිමින් ඉරානයට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගැනීමට එක්සත් ජනපදය ඇතුළු අනෙකුත් රටවල් පෙළඹවීමටත් ඒ මගින් කලාපය තුළ ඉරාන බලපෑම දුර්වල කිරීමට උත්සාහ කිරීමටත් ඉඩ තිබේ.

පකිස්ථාන අගමැති ඉම්රාන් ඛාන්ද මෙම ප්‍රශ්නයේ මැදිහත්කරුවෙකුගේ කාර්යය ඉටුකිරීමට උත්සාහ කරනු පෙනෙන්නට තිබේ. කෙසේ වෙතත් මේ සියල්ල මේ මොහොතේ ලෝක දේශපාලනයේ පවතින ප්‍රතිවිරෝධතාවන්ගේ ප්‍රකාශනයක්ය. මේවා හුදු සිදුවීම් වලින් අවසන්වේද එසේත් නැත්නම් ගුණාත්මක වෙනසකට තුඩුදෙන ආසන්න හේතු බවට පත්වේද යන්න තීරණය වන්නේ තත්වයන්ගේ වර්ධනය විසිනි.

## වෙනිසියුලාව: එ.ජ. උගුලට එරෙහිව චීන සහය ලැබ



ඇමරිකානු රාජ්‍යයන්ගේ සංවිධානය විසින් වෙනිසියුලාවට එරෙහිව ක්‍රියාත්මක කිරීමට සැරසෙන අන්‍යෝන්‍ය ආධාර සඳහා වන අන්තර් ඇමරිකානු ගිවිසුමට චීනය විරෝධය පළ කර තිබේ. නිකරගුවාව, කියුබාව, මෙක්සිකෝව සහ උරුගුවේ රාජ්‍ය සමග එක්ව ඊට විරෝධය පළ කළ චීනය පැවසුවේ තමන් වෙනිසියුලාව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය අනුව කටයුතු කරන බවත් වෙනිසියුලාවේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් වීමට දරන උත්සාහය හෙළා දකින බවත්ය.

ඉහත ගිවිසුම භාවිතා කරමින් තම රටට විදේශීය යුදමය මැදිහත් වීමක් සිදු කිරීමට ඇති ඉඩකඩ පිළිබඳ වෙනිසියුලාව අනතුරු අඟවා තිබුණි. 1947 දී අත්සන් කරන ලද මෙම ගිවිසුම වෙනිසියුලාව සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට ඇමරිකානු රාජ්‍යයන්ගේ සංවිධානය විසින් තීරණය කර තිබුණි.

## යුද මරණ පරදවන දිවි නසා ගැනීම්



2019 සැප්තැම්බර් 9 වන දින ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිකුත් කළ වාර්තාවකට අනුව සෑම තත්පර 40කට වරක්ම ලෝකයේ සියදිවි නසාගැනීමක් සිදු වේ. ඒ අනුව වර්ෂයකදී පුද්ගලයෝ අට ලක්ෂයක් සිය දිවි නසා ගනිති. එය වර්ෂයකදී යුද්ධවලින් සිදුවන මරණ ප්‍රමාණයට වඩා වැඩිය.

වයස අවුරුදු 15 - 29 ත් අතර තරුණ ජනගහනයේ සිදු වන මරණවලින් දෙවැනි තැන ගන්නේ සිය දිවි නසා ගැනීම්ය. පළමු තැන රිය අනතුරුවලට හිමිවේ.

## රුසියාව: සුභසාධන නීති කප්පාදුවට සැරසී




2020 වසරේ ජනවාරි 1 දින සිට රුසියානු ආණ්ඩුව එතෙක් සෝවියට් සමූහාණ්ඩුව විසින් සම්මතකර ක්‍රියාත්මක කර තිබූ සියලු නීති හා අණපනත් අහෝසි කිරීමට තීරණය කර තිබේ. මේ බව පසුගිය සැප්තැම්බර් 11වැනිදා රුසියානු අගමැති දිමිත්‍රි මෙඩ්වෙඩෙව් විසින් නිල වශයෙන් ප්‍රකාශ කරන ලදී. එය මන්දගාමී වෙමින් පවතින රුසියානු ආර්ථිකය නගා සිටුවීම සඳහා ගත් පියවරක් බවද එහිදී ඔහු සඳහන් කළේය.

සෝවියට් දේශය බිඳ වැටුණද සෝවියට් යුගයේදී සම්මත කරගත් නීති හා අණ පණත් දහස් ගණනක් තවමත් ක්‍රියාත්මකව පවතී. මේවායින් බොහොමයක් සමාජවාදය යටතේ සමාජ සුභසාධනය වෙනුවෙන් පැනවූ ඒවාය. ඔක්තෝබර් විප්ලවයෙන් දින 04කට පසු සම්මත කරන ලද පැය 08ක වැඩ දිනය පිළිබඳ නීතියද මේ අනුව ලබන වසරේ ජනවාරි මාසයේ සිට අවලංගු වීමට නියමිතය.

## කාලගුණ වෙනසට එරෙහි සටනට පාසැල් ශිෂ්‍යාවක්




සිය දහස් ගණනක් පාසල් දරුවන් සමග මිලියන ගණනක ජනතාව කාලගුණ විපර්යාසයන්ට එරෙහිව වීදි බැස උද්ඝෝෂණය කරනු ලැබිණි. මෙය කාලගුණ විපර්යාසයන්ට එරෙහිව මෙතෙක් සිදු කළ විශාලතම උද්ඝෝෂණය ලෙසට ඉතිහාස ගත වේ. මේ සඳහා රටවල් 150ක පමණ ජනතාව සහභාගි වූ බව වාර්තා වේ. මෙයට ආරම්භය ලබා දෙනු ලැබුවේ ග්‍රේටා තාන්බර්ග් (Greta Thunberg) නමැති ස්වීඩන් ජාතික දාසය හැවිරිදි පාසල් දැරියයි. ඇය සෑම සිකුරාදාවකම පාසලෙන් පිට වී කාලගුණ විපර්යාසයන්ට එරෙහිව උද්ඝෝෂණයේ යෙදුණාය. ඇයගේ මෙම ක්‍රියාව විසින් පොළඹවනු ලදුව ඉහත උද්ඝෝෂණ රැල්ල පැන නැගුණි. මෙම උද්ඝෝෂණවලදී ජනතාව ලෝක නායකයින්ට බලකර සිටියේ ඇමේසන් වනාන්තරයේ ගින්න, සයිබීරියාවේ සිදුවන වන ජීවී විනාශය ආදී පාරිසරික විනාශයන් නැවත සිදු නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග වහා ක්‍රියාත්මක කරන ලෙසයි.

# සමාජවාදී රටක ආගමික නිදහස සහ භාෂා ප්‍රතිපත්තිය

(සෝවියට් දේශය ඇසුරෙන්)

*නියමුවා පුවත්පතේ 'දැනුම' තුළින්, මීට පෙරදී අපි සමාජවාදය තුළදී ආගමික නිදහස කෙසේ වේද යන්න පිළිබඳව පොදුවේ සාකච්ඡා කර ඇත්තෙමු. මෙවර කලාපයෙන් අප බලාපොරොත්තු වන්නේ එය සෝවියට් සංගමය තුළ ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව විමසා බැලීමටය. එහිදී අප සෝවියට් දේශය තුළ භාෂා ප්‍රතිපත්තිය කෙසේ සකස් වී තිබුණේද යන්නත් විමසා බලමු. ඒ සඳහා අපි සෝවියට් සංගමයේ ඇමති මණ්ඩලය යටතේ පැවැතුන ආගමික කටයුතු පිළිබඳ මණ්ඩලයේ සභාපති ව්ලදිමීර් කූරෝයිදෝව් විසින් සකස් කළ ලේඛනයන් පාදක කොට ගත්තෙමු.*





"පොදු ජනතාව තවමත් අප කෙරෙහි විශ්වාසය තබා නැත. අපට ඉවසා සිටිය හැක. ආණ්ඩුව එහි මුහුණ පෙන්වූ කල පොදු ජනතාව අපගේ පැත්ත ගන්නාවා ඇත. ආණ්ඩුවේ වැනෙනසුළු ස්වභාවය නිසා ඔවුන් එයින් ඈත් වී අපගේ පැත්තට හැරී එනු ඇත. එවිට බලවේග තුලනය සැලකිල්ලට ගනිමින් අපි මෙසේ කියන්නෙමු. අපගේ කාලය පැමිණ තිබේ."

**ලෙනින්**
**තෝරාගත් කෘති, 5වැනි වෙළුම**
**78-79 පිටු**

### ආගමික නිදහස

ආගම් පිළිබඳ සෝවියට් නීතිවල මූලික කරුණු රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52වැනි වගන්තියට ඇතුළත් වෙයි. එමගින් සෝවියට් සංගමයේ සියලුම වැසියන්ගේ ආගම් ඇදහීමේ නිදහස තහවුරු කොට ඇත. එනම්, ආගම් ඇදහීමටද ආගමික පුද පූජා, වත් පිළිවෙත් පැවැත්වීමටද අනෙක් අතින් ආගමක් නොඅදහා සිටීමටද ආගමික ප්‍රචාරක කටයුතු කිරීමටද සම්පූර්ණ නිදහස සහතික කොට තිබේ. ආගම් මත පිහිටා කලකෝලාහල කිරීම, ද්වේෂය හා වෛරය පැතිරවීම නීතිය මගින් තහනම් කොට ඇත. " සෝවියට් සංගමයේ රජයෙන් ආගමද, පල්ලියෙන් පාසලද වෙන්කොට ඇත."

අදේවවාදය, කොමියුනිස්ට් මතවාදයට අයත් කොටසකි. විවිධ ආගම් හා පූජක පක්ෂය සතු නීත්‍යානුකූල අයිතිය ආරක්ෂා කර දෙන නීති සෝවියට් නිති සංග්‍රහයෙහි ඇත. ආගමික වතාවත් හා පුද පූජා පැවැත්වීමට බාධා කිරීම සාපරාධි වරදක් ලෙස සලකනු ලැබේ. බැතිමතුන්ට විරුද්ධව හා ආගම් ඇදහීමට විරුද්ධව ක්‍රියා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කොට ඇත. දෙවියෙක් නැතය යන මතය පිළිගැන්විය හැක්කේ තර්කයෙන් හා බුද්ධියෙන් පමණි. ආගම් පිළිබඳ නීති නිසි ලෙස පිළිපදින්නේ දැයි පරීක්ෂා කිරීම ආගම් පිළිබඳ මණ්ඩලය සතු වගකීම වෙයි. සෝවියට් සංගමයේ සමූහාණ්ඩුවලින් හා ප්‍රදේශවලින් පත්කරන ලද නියෝජිතයන්ගෙන් මෙම මණ්ඩලය සෑදී ඇත. වයස අවුරුදු 18ට ඉහළ රටවැසියන්ගේ පොදු ආගමික අවශ්‍යතා සපුරාලීමට සෝවියට් නීති ඉඩ සලසා දෙයි. සාමාජික සංඛ්‍යාව අනුව ඔවුන්ට ආගමික සමිති සමාගම් පවත්වාගෙන ගිය හැකිය. සාමාජිකයනින් විස්සකට වැඩි නම් එය ආගමික සමාජයක් ලෙසද ඊට අඩු නම් සමූහයක් ලෙසද සලකනු ලැබේ.

ආගමික සමාජයකට හෝ සමූහයකට හෝ සිය ආගමික කටයුතු ආරම්භ කළ හැක්කේ රජයේ නියමයන් අනුව නිත්‍යානුකූලව ලියාපදිංචිවීමෙන් පසුවය. ලියාපදිංචි වන්නේ කුමක් සඳහාද? එම සංවිධානය රටේ නීතිය පිළිගැනීමට බැඳී සිටින අතර, ආගම් ඇදහීමේ නිදහස ආරක්ෂා කරන නීතියෙන් ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු වෙයි. ආගමික සමිති සමාගම් ලියාපදිංචි කිරීමෙන් සාමාජිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වෙයි. ආගමික සමාජයක් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික ප්‍රතිපත්තිය තමාගේ ස්වාධීන කැමැත්තයි. හැම රටවැසියෙකුට ම තමාගේ කැමැත්ත අනුව ආගමික සමාජයක සාමාජිකයෙකු විය හැකිය. නැතිනම් ඉවත් විය හැකිය.

මෙසේ නීත්‍යානුකූලව පිහිටුවා ගන්නා ලද ආගමික සමිතියක හෝ සමාජයක සාමාජිකයන් එක්රැස්වී ස්වකීය ආගමට අයත් වත් පිළිවෙත් පැවැත්විය හැකිය. පූජකයන් පත්කර ගත හැකිය. ආගමික ගොඩනැගිලි හා දේපොළ පාවිච්චි කළ හැකිය. පාලනය කළ හැකිය. ඒවා නඩත්තු කිරීමට අවශ්‍ය මුදල් එකතු කළ හැකිය. සමිතියේ කටයුතු කරගෙන යාමට, දේපොළ හා මුදල් පාලනයට අවශ්‍ය නිලධාරීන් මහා සභා රැස්වීමකදි තමන් අතරින් පත්කර ගත හැකිය. අයවැය පරීක්ෂා කිරීමට පරීක්ෂක මණ්ඩලයක් පත්කර ගත හැකිය.

ආගමික නිදහස උදෙසා රජය විසින් දෙනුලබන තවත් අනුග්‍රහයක් නම් ආගමික වත් පිළිවෙත් පැවැත්වීමට හා රැස්වීම් පැවැත්වීමට රජය සතු ගොඩනැගිලි නොමිලයේදීමය. එය ආගමික සමිතිය හා පළාත් පාලන ආයතන අතර අත්සන් කරන ලද ගිවිසුමක් යටතේ විය යුතුය. මේ හැර තමන්ගේ අවශ්‍යතාවයන් සඳහා ගොඩනැගිලි කුලියට ගත හැකිය. අලුතින් තැනිය හැකිය. නැතිනම් මිලදී ගත හැකිය.

මෙසේ රජය විසින් ආගමික සංවිධානවලට නොමිලයේ දෙන ලද දහස් ගණන් ගොඩනැගිලි අතර ඓතිහාසික වූද ගෘහ නිර්මාණය අතින් ඉතා වැදගත්ත වූද පැරණි ගොඩනැගිලි බොහෝ ඇත. නිදසුනක් වශයෙන් මීට අවුරුදු 800කට පෙර ඉදිකරන ලද මධ්‍යම ආසියාවේ ව්ලදිමීර් නගරයේ පිහිටි ක්‍රිස්තුස් වහන්සේගේ මෑණියන්ගේ ස්වර්ගස්ථවීම සිහිකිරීම සඳහා ඉදිකරන ලද ආසන දෙව්මැදුර දැක්විය හැකිය. මීට අවුරුදු 800කට පෙර මේ දෙව්මැදුරේ දේව මෙහෙයය පැවැත්වූවාක් මෙන් අදද දේව මෙහෙයය පවත්වනු ලැබේ. සුප්‍රසිද්ධ රුසියන් චිත්‍ර ශිල්පීන් වන ඇන්ඩ්‍රි රුබ්ලෙව් හා දනීල් චානි විසින් මෙම දේවස්ථානය තුළ අඳින ලද අගය කියා නිමකළ නොහැකි බිතු සිතුවම් ආරක්ෂා කිරීමට විශේෂ වැඩපිළවෙළක් සකස් කොට ඇත. විවිධ ආගම්වලට අයත් ආගමික ගොඩනැගිලි 20,000ක් පමණ අද සෝවියට් සංගමය තුළ තිබේ.

සෝවියට් රජය හා පල්ලිය අතර යහපත් සුහද සම්බන්ධතාවයක් පවතියි. සෝවියට් සංගමයේ බැතිමතුන්ගේ තත්වය ගැන මොස්කම් නුවර නායක පූජකතුමා මෙසේ පවසයි. "සෝවියට් සංගමයේ ව්‍යවස්ථාවෙන් ආගම ඇදහීමේ නිදහස තහවුරු කොට ඇත. රුසියන් ඕතොඩොක්ස් පල්ලිය ඇතුළු අනෙක් සියලුම ආගම්වලට සමාන අයිතිවාසිකම් හිමි වෙයි. හැම ආගමකටම ස්වාධීන පාලනයක් ඇත. පූජක පක්ෂය ඇතුළු ආගම් අදහන්නන් සතු පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ගැන රජය දැඩි විමසිල්ලෙන් සිටියි. සෝවියට් සංගමයේ ජනගහනය ගණන් ගන්නේ ආගම පදනම් කරගෙන නොවෙයි. ජනගහනය ගණන් ගැනීමේදී, රක්ෂාවක් දීමේදී, ගමන් බලපත්‍රයක් දීමේදී තමා විවිධ ආගම් අදහන බැතිමතුන් හා පූජක පක්ෂය සෝවියට් සංගමයේ සියලු අතියිවාසිකම් හිමි පුරවැසියෝ වෙති. ඔවුහු රටේ දේශපාලන, ආර්ථික හා සමාජ කටයුතුවලට සහභාගි වෙති."

### භාෂා ප්‍රතිපත්තිය

පෘථිවිය මත තිබෙන, විවිධ ජාතීන් බොහොමයක් වෙසෙන රට සෝවියට් සංගමයයි. එහි භාෂා සියයකට වඩා ඇත. සෝවියට් ජාතික ප්‍රතිපත්තිය අනුව ලොකු කුඩා හැම භාෂාවකටම සම තැනක් තිබෙන අතර, නිදහස්ව වර්ධනය වීමට ඉඩකඩ සලසා ඇත. එය රටේ නීතිය බවට පත්වී තිබේ. එය සෝවියට් සංගමයේ ව්‍යවස්ථාවටත්, සමූහාණ්ඩුවල ව්‍යවස්ථාවලටත් ඇතුළත් කොට ඇත. රට තුළ වෙසෙන විවිධ ජාතීන් අතර සම්බන්ධය වර්ධනය කිරීමට භාෂාව ඉතාම වැදගත් මාර්ගය ලෙස සලකනු ලැබේ.

රුසියන් බස සෝවියට් සංගමයේ වැඩි දෙනෙක් කතා කරන බසයි. රට තුළ වෙසෙන විවිධ ජාතීන් අතර, අදහස් හුවමාරුව සඳහා රුසියන් බස තෝරා ගෙන තිබෙන්නේ ඒ නිසාය. 1970 සිටි ජනගහනයෙන් රුසියන් නොවන අය සියයට 49ක් රුසියන් බස ගැන හොඳ දැනුමක් තිබුණු අතර, 1979 දී එය ගණන සියයට 62 දක්වාද 1982 සියයට 83 දක්වාද වැඩි විය.

රුසියන් බස ලෝකයේ ප්‍රධාන භාෂා හයෙන් එකකි. ඉංග්‍රීසි, ස්පාඤ්ඤ, ප්‍රංශ හා අරාබි අනෙක් ප්‍රධාන භාෂා ලෙස සැලකිය හැකියි. රුසියන් බස සෝවියට් සංගමය තුළ භාවිතා වන අනෙක් භාෂා කෙරෙහි බලපාන අතර, අනෙක් භාෂා රුසියන් බස කෙරෙහිද බලපෑමක් ඇති කරයි. එමගින් භාෂාවල දියුණුවක් ඇති වෙයි. කලින් හෝඩියක් පවා නොතිබුණු භාෂාවල වර්ධනයට රුසියන් බසින් විශාල සේවයක් ඉටුවිය. සෝවියට් සංගමය තුළ වෙසෙන සුළු ජාතීන් පනහකට පමණ තමන් සතු ලිඛිත බසක් ලැබුණේ විප්ලවයෙන් පසුවයි.

රුසියන් බස පැතිරයාම සෝවියට් සංගමයේ අනෙක් ජාතික භාෂාවල දියුණුවට බාධාවක් නොවන බව පැවැසිය යුතුය. එය බාධාවක් නොව රැකුලක් වෙයි. භාෂා දෙකක් මිශ්‍රවීමෙන් එම භාෂාවල ජාතික ලක්ෂණ පිරිහෙන්නේ නැත. එය භාෂා විශේෂඥයන් විසින් පිළිගන්නා ලද සත්‍යයකි.

> 1972 දී ගන්නා ලද ජන ලේඛනයේදී සෝවියට් පුරවැසියන් සියයට 93කට වැඩි දෙනෙක් ස්වකීය ජාතියට අයත් බස, මව් බස ලෙස සඳහන් කළහ. සෝවියට් සංගමයේ ජාතික භාෂා නිදහස්ව වර්ධනය වන බව මින් ඔප්පු වෙයි. අනෙක් අතින්, සෝවියට් සංගමයේ ජාතික භාෂාවල වර්ධනයට නිදහස ඇත. "අන්තිමේදී ජාතික භාෂා විනාශ කරමින් රුසියන් බස පමණක් රජවනු ඇතැ"යි කියමින් අපට චෝදනා කරන බටහිර විරුද්ධවාදීන් ගෙන යන ප්‍රචාරය මින් අසත්‍යයක් බව ඔප්පු වෙයි.

1972 දී ගන්නා ලද ජන ලේඛනයේදී සෝවියට් පුරවැසියන් සියයට 93කට වැඩි දෙනෙක් ස්වකීය ජාතියට අයත් බස, මව් බස ලෙස සඳහන් කළහ. සෝවියට් සංගමයේ ජාතික භාෂා නිදහස්ව වර්ධනය වන බව මින් ඔප්පු වෙයි. අනෙක් අතින්, සෝවියට් සංගමයේ ජාතික භාෂාවල වර්ධනයට නිදහස ඇත. " අන්තිමේදී ජාතික භාෂා විනාශ කරමින් රුසියන් බස පමණක් රජවනු ඇතැ"යි කියමින් අපට චෝදනා

15 වැනි පිටුවට

# කඩුල්ල පැනීම



දසමසක් කුස දරා මවක් දරුවකු බිහිකරන්නේ දහසකුත් බලාපොරොත්තු කරපින්නාගෙනය. එසේ බිහිකරන දරුවා කිසිදු අඩුපාඩුවක් නැති සම්පූර්ණ නිරෝගී දරුවකු වනු දැකීම මව්වරුන්ගේ පැතුමයි. එසේ නම් අංගවිකල දරුවකු අපේක්ෂා නොකරන මවක් අංගවිකල පාලනයක් බිහිකර ගැනීමට දායකත්වයක් දිය යුතුද ?

71 වසරක් පුරා සමාජ ගර්භාෂය විටින් විට ගැබ්බර වෙමින් විළිරුදා විඳිමින් බිහිකළ පාලකයින් හා පාලනයන් අංගවිකල බව අපට අමුතුවෙන් කිවයුතු නොවේ. එවන් පාලනයක් තවදුරටත් රට නිරෝගී කරනු ඇතැයි අපේක්ෂා දල්වාගන්නට තරම් අපි අඥබාලයන්ද නොවන්නෙමු. මක්නිසාද 71 වසරක් පුරාවට රට පාලනය කළ නිල් කොළ පාලකයින් අපේ රට අගාධයෙන් අගාධයට ඇද දැමුවා විනා දෙපයින් නගාසිටුවන්නට අසමත් වූ බැවිනි; නූපන් දරුවන් පවා ණය උගුලක සිරකළ බැවිනි. එවැන් පාලකයින් තවත් මේ රටට අවැසි නොවන බව අපි ඉඳුරාම අවබෝධ කරගෙන ඇත්තෙමු.

දැන් එළඹ ඇත්තේ අපේ වාරයයි. නොවැම්බර් 16වැනි දිනට ජනාධිපතිවරණය පැවැත්වීමට දින නියමවී තිබේ. මෙතෙක් නොදුටු ආකාරයේ ජනාධිපතිවරණයක් අපට දැකගන්නට ලැබෙනු ඇති බවට පෙර නිමිති පහළ වෙමින් තිබේ. සටන් බිම උණුසුම් වෙමින් පවතී. තැනින් තැන පුස් වෙඩි පත්තු වෙනු ඇසුනද රැල්ල නැගෙන්නේ ජාතික ජන බලවේගයේ අපේක්ෂකයා දෙසට බව පෙනී යමින් තිබේ. මේ බලවේගය ආපසු හැරවීමට නොදී ඉදිරිය තෙක්ම ජයග්‍රහණය තෙක්ම හා ඉන් එහාගිය පුළුල්තම සමාජ පරිවර්තනයක් උදෙසා ඔසවා තැබිය යුතුය.

ඒ උදාරතර කර්තව්‍යයේ කාන්තා භූමිකාව කුමක්දැයි අප විසින් හඳුනාගත යුතුව තිබේ. අප පෙර කියූ පරිදිම ජනගහනයෙන් 52%කට ආසන්න වූ කාන්තාවන් ජනාධිපතිවරයා තේරීමේ තීරණාත්මක බලය හොබවනු ලබයි. ඒ බලය නිසිලෙස යොදාගැනීම වෙනුවෙන් පෙළගැස්වීම අද දවසේ කාන්තාවන්ගේ කාර්යභාරයයි. එකී කාර්යය උරමත පටවාගත් අපේ සොහොයුරියන් දැනටමත් බස්රියේ, දුම්රියේ, කඩපිලේ, වැඩබිමේ, පාසලේ, කාර්යාලයේ තම වගකීම නිසි ලෙස ඉටුකරමින් හිඳිනු දක්නට ලැබේ. ඒ නිසාම පාලකයින් වෙනස් කිරීම සඳහා වූ දැවැන්ත කතිකාවක් සමාජය තුළ ගොඩනැගී ඇත. අවශ්‍ය වන්නේ නොවැම්බර් 16වැනි දින දක්වා මේ කතිකාව ගෙනගොස් යහපත් ප්‍රතිඵලයක් උදෙසා ඡන්ද බවට පත්කර ගැනීමයි. ඒ සඳහා අපට තවත් මාස එකහමාරක පමණ ඉතිරිව තිබේ. ඒ කාලය තුළ අප අපේ කාර්යභාරය තව සියදහස් ගුණයකින් වැඩි කර ගනිමින් කටයුතු කළ යුතුමය.

අප එසේ කළ යුත්තේ ඇයි? 71 වසරක් පුරා සිදුවූවා මෙන්ම මෙවරද සුපුරුදු රැවටීමේ ජවනිකාව කරළියට පැමිණීමට නියමිතව තිබේ. දැනටමත් සිමෙන්ති හා වෙනත් ද්‍රව්‍ය බෙදා හැරීම් ආරම්භ කර ඇත. කුකුල්කූඩු මෙන් ගෙවල්ද, බඩු මලු හා ටකරං තහඩුද, බත්පැකට් හා කසිප්පු බෝතල්ද, ඒ මේ අත හුවමාරු වෙනු දක්නට ලැබෙනු ඇත. අනෙක් අතින් ජාතිවාදය, ආගම්වාදය අවුළුවාලමින් රටේ ජනතාව භේදබින්න කර වාසි ලබාගැනීමේ කුට උපක්‍රමද ක්‍රියාත්මක වනු ඇත. සිල්රෙදි පොරවාගත් උපාසක බළලුන් බොරදියේ මාළු බාන ආකාරය ඇස්පනාපිට දැකගන්නට හැකිවනු ඇති බවට සැකයක් නැත. එහෙයින් අප වඩාත් පරිස්සම් සහගතව අපේ වගකීම ඉටුකළ යුතුව තිබේ.

අප වඩා පරිස්සම් විය යුතු බව කියන්නේ ඇයි? මේ සියලු ජවනිකාවල පහසු හා නියත ගොදුරු බවට පත්වන්නේ බහුතරයක් කාන්තාවන් නිසාමය. මුළාකිරීම් අනිවාර්ය සාධකය බවට පත්වූ තවත් ලාංකේය මැතිවරණයක මුළාවීම අනිවාර්යයක් කර ගත යුතු නැති බව කාන්තාවන් ලෙස අප තරයේ සිතට ගත යුතුය. මේ රුවටිලිකාරී ප්‍රෝඩාකාරී ධනපති දේශපාලුවන් නිසා සෑම ඡන්දයකදීම ගහමරා ගනිමින් ගෙවල් ගිනිතියාගනිමින් ජනතාව කා කොටා වැටෙද්දී එහි දුක්ඛිත තත්වයේ නියත ඉරණම්කරුවන් වන්නේ කාන්තාවන් වන අපම බව අවධාරණය කරගත යුතුමය.

ඒ නිසා ජනතාවට නුහුරු නුපුරුදු නමුත් අනුගමනය කළ යුතු සුපිළිපන් දේශපාලනයක් උදෙසා රටේ ජනතාවගේ මනෝභාවයන් සැකසීම අපගේ උරමත පැටවුන වගකීමකි. ජනතාව අතට අතදුන් පසු අත සෝදන පාලකයෙකුට වඩා, මාධ්‍යට පෙනෙන්ට බොරුවට සිල් ගන්නා, දරුවන් වඩා ගන්නා අළුගෙ‍ාසුවෙකුට වඩා අම්මලාට කටපුරා 'පුතේ' කිව හැකි ජනාධිපතිවරයෙකු පත්කර ගන්නට ඇත්නම් කොතරම් අගනේද? සහෝදරියන්ට කටපුරා 'අයියේ', 'මල්ලියේ' කියා ඇමතිය හැකි සහෝදරයෙකු ජනපති පුටුවේ වාඩි කරවන්නට කටයුතු කරන්නට හැකිනම් එය ඉතිහාසයේ අපි විඳින වෙනස්ම අත්දැකීම වනු ඇතිවාට සැක නැත.

ඉදින් ඒ අත්දැකීම විඳ ගන්නට අපට අවස්ථාව උදා වී තිබේ. ඇත රජරටින් බිහිවුන ගොවි පුතෙකු, දක්ෂ උගත් බුද්ධිමත් දේශපාලන දැනුමින් පරිපූර්ණ සහෝදරයෙකු ජනාධිපති අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වී තිබේ. ඒ ජාතික ජන බලවේගයේ අපේක්ෂකයා ලෙසිනි. ඒ, අපේ අනුර දිසානායක සහෝදරයාය. ධනපති කඳවුරුවලින් ඉදිරිපත් වන අනෙකුත් සියලු අපේක්ෂකයින් පරදවා දැවැන්ත දේශපාලන පෞරුෂයකට, උගත්කමට, බුද්ධියට, හිමිකම් කියන අනුර දිසානායක සහෝදරයා 2020 ජනාධිපති වනු දැකීම සිහිනයක් වනු නොදී යථාර්ථයක් බවට පත්කර ගැනීමේ වැඩිම වගකීම ඇත්තේ අපටම බව නැවත නැවතත් අවධාරණය කර ගත යුතුව තිබේ.

අන් සැමටම නැති විශාල හැකියාවක් කාන්තාවන් වන අපට උරුම වී තිබේ. ඒ යම් ආරංචියක් ඉතා ඉක්මනින් සන්නිවේදනය කිරීමේ හැකියාවයි. බොහෝවිට සමාජයේ පිරිමින් එය කාන්තාවන් අවමානයට පත්කරන්නට අවියක් කර ගත්තද, අප මේ ජනාධිපතිවරණයේදී ඔළුගෙඩි වෙනස් කිරීම සඳහා මෙය අවියක් කරගත යුතුව ඇත. ඒ නිසා කටින් කට දොරින් දොර, ගමින් ගම, අපේක්ෂාවේ අපේක්ෂකයා, පිළිබඳ සුභ පණිවිඩය රැගෙන යන්නට මේ ප්‍රබල සන්නිවේදන ක්‍රමය භාවිතා කළ යුතුය.

අනතුරුව එළඹෙන්නේ ඉල් මාසයයි. ලාංකේය භූමිය මත අධිෂ්ඨානයේ කැපකිරීමේ හා පරිත්‍යාගයේ මහඟු ආදර්ශයන් ඉතා ඉහළින් සනිටුහන් කළ ඉල් මාසයයි. තම දිවි පුදා ඒ විරු සොයුරු සොයුරියන් අපේක්ෂා කළ සමාජය ගොඩ නැගීම සඳහා එක් යෝධ පියවරක් ලෙස ජනාධිපතිවරණය ජයග්‍රහණය කරවීමේ කර්තව්‍යය පැවරී ඇත්තේද නොවැම්බර් මාසයටම වීම සුවිශේෂිය.

ඉතින් අපි ඒ සඳහා පෙළගැසෙමු. නොවැම්බර් 16වැනි දින ජනාධිපති සහෝදරයෙකු පත් කරන්නට පෙළගැසෙමු.

## ඉතින් එක්ව ජනපති සොයුරෙක් හදමු...!

රන්දා නෙතින් නෙත නොබිඳෙන සුබ ලකුණක්
බන්දා දොරින් දොර පිය දද සිය දහසක්
කැන්දා රළු බිමට සීතල දිය දහරක්
සින්දා රුපුන් බල, දල්වමු පහන් වැටක්

සනසති කලක සිට රජවුන එක් පවුලක්
වපුරති පුරන් බිම බොල් අස්වනු අහුරක්
වැනසෙති තවත් වෙනසක්, නොකළොත් කිසිවක්
ධනපති හිසට දෙමු අපි කුළුගෙඩි පහරක්

අටවා කුකුල් කොටු පෙන්නා සුරපුරයක්
පටවා දහක් බර, නොමැතිව ජීවිතයක්
රවටා වසර ගණනක්, සිදුකළ හරියක්
අවසන් කරමු අපි තව තක්කඩි යුගයක්

මුවින් මුව පුරා සිනහව බිඳ හරිමු
කෙලින් කර සිරස ගැති කම් සිඳ දාමු
වසන් නොකර එළිපිට ජයකොඩි බඳිමු
ඉතින් එක්ව ජනපති සොයුරෙක් හදමු

## සිව්දෙසින්





### කාන්තා හිංසනයට එරෙහිව

දහස් ගණනක් දකුණු අප්‍රිකානු කාන්තාවන් පසුගිය මාසයේ දී දැවැන්ත උද්ඝෝෂණක නිරත වූ අතර වර්ධනය වෙමින් පවතින කාන්තා හිංසනයට එරෙහිව ආණ්ඩුව විසින් පියවරක් නොගැනීම මෙයට හේතුව විය. නන් දෙසින් පැමිණි කාන්තාවන් කළු සහ දම් පැහැ වර්ණවලින් සැරසී කේප් ටවුන්හි පිහිටි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල දක්වා විරෝධතා පෙළපාලියකින් ගමන් කළේ අගෝස්තු මාසය තුළ ජීවිත අහිමි වූ කාන්තාවන් සැමරීම හා ආණ්ඩුවට විරෝධතාවය දැක්වීමක් වශයෙනි.

පසුගිය අගෝස්තු මාසය තුළ ස්වාමිපුරුෂයා අතින් ඝාතනයට ලක් වූ බිරින්දෑවරු සංඛ්‍යාව 30ක් වූ අතර එරට දිනකට කාන්තාවන් 137ක් ලිංගික අතවරවලට භාජනය වන බව වාර්තා වේ. විරෝධතාකරුවන්ගේ ඉල්ලීම වූයේ රට තුළ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත්කර මෙම තත්වය මැඩපැවැත්වීමට පියවර ගැනීමයි. 19 වියැති විශ්වවිද්‍යාල ශිෂ්‍යාවක් දූෂණය කොට මරා දැමීම කාන්තා හිංසනයට එරෙහි විරෝධතා රැල්ල ආරම්භ වීමට ආසන්න හේතුව සේ සැලකේ.

### ස්ත්‍රී දූෂණයට එරෙහිව ජපාන ජනතාව

ස්ත්‍රී දූෂණයන්ට එරෙහිව ලොව පුරා ක්‍රියාත්මක වන #Metoo ව්‍යාපාරයට සමගාමීව ජපාන ජනතාව වීදි බැස්සේ ස්ත්‍රී දූෂකයින් ආරක්ෂා කරන යල් පැන ගිය නීති වෙනස් කරන ලෙස බල කරමිනි. උදාහරණයක් වශයෙන් වයස අවුරුදු 13 සිට 19 දක්වා වරින් වර සිය දියණිය ලිංගික අතවරයට ලක් කළ පියෙකු නිදහස් කිරීමට එරට අධිකරණය තීරණය කර ඇත්තේ මෙලෙස නීතියේ ඇති යල් පැන ගිය ස්වභාවයේ ආදීනව හේතුවෙන් බව ඔවුහු පවසති.

මෙම තීන්දුව අභියාචනයට ලක් කොට ඇති අතර එයට සහයෝගයක් වශයෙන්ද මේ සම්බන්ධ ජපාන අපරාධ නීතිය වහාම වෙනස් කළ යුතු බව දක්වමින්ද විරෝධතා ක්‍රියාත්මක වේ.



'නීතිය විසින් ආරක්ෂා කළ යුත්තේ වින්දිතයා මිස පීඩකයා නොවේ' යන්න විරෝධතාවල තේමාව වෙයි. එසේම අත්සන් 47,000කින් යුත් පෙත්සමක්ද අධිකරණ අමාත්‍යංශයට භාර දී ඇත.

### තුර්කි කාන්තාවන් නිදහස ඉල්ලා අරගලයක





Femicide හෙවත් කාන්තාවන් වීම හේතුවෙන් ඝාතනයට ලක්වීම බහුලව දැකිය හැකි රටක් බවට තුර්කිය හඳුනාගත හැක. තුර්කි කාන්තාවන් නිවෙස් තුළ දී ස්වාමි පුරුෂයාගේ තාඩන පීඩනවලට ලක්වීම සාමාන්‍ය තත්වයක් බවට පත්ව තිබේ. මෑතකදී දස හැවිරිදි දැරිය ඉදිරිපිට ඇයගේ පියා විසින් මව ඝාතනය කිරීම තුර්කිය තුළ විරෝධතා රැල්ලක් ඇති කිරීමට සමත් විය.

' I don't want to die' හෙවත් මට මියයාමට අවශ්‍ය නැත යන්න මෙම විරෝධතාවල ප්‍රධාන සටන පාඨය විය. වසර ගණනක් තිස්සේ පවතින අරගල හා උත්සාහයන් හේතුවෙන් මේ වන විට කාන්තාවන්ට එරෙහි හිංසනයන්ට ලබා දෙන දඬුවම යම් තාක් දුරකට දැඩි වී ඇති බවද Femicide ඔප්පු වුවහොත් මරණ දඬුවම ලබාදිය හැකි තත්වයක් ඇති වී තිබෙන බවද වාර්තා වේ.

ඉතිහාසයේ කතාව... 14

# විද්‍යාව බිහිවීමේ ඓතිහාසික පදනම

ලෝකයේ පංති සමාජය බිහිවීමෙන් පසු ඇරඹි පෞද්ගලික දේපළ පදනම් කර ගත් හා හුවමාරු වෙළඳපොළ පදනම් කර ගත් නිෂ්පාදන ක්‍රියාවලියත් සමග දර්ශනය හා සමගාමීව විද්‍යාවද වර්ධනය විය. විද්‍යාව හා තාක්ෂණය ඉතිහාසය තුළ වර්ධනය වූයේ එකිනෙක හා අතිනත ගනිමිනි. මිනිසා සිය නිෂ්පාදන වුවමනාවන් සඳහා සොබා දහම මෙල්ලකර එය තම පරිභෝජන අවශ්‍යතාවයන් සඳහා යොදා ගැනීම වැඩිකිරීමත් සමග සොබා දහම ජය ගැනීමට මිනිසාගේ ඉන්ද්‍රියන් (දෑත් හා දෙපා) පමණක් ප්‍රමාණවත් නොවීය. මිනිසා යනු සත්ව ලෝකයේ ශරීර ශක්තිය අතින් දුර්වල සත්වයෙකි. ඔහුට විශාල බර උසුලාගෙන යාමට, වේගයෙන් දිගු දුරක් දිවීමට, දිගු දුරක් ජලයේ පිහිනීමට, අහසින් යාමට හැකියාව නොවීය. එහෙත් ඔහුට ඒ සියල්ල අතර චින්තන ශක්තිය ඇති තාර්කික ගුණය ඇති ඉන්ද්‍රිය වන මොළයක් තිබුණි. මේ තත්වය මත මිනිසා තම ශරීර ශක්තියේ හා හැකියාවේ සීමා අභිබවා ගියේ උපකරණ නිෂ්පාදනය කර ගැනීමෙනි. ඒ සඳහා තාක්ෂණය අවශ්‍ය වූ අතර විද්‍යාත්මක දැනුම ද අවශ්‍ය විය. එබැවින් අප ජීවත්වන සමාජයේ ඉතිහාසය සිට සොයාගත් විද්‍යාත්මක දැනුම හා තාක්ෂණික උපකරණ යනු හුදු පුද්ගල දක්ෂතා මත හෝ අහම්බ හේතු මත නිර්මාණය වූ දේවල් නොව ඒ ඒ මොහොතේ සමාජමය නිෂ්පාදනයේ අවශ්‍යතාවයට අනුව නිපදවන ලද දේවල්ය.



"එහෙත් වෙළඳපොළවල් නොනැවතී වැඩෙන්නට වූ අතර ඉල්ලුමද එන්ට එන්ටම වැඩිවිය. හස්තෝපක්‍රම කර්මාන්තයට පවා එම ඉල්ලුම සපුරාලීමට තවදුරටත් නොහැකි විය. එවිට වාෂ්ප සහ යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ විසින් කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනයේ විප්ලවයක් ඇති විණි. හස්තෝපක්‍රම කර්මාන්තය වෙනුවට නවීන මහා පරිමාණ යෝධමය කර්මාන්තය ඇති විය."

**මාක්ස් එංගල්ස්**

**කො.ප. ප්‍රකාශනය,**

**35 පිටුව**

### විද්‍යාවේ පදනම කුමක්ද?

විද්‍යාව යනු බාහිර බලවේග යක් විසින් මිනිසා වෙත ලබා දුන් දෙයක් නොවේ. විද්‍යාත්මක දැනුම බිහිවූයේ මිනිසාගේ මොළයේ රසායනික ක්‍රියාකාරිත්වය මතය. ඔහුගේ චින්තනය තුළය. ඒ සඳහා පදනම සකස් වූයේ අහම්බ සිදුවීම් නොව නිෂ්පාදන ක්‍රියාවලියේ අවශ්‍යතාවයන්ය. එබැවින් විද්‍යාවේ පදනම නිෂ්පාදනය වේ. නිෂ්පාදනය සඳහා, හුවමාරුව හා විදෙස් වෙළඳම සඳහා ඔහුට සොබා දහමේ අභියෝග රැසක් ජය ගත යුතු විය. විද්‍යාව හා තාක්ෂණික උපකරණ ඒ සඳහා මිනිසාට සහාය විය. මිනිසා තුළ විද්‍යාව නිර්මාණය වූයේ ඒ අනුවය.

පන්ති සමාජයට පෙර ප්‍රාථමික සමාජයේදී පවා විද්‍යාත්මක දැනුමේ මූලධර්ම මිනිසා නිෂ්පාදනයට යොදා ගත් අතර එලෙස යොදා ගත්තේ විද්‍යාත්මක අවබෝධ කර ගැනීමට වඩා ප්‍රායෝගික අත්දැකීම තුළය. ප්‍රාථමික සමාජයේ මිනිසා නිපදවූ දුන්න හා ඊතලය දියුණු උපකරණයක්, අවියක් විය. එහි ක්‍රියාකාරී මූලධර්මය වූයේ චලිතය හා ක්‍රියා හා ප්‍රතික්‍රියාය. සෑම ක්‍රියාවකටම ඊට සමාන හා ප්‍රතිවිරුද්ධ ප්‍රතික්‍රියාවක් ඇති බවත් පිටතින් බලයක් යෙදූවිට යම් වස්තුවක් චලනය කළ හැකි බවත් පසුකලෙක විද්‍යාත්මකව නිව්ටන් විසින් හෙළි කළද එම විද්‍යාව නොදැන පවා ඊට අනුව උපකරණ බිහිකර ගැනීම මිනිසා විසින් සිදුකර තිබුණි. ඒ, නිෂ්පාදනයේ අවශ්‍යතාවයන්ට අනුවය.

කෙසේ වෙතත් විද්‍යාව දැනුමක් ලෙස බිහිවී වර්ධනය වූයේ පන්ති සමාජය ඇරඹීමෙන් පසුවය. හුවමාරුව සඳහාත්, පසුව වෙළඳාම සඳහාත් වැඩි නිෂ්පාදනයක් අවශ්‍ය වීමත්, මිනිසාගේ අවශ්‍යතා පුළුල් වීමත් සමග ඒවා ඉටුකර ගැනීමේදී සොබා දහමේ ක්‍රියාකාරිත්වයේ රහස් හෙවත් සැබෑ හේතු සොයා ගැනීම අත්‍යාවශ්‍ය වූ අතර විද්‍යාව විසින් එය ඉටුකරන ලදී.

### විද්‍යාවේ පළමු සොයා ගැනීම්

විද්‍යාව හා විද්‍යාත්මක උපකරණවල සොයා ගැනීම් පරීක්ෂණය ක්‍රියාවලියක් ලෙස වර්ධනය වෙමින් තිබේ. ඒවා සරල ප්‍රාථමික අවස්ථාවේ සිට සංකීර්ණ දියුණු අවස්ථා දක්වා වර්ධනය වෙමින් පවතින අතර ඉදිරියටද වර්ධනය වේ. උදාහරණ ලෙස ගත් විට 17වැනි සියවසේ බිහිවූ නිව්ටෝනියානු භෞතිකවාදය පසුව අයිස්ටයින් විසින් වර්ධනය කළ අතර එය තවදුරටත් වර්ධනය වෙමින් පවතී.

විද්‍යාත්මක දියුණුවේ සොයා ගැනීම්වලට අමතරව තාක්ෂණය හා උපකරණ බිහිවීමද ඉතිහාසය තුළ අපූර්ව නිමාවකි. ලෝකයේ ගොඩබිම ගමනාගමනයට අත්‍යාවශ්‍යම උපරකරණයක් හෙවත් මෙවලමක්ව පවතින 'රෝදය' මිනිසාගේ විශිෂ්ට සොයා ගැනීමකි. ඈත අතීතයේ සිට භාණ්ඩ ප්‍රවාහනය හා මිනිසුන් ප්‍රවාහනය වේගවත් කිරීමේදී විශේෂයෙන්ම නූතන ඉතාම වේගවත් හා දියුණු ප්‍රවාහනයේ පරිණාමය වෙමින් ආ මෙවලම වූයේ රෝදයයි. රෝදය සොයා ගැනීම එකල විප්ලවීය සොයාගැනීමක් විය.

සමාන්‍යයෙන් රෝදය නිර්මාණය කර ගැනීමේ ගෞරවය හිමිවන්නේ ක්‍රි.පූ. 5000 - 6000 අතර කාලයේ පැවති මෙසපොටේමියානු (ඉරාන - ඉරාක) ශිෂ්ටාචාරයටය. විශාල ඉදිකිරීම් සඳහා බර වස්තූන් (ගල්, ලී කඳන්) ගෙනයාමේදී මතු වූ

> පාසල් අධ්‍යාපනයේදී සමහර විද්‍යාත්මක සොයා ගැනීම් පුද්ගල කේන්ද්‍ර හා අහම්බීය දේ ලෙස උගැන්වීම නිවැරදි නොවේ. උදාහරණයක් ලෙස ගුරුත්වාකර්ෂණය සොයා ගැනීම නිව්ටන්ගේ හිසමතට ඇපල් ගෙඩියක් වැටීම ලෙසට හෝ වාෂ්පබලය සොයා ගැනීම කේතලයේ පියන සෙලවීමේ හේතුව ලෙසට හෝ ඌණනය කිරීම වැරදිය.

දුෂ්කරතාවය ජය ගැනීම සඳහා නිපදවා ගත් මෙවලම වූයේ රෝදයයි. එය අද දක්වාම විකාශනය වෙමින් පැවත එන අතර එහි හැඩය වර්ගය කුමක් වුවත් එය රෝදයක් ලෙස පැවතීම විසින් රෝදයේ වැදගත්කම පැහැදිලි වේ.

### අඳුරු සමයේ විද්‍යාව

විද්‍යාව හා විද්‍යාත්මක උපකරණ විප්ලවීය ලෙස වර්ධනය වූයේ ධනවාදයේ බිහිවීමත් සමගය. එහෙත් ඉන් අදහස් වන්නේ ඊට පෙර විද්‍යාවක් නොතිබුණ බව නොවේ. එහෙත් යුරෝපයේදී ක්‍රිස්තියානිය රාජ්‍ය ආගම බවට පත්වීමෙන් පසු ඇරඹි අඳුරු යුගයේදී එනම් ක්‍රි.ව. 400 සිට 1400 දක්වා කාලයේදී විද්‍යාවට ලබා තිබුණේ නරක දසාවකි. ඒ, නව විද්‍යාත්මක සොයා ගැනීම් බයිබලයේ උගැන්වීම් සමග ගැටුණු විට එම විද්‍යාත්මක සොයා ගැනීම් ප්‍රතික්ෂේප කිරීමට හා විද්‍යාඥයන් පුළුස්සා මරා දැමීමට කතෝලික සභාව කටයුතු කළ නිසාය. 1474දී සූර්ය කේන්ද්‍රවාදය ඇතුළු විද්‍යාත්මක සොයා ගැනීම් රැසක් සිදු කළ නිකලස් කොපර්නිකස්ට පල්ලිය හරස් වූ අතර එම දැනුම යළි තහවුරු කිරීමට උත්සාහ කළ බෲනෝ පුළුස්සා මරා දැමීම සිදුවිය. එහෙත් මේ අතරම තාරකා විද්‍යාව විශ්වයේ බිහිවීම පිළිබඳව විද්‍යාත්මක සොයා ගැනීම් බාධා මැද සිදුවිය. කෙසේ වෙතත් මේ යුගය විද්‍යාවට අගුල් දැමූ යුගයක් විය.

### ධනවාදය හා විද්‍යාවේ විප්ලවය

විද්‍යාවේ ශීඝ්‍ර වර්ධනය හා විප්ලවීය සොයා ගැනීම් ඇතිවීම සිදුවන්නේ සමාජ ක්‍රමයක් ලෙස ධනවාදය බිහිවීමත් සමගය. ධනවාදය බිහිවූයේ ලාභය මුල්කරගෙන වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය පදනම් කර ගනිමිනි. එහිදී ලෝකයේ වෙළඳපොළ සඳහා මහා පරිමාණ නිෂ්පාදනයක්ද එම නිෂ්පාදනය සඳහා ලොව පුරා අමුද්‍රව්‍ය සොයා යාමේ අවශ්‍යතාවයක්ද මහා පරිමාණ නිෂ්පාදනය සඳහා උපකරණවල හා බලශක්තියේ අවශ්‍යතාව මතු විය. එම ධනවාදී නිෂ්පාදනයේ වුවමනා සැපිරීම සඳහා ගත් උත්සාහයේදී විද්‍යාවත් තාක්ෂණය හා උපකරණත් වර්ධනය විය.

එංගලන්තය පදනම් කර ගනිමින් 1770 ගණන්වල බිහිවූ පළමු කාර්මික විප්ලවය මීට නිදසුනකි. පළමු කාර්මික විප්ලවයේ විප්ලවීය සොයා ගැනීම වූයේ වාෂ්ප බලය බලශක්තියක් ලෙස යොදා ගැනීමය. 1776දී ජේම්ස් වොට් නිපදවූ වාෂ්ප ඇන්ජිම එහි ප්‍රතිඵලය විය. මේ වන විට 1687 කාලයේ නිව්ටන් විසින් ගුරුත්වාකර්ෂණය සොයාගෙන තිබුණි. එම දැනුමද පළමුවැනි කාර්මික විප්ලවයට දායක විය. ඉන්පසු කාර්මික ක්ෂේත්‍රයේ හා විද්‍යාවේ විප්ලවීය පිම් කීපයක් සිදු විය. ඒ සියල්ලේම පදනම වූයේ නිෂ්පාදනයේ අභියෝගවලට මුහුණදීම සඳහා ගත් උත්සාහයන්ය.

පාසල් අධ්‍යාපනයේදී සමහර විද්‍යාත්මක සොයා ගැනීම් පුද්ගල කේන්ද්‍ර හා අහම්බීය දේ ලෙස උගැන්වීම නිවැරදි නොවේ. උදාහරණයක් ලෙස ගුරුත්වාකර්ෂණය සොයා ගැනීම නිව්ටන්ගේ හිසමතට ඇපල් ගෙඩියක් වැටීම ලෙසට හෝ වාෂ්පබලය සොයා ගැනීම කේතලයේ පියන සෙලවීමේ හේතුව ලෙසට හෝ ඌණනය කිරීම වැරදිය. සැබැවින්ම මෙම සියලු විද්‍යාත්මක සොයාගැනීම්වල පදනම හා හේතුව වූයේ නිෂ්පාදන ක්‍රියාවලියය. ඉතිහාසය භෞතිකවාදී ලෙස අධ්‍යයනය කළ යුත්තේ මේ නිසාය.



# වගා වන්දි උදෙසා වන නොනිමි ගොවි අරගලය

අපේ රටේ ප්‍රධාන ආර්ථික ක්‍රියාවලිය කෘෂිකර්මාන්තයයි. එහෙත්, එය කෘෂිකර්මාන්තයක් (Agri Industry) ලෙස හැඳින්වුවද ඇත්තටම එයට 'කර්මාන්තයක්' ලෙස හැඳින්වීමටද නොහැකිය. කෘෂිකර්මාන්තයද ලාංකේය සමාජය මෙන්ම 'ඇට්ටකුණා' වූවකි. බහුජාතික සමාගම් මගින් ඒකාධිකාරයක් ගොඩ නගාගත් බීජ හා කෘෂි රසායන භාවිතා කළද වගාවේ සාර්ථකභාවයට සොබාදහමේ බලපෑම එනම් අව්ව, වැස්ස වැනි බාහිර සාධකයන් මත තීන්දු වන තත්වයක් තවදුරටත් පවතී. එබැවින් නූතන ලක්ෂණ සහිත වුවද එය කර්මාන්තයක් බවට පත්වී නොමැත. මේ තත්වය තුළ බොහෝවිට ගොවීන්ට තම වගාව විනාශවීම හේතුවෙන් ජීවත්වීමට සාධාරණ වගා වන්දි ඉල්ලා සිටීමට නිරන්තරයෙන් සිදුව තිබේ.

ඉතිහාසය පුරාවට විනාශ වූ වගාවට වන්දි ඉල්ලා සමස්ත ලංකා ගොවිජන සම්මේලනයත්, ගොවි ජනතාවත් වගා වන්දි ඉල්ලා බොහෝ අරගල දියත්කොට ඇති අතර ඒවායින් ලබාගත් සාධනීය ජයග්‍රහණ බොහෝය. මේ දිනවල ගොවි ජනතාව පාර්ශ්වයෙන් වගා වන්දි අරගලයක් පැන නැගී ඇති අතර ආණ්ඩුව පැත්තෙන්ද තමන් වගා වන්දි ගෙවමින් ඉතිහාසයේ වැඩිම වගා වන්දි ගෙවූ ආණ්ඩුව ලෙසද මාධ්‍ය සංදර්ශන පවත්වයි. ගොවි ජනතාවගේ හඬට තමන් ඇහුම්කන් දෙනවායයි පවසන ආණ්ඩුව සැබෑ ලෙසම ගොවි ජනතාවගේ වගා වන්දි ලබාදීම වෙනුවෙන් අනුගමනය කරන සැබෑ ප්‍රතිපත්තිය කුමක්දැයි හඳුනාගතයුතුය. එනම් මේ සැබෑ තත්වය කුමක්ද ?

මේ දිනවල ගොවි ජනතාව ඉල්ලන වගා වන්දි වර්ග කිහිපයකි.

සේනා දළඹු වන්දි




1. සේනා දළඹු වගා හානි වන්දි

| දිස්ත්‍රික්කය | ගොවි පවුල් ප්‍රමාණය | වන්දි මුදල | ගෙවා ඇති මුදල | හිඟ මුදල |
|---|---|---|---|---|
| අම්පාර | 12,995 | මිලියන 211 | මිලියන 72 | මිලියන 139 |
| මොනරාගල | 12,254 | මිලියන 208.6 | මිලියන 97.7 | මිලියන 110.9 |
| වෙනත් | | මිලියන 169.4 | - | මිලියන 169.4 |
| එකතුව | | මිලියන 589 | මිලියන 169.7 | මිලියන 419.6 |

සම්බන්ධයෙන් 2019.09.25 දින සමස්ත ලංකා ගොවි ජන සම්මේලනය හා කෘෂිකර්ම අමාත්‍යවරයා අතර සාකච්ඡාවේදී නිලධාරීන් විසින් ලබාදුන් දත්තය. සේනා දළඹුවා හානි හානි කරන ලද්දේ බඩඉරිඟු වගාවටය. එය ප්‍රධාන වශයන් අම්පාර, මොනරාගල දිස්ත්‍රික්කවලට සිදුවූ අතර පොළොන්නරුව, අනුරාධපුර ඇතුළු දිස්ත්‍රික්ක කිහිපයකටද හානිය ව්‍යාප්ත විය. ආණ්ඩුව පුරසාරම් දොඩා මාධ්‍ය සංදර්ශන පවත්වා වන්දි ලබා දී ඇත්තේ මිලියන 169.7කි. අම්පාර දිස්ත්‍රික්කයේ පමණක් තවත් ගොවි පවුල් 12,995ක් තමන්ට හිමි වන්දි බලා පොරොත්තුවෙන් සිටිති. ඒ මිලියන 211කි. මොනරාගල ගොවි පවුල් 12,254ක් තමන්ට හිමි වන්දි මුදල ලැබෙන තෙක් දින ගනිමින් හූල්ලමින් සිටිති. මෙය ලබා දීමට මහා භාණ්ඩාගාරය අනුමැතිය හිමි වුවද, ඒ සඳහා මුදල් නිකුත් කරන්නේ නැත. ගොවි පවුල් දහස් ගණනකගේ එදා වේල වෙනුවෙන් ඔවුන්ට හිමි සොච්චම් මුදල ලබා නොදෙන මෛත්‍රී - රනිල් ආණ්ඩුව විෂමාචාර ක්‍රියා හේතුවෙන් වැඩ තහනමට ලක් වූ යෝෂිත රාජපක්ෂට හිඟ වැටුප් සහිතව රැකියාවේ පිහිටුවන්නට ලහිලහියේ සූදානම් වේ. ඒ, අම්පාරේ මොනරාගල හේන් ගොවියාට වඩා රාජපක්ෂලා සමග තිබෙන පංති බැඳීම නිසාය.

2. වගා ණය වන්දි

මෙයින්ද කබලෙන් ලිපට වැටී ඇති ගොවින් 3000ක් පමණ අතර බහුතරය අම්පාර, මොනරාගල, ඇතිමලේ වැනි ප්‍රදේශවල බඩඉරිඟු ගොවීන්ය. එයට අමතරව දඹුල්ලේ ලොකු ළූණු ගොවින් ප්‍රමාණයක්ද මෙයට අයත්ය. මෙම ගොවින් ආණ්ඩුවත්, බැංකුවත් දෙපාරක් හමගසා ඇත. එනම් ගොවින් බැංකුවලින් වගා ණය ලබා ගන්නාවිට එම වගාව තුළ ඇති අවදානම හේතුවෙන් බැංකු හා කෘෂි රක්ෂණ මණ්ඩලය එක්ව රක්ෂණ ක්‍රමයක් අරඹා ඇත. ඒ අනුව ගොවියෙකු රුපියල් ලක්ෂයක් ණය මුදල ගන්නාවිට ඉන් 8% එනම් රුපියල් 8,000ක් රක්ෂණය සඳහා බැංකු කපා ගනී. ඒ වගාවට හානියක් වුවහොත් කෘෂි රක්ෂණ මණ්ඩලය වන්දි ගෙවීමට බැඳී සිටී. එහෙත් මේ වනවිට ගොවි පවුල් 3000ක් පමණ ගෙවී ගිය කන්නයේ වගා වන්දි ලබාග ැනීමට නිර්දේශ වී සිටියත්, ඉන් කිසිවෙකුටවත් මෙතෙක් රුපියලක් වත් කෘෂි රක්ෂණ මණ්ඩලයෙන් ලබා දී නොමැත. මෙහි ඇති අනිත් බේදවාචකය නම් අදාළ ණය දුන් බැංකුව සිය පොලිය හා වාරික අය කරන්නේ තමන් රඳවාගත් රක්ෂණ මුදලටත් අදාළව වීමය. එම ණය මුදල් නොගෙවන්නේ නම් ගොවියා ගෙනයන්නේ අධිකරණයටය.

මේ තත්වය තුළ ගොවියා පත් කොට ඇත්තේ අතිශය අසරණභාවයටය. 2019.09.25වැනි දින පැවති සාකච්ජාවේදී ඇමතිවරයා පොරොන්දු වන්නේ මෙම මුදල සතියක් තුළ ගෙවා අවසන් කරන බවය.

3. වී වගාවේ කීඩෑ හානියට වන්දි

ගංවතුර, නියඟ, වන අලි හානි වශයෙන් වගාවට සිදුවන හානි සඳහා කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය තුළ වන්දි ලබාදීමෙ ක්‍රමවේදයක් ඇත. එවැනි ක්‍රමවේදයක් තිබුණද ගොවීන්ට වන්දි ලබා දීමේදී එය ප්‍රමාණවත් නොමැත. එහෙත් කීඩෑ හානිය සඳහා ඒ තුළද වන්දි ආවරණ ක්‍රමයක් නොතිබුණි. එහෙත් පසුගිය කාලයේදී අතිරේක රුපියල් 200ක් අය කර වී ගොවින්ගේ කීඩෑ හානියටද වන්දි ආවරණයක් ලබා දී ඇත. එහි විශේෂත්වය වන්නේ විෂය බාර ඇමතිවරයාද එවැනි ක්‍රමවේදයක් ඇති බව නොදැන සිටීමය. මේ යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයට ලබා දිය යුතු වන්දි මුදල අති විශාලය. එහෙත් ගොවියාගෙන් අතිරේක මුදලක්ද අය කර ක්‍රියාත්මක කර ඇති මෙම රක්ෂණ ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබාදී ඇත්තේ මිලියන 80ක මුදලක් පමණකි.

මේ ආකාරයට පොදුවේ වගා වන්දි ලබා දෙන ලෙස අරගලයක් මතුව තිබුණද එහි අභ්‍යන්තර ගැටලුව සංකීර්ණය. ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල කුමක් සඳහන් වුවද, චක්‍රලේඛ තුළ කුමන වගන්ති තිබුණද ඒ සියල්ලෙහිම සඟවා ඇත්තේ පීඩාවට පත් ගොවි ජනතාව රැවටීමය; නොසලකාහැරීමය. ජන්ද කාලයට ජනතාවට අන්දන පාලකයන්ට අවශ්‍ය පරිදි ඇන්දෙන ගොවි ජනතාවක් වෙනුවට, තමන්ට මේ සිදුව ඇති විපතේ, රැවටීමේ සැබෑ වගඋත්තරකරුවන් හඳුනා ගන්නා සබුද්ධික ගොවි ජනතාවක් බිහිවන තුරු පාලකයන්ට මේ ක්‍රීඩාවේ යෙදිය හැකිය. ගොවි ජනතාව මෙම අවබෝධය ලබා ගැනීම ස්වයංව සිදුවන්නේ නැත. එවන් සබුද්ධික ගොවි ජනතාවක් බිහි කිරීම, සමස්ත ලංකා ගොවි ජන සම්මේලනය ඇතුළු පංති ව්‍යාපාරය ඉදිරියේ ඇති අභියෝගයයි.

ජන්ද්‍ර කාලයට ජනතාවට අන්දන පාලකයන්ට අවශ්‍ය පරිදි ඇන්දෙන ගොවි ජනතාවක් වෙනුවට, තමන්ට මේ සිදුව ඇති විපතේ, රැවටීමේ සැබෑ වගඋත්තරකරුවන් හඳුනා ගන්නා සබුද්ධික ගොවි ජනතාවක් බිහිවන තුරු පාලකයන්ට මේ ක්‍රීඩාවේ යෙදිය හැකිය. ගොවි ජනතාව මෙම අවබෝධය ලබා ගැනීම ස්වයංව සිදුවන්නේ නැත. එවන් සබුද්ධික ගොවි ජනතාවක් බිහි කිරීම, සමස්ත ලංකා ගොවි ජන සම්මේලනය ඇතුළු පංති ව්‍යාපාරය ඉදිරියේ ඇති අභියෝගයයි.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

සැප්තැම්බර් 03

# විශේෂ අධිකරණ ඉබි ගමනේ නිසා චූදිතයින් බඩපිනුම් ගහනවා

(අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම පිළිබඳ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් සහෝදරයා

අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය කාරණාවක්. විශේෂයෙන් අල්ලස් පනත සක්‍රීය කර, මහාධිකරණ ක්‍රියාවලිය හරහා අල්ලසට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට මෙවැනි සංශෝධන අත්‍යවශ්‍ය වෙනවා. ඒ පිළිබඳව විවාදයක් නැහැ. නමුත්, ක්‍රියා පටිපාටිය වෙනස් කිරීමෙන් පමණක් අධිකරණ පද්ධතියේ ක්‍රියාවලිය කාර්යක්ෂමව සිද්ධ වෙන්නේ නැහැ. ක්‍රියා පටිපාටිය වෙනස් කිරීම සඳහා පසුගිය කාලය පුරා යම් යම් සංශෝධන ගෙනාවා. අදත් මේ ඉදිරිපත් කර තිබෙන ගැසට් නිවේදනය අධිකරණ පද්ධතියේ ක්‍රියා පටිපාටිය වෙනස් කිරීම සඳහා වූ සංශෝධනයක්. මීට කලින් 2017 අංක 8 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධන පනත ගෙනාවා. එතැනදීත් සිද්ධ වුණේ ඒ ක්‍රියා පටිපාටියේ වෙනස් කිරීමක්. ඒක කළ යුතු දෙයක්. නමුත්, ඒ ක්‍රියා පටිපාටිය වෙනස් කළ පමණින් අධිකරන ක්‍රියාවලිය වේගවත් වුණේ නැහැ.

උදාහරණයක් විධියට අපි ගනිමු, විසිදෙනෙක් විතර ඉන්න බෙදුම් නඩුවක්. එම බෙදුම් නඩුවේ පාර්ශ්වකරුවන් විස්සක් ඉන්නවා. එක් බෙදුම්කරුවෙකු ඉදිරිපත් කරන මැනුම සමහර වෙලාවට අනෙක් බෙදුම්කරුවන් පිළිගන්නේ නැහැ. එවැනි තත්වයකදී නැවත ඉඩම් මැනුමකට යන්න වෙනවා. ඒ ඉඩම් මැනුම ඉදිරිපත් කළාම තවත් පාර්ශ්වකරුවෙකු ඒකට එකඟ වෙන්නේ නැහැ; ඒකට ඔහුගේ විරුද්ධත්වය පළ කරනවා. ඉතින්, විසිදෙනෙකුගේ බෙදුම් නඩුවක් උසාවියක අහලා ඉවර කරනකොට කොතරම් කාලයක් ගත වෙනවාද කියන එක අපට හිතා ගන්න පුළුවන්. මෙතැන ඇත්තටම ක්‍රියාපටිපාටිය වෙනස් කරනවා වාගේම, හරයාත්මක වෙනස් කිරීමක් කළ යුතුව තිබෙනවා. ඒ නිසා අධිකරණය පිළිබඳව අද රටේ ජනතාවගේ පැත්තෙන් නැගෙන මැසිවිල්ල තමයි, "අධිකරණ තිබෙනවා; නීති තිබෙනවා, නමුත් නඩු ඇසීම කල් යනවා. වසර ගණනක් ප්‍රමාද වෙනවා. අල්ලස් චෝදනා සම්බන්ධයෙන් තිබෙන නඩු පවා අවුරුදු ගණනක් දිග් ගැස්සෙනවා" කියන එක. සාමාන්‍යයෙන් අපේ රටේ සිවිල් නඩු තමයි දීර්ඝ කාලයක් අදෙන්නේ. අවුවරුදු විස්ස, තිහ පමණ කාලයකට සිවිල් නඩු දිග් ගැස්සෙනවා. සිවිල් නඩු දික්ගැස්සෙනවා වාගේම, අද මහාධිකරණවල අල්ලස් චෝදනා පිළිබඳව තිබෙන නඩුත් දිග්ගැස්සෙමින් තිබෙනවා.

විශේෂ මහාධිකරණ



පිහිටුවීම සඳහා වූ පනතක් මේ පාර්ලිමේන්තුවේ සම්මත කළා. ඒ පනත සම්මත කරලාත් දැන් වසර එකහමාරකට වැඩියි. ඒ පනතේ ඉතා පැහැදිලිව හා නිශ්චිතව තිබුණා. විශේෂ මහාධිකරණ තුනක් ස්ථාපිත කිරීම පිළිබඳව. නමුත් ආණ්ඩුව තවමත් අසමත් වෙලා තිබෙනවා. ඒ අධිකරණ තුන ස්ථාපිත කරන්න. අවුරුදු එකහමාරක් ගත වෙලත්, නීතිය තිබෙද්දීත් ආණ්ඩුවට බැරි වුණා නම් ඒ විශේෂ මහාධිකරණ තුන පිහිටුවන්න, ඒකෙන් පෙන්නුම් කරන්නේ මොකක්ද? ඒකෙන් පෙන්වන්නේ මේ අල්ලස් චෝදනා සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියා මාර්ග ගැනීම සඳහා ආණ්ඩුවට ඇත්ත වුවමනාවක් නැහැ, කියන එකයි.

අද ඩිජිටල්කරණය ඉහළට ගිහින් තිබෙන අවස්ථාවක, සිංගප්පූරුව, මැලේසියාව වාගේ අපට ආසන්නතම රටවල්වල පවා උසාවියේ නඩුව අහන මොහොතේ ඒ සාක්ෂි සටහන් ටික ඔක්කෝම voice recorder එකෙන් record කරලා emailsවලින් අදාළ පාර්ශ්වවලට යවනවා. ඒ අනුව නඩුකාරවරුන්ට ඉතා පහසු, කාර්යක්ෂම සේවාවක් ලබා දෙනවා. අපේ රටේ අපි තවම එතැනට ගිහිල්ලා නැහැ. තවම සමහර තැන්වල typewriter ඒකෙන් type කරනවා. එහෙම තත්ත්වයක් තුළ මේ අධිකරණ ක්‍රියාවලිය අපි වේගවත් කරන්නේ කොහොමද? ඒ සඳහා වෙන්කර තිබෙන මුදල් ප්‍රමාණය කොපමණද?

ආණ්ඩුව හැමදාම කෝටි ගණන්, මිලියන ගණන් සල්ලි නාස්ති කරනවා. නමුත් දූෂණය, වංචාව නැවැත්වීමට නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් ඉදිරිපත් කරන චෝදනා කඩිනමින් විභාග කළ යුතුව තිබෙනවා. ඒ සඳහා අධිකරණ පද්ධතිය ශක්තිමත් කරන්න තවම ආණ්ඩුව අසමත් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි විශේෂ මහාධිකරණයේත් නඩු කල් යන්නේ. විශේෂ මහාධිකරණය පිහිටෙව්වාට පසුව ජනතාවට ලොකු බලාපොරොත්තුවක් ආවා. දවස ගණනේ නඩු ටික අහලා අදාළ චූදිතයන්ට දඬුවම් දීලා, නීතිය හරියාකාරව ක්‍රියාත්මක වෙයි, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සාර්ථකව ඉස්සරහට යයි කියලා ජනතාව යම් බලාපොරොත්තුවක් ඇතිකර ගත්තා. නමුත් අද ඒ බලාපොරොත්තුව බිඳ වැටිලා තිබෙනවා. හැබැයි, විශේෂ අධිකරණයක් තවම ඉබි ගමනින් තමයි ඉස්සරහට යන්නේ. එහෙම වෙනකොට, චූදිතයෝ බඩපිනුම් ගහනවා. ඔවුන් ජනතාව ඉස්සරහට ඇවිල්ලා පුරාජේරු කියවනවා. එතකොට ඒ අයට තිබුණු චෝදනා ජනතාවටත් අමතක වෙලා යනවා. ඒක ආණ්ඩුවේ වැරැද්දක් මිසක්, අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ වැරැද්දක් නොවෙයි.

> විශේෂ මහාධිකරණය පිහිටෙව්වාට පසුව ජනතාවට ලොකු බලාපොරොත්තුවක් ආවා. දවස ගණනේ නඩු ටික අහලා අදාළ චූදිතයන්ට දඬුවම් දීලා, නීතිය හරියාකාරව ක්‍රියාත්මක වෙයි, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සාර්ථකව ඉස්සරහට යයි කියලා ජනතාව යම් බලාපොරොත්තුවක් ඇතිකර ගත්තා. නමුත් අද ඒ බලාපොරොත්තුව බිඳ වැටිලා තිබෙනවා. හැබැයි, විශේෂ අධිකරණයක් තවම ඉබි ගමනින් තමයි ඉස්සරහට යන්නේ. එහෙම වෙනකොට, චූදිතයෝ බඩපිනුම් ගහනවා. ඔවුන් ජනතාව ඉස්සරහට ඇවිල්ලා පුරාජේරු කියවනවා. එතකොට ඒ අයට තිබුණු චෝදනා ජනතාවටත් අමතක වෙලා යනවා. ඒක ආණ්ඩුවේ වැරැද්දක් මිසක්, අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ වැරැද්දක් නොවෙයි.

දැන් ආණ්ඩුව මහාධිකරණ විනිශ්චයකාරවරුන් ගැන කථා කළා. මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කරලා නැහැ. තවම අපේ රටේ මහාධිකරණ විනිශ්චයකාරවරුන් බොහෝ පිරිසක් තවත් උසාවිවල වැඩ බලනවා; උසාවි දෙක තුනක වැඩ කරනවා. ඒක ඉතා අමාරු වැඩක්. 15 වැනි පිටුවට

2019 සැප්තැම්බර් 04

# සංස්කෘතික උරුමයන් මිනිසුන්ගේ ජයග්‍රහණ ලෙස හඳුනාගන්න

(මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුදල් අයුතු ලෙස මුදා හැරීම පිළිබඳ කල්තැබීමේ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා

මා දන්නා තරමින්, නිල වශයෙන් අගමැතිවරයා තමයි මධ්‍යම සංස්කෘතික අරමුදලේ සභාපතිවරයා වෙන්නේ. අපි මුලින්ම කියන්නේ, ආණ්ඩුවට තිබෙන ලොකුම වගකීම තමයි, ආණ්ඩුවේ ඇමතිවරයෙකු කිව්ව ඒ කාරණය ප්‍රතික්ෂේප කරන එක. දැන් මේ සභාවේ ඉදිරිපත් වන කරුණු අනුවත් පැහැදිලි වන්නේ, අවුරුදු විසි ගණනක්, තිස් ගණනක් තිස්සේම බරපතළ විධියට සිද්ධවෙලා තිබෙන්නේ, ඒ පැවරුණු කාර්යය වෙනුවට වෙනත් කාර්යයන් කිරීම සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුදල් යොදාගෙන තිබෙනවා කියන කාරණයයි. ඒ ගැන ඕනෑ තරම් කරුණු කාරණා අපට කියන්න පුළුවන්. ඒ නිසා, ඇත්තටම අපි දකින පළමුවන දේ තමයි, ඒ ඉතිහාසයටම යන්න බැරි නම්, අඩු ගණනේ පසුගිය අවුරුදු 19 ගැනවත් සලකලා, අනිවාර්යයෙන්ම මේ අරමුදල පිළිබඳව පුළුල් විගණනයක් කළ යුතුයි කියන එක. එවැනි පුළුල් විගණනයක් කළාම මේවායේ තිබෙන සැබෑ තත්ත්වය එළියට එනවා.

එක්කෝ, මේ ප්‍රශ්නය සඤෂෘ එකට භාරදීලා අවුරුදු 10ක් හෝ අවුරුදු 15ක් තිස්සේ සිදුවූ දේවල් ගැන සොයන්න. එහෙම නැත්නම්, ඉතාම ඉක්මනින් විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඒ කටයුත්ත පවරන්න කියන ඉල්ලීම මා කරනවා. ඒ වාගේම මා ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව සොයන එක ඣජෑ එකට හෝ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මා හිතන හැටියට මෙයට අදාළ වන්නේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවයි පවරන්න කියලා.

මෙය දෛවයේ සරදමක් හැටියට මට දැනෙනවා. මේ පැමිණිල්ල කළා කියන්නේ, රවී කරුණානායක ඇමතිතුමා කියලායි ජනමාධ්‍ය වාර්තා කරන්නේ. මාත් සාමාජිකයෙකු වශයෙන් සිටි COPE එකේදි, ශ්‍රී ලංකා මහ බැංකු වංචාව සම්බන්ධයෙන් ප්‍රධාන චෝදනාවට ලක්වූ කෙනෙක් තමයි, එතුමා. මේ චෝදනාව ඉදිරිපත් කළේ එතුමා කියලා තමයි පුවත්පත් වාර්තා කරන්නේ. දෛවයේ සරදමේ අනික් කථාව තමයි, ශ්‍රී ලංකා මහබැංකු වංචාව ආරක්ෂා කරමින් පොත් ලියූ අය අද ඒ පැමිණිල්ලට විරුද්ධව කතා කිරීම ඇත්තටම, මේ රටේ ජනතාව තේරුම් ගත යුතුයි. මේ කරන දේශපාලන සූදුව මොකක්ද කියලා. මගේ අදහස මේකයි. අගමැතිවරයා විසින් පත් කරන කමිටු නම්, සාමාන්‍යයෙන්



ප්‍රශ්න කල් දැමීමට පමණක් පත්කරන ඒවා විතරයි නේ. ඒ කමිටු එපමණ වැදගත් කමක් නැහැ. අපි කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ ප්‍රශ්නය අනිවාර්යයෙන්ම COPE එකට හෝ අදාළ COPA එකට ඉදිරිපත් කරන්න කියලා.

අද අපේ රටේ පුරාවිද්‍යා ස්ථානවල හෝ පූජනීය ස්ථානවල විශාල සංස්කෘතික ගැටලු තිබෙනවා. අවුරුදු 2500කට කලින් ඒවා අපේ විශිෂ්ටත්වය, හැකියාව නිරූපණය කරන මධ්‍යස්ථාන වුණාට, අද අපත් ඇතුළුව ඒවාට යන ජනතාවගේ, ඒවාට යන දේශපාලනඥයන්ගේ ඉතාම අසංස්කෘතික හැසිරීමක් තමයි තිබෙන්නේ. ඉතාම ඉහළ සංස්කෘතික මධ්‍යස්ථාන ලෙස සලකන ස්ථානවලදී අපේ ජනතාවගේ හැසිරීම ගත්තොත්, ඒක අවුරුදු 3000කට කලින් තිබුණු හැසිරීමක් වාගේ තමයි පෙනෙන්නේ. අපි ළඟදි මහියංගනය පන්සල බලන්න ගියා. ඇත්තටම, එතැන තිබුණු තත්වය මොකක්ද දන්නවාද? බුදු හාමුදුරුවෝ ආයෙත් ලංකාවට වැඩියොත්, ස්ථිරවම එතැනට නම් ආපහු වඩින එකක් නැහැ. මම කියන්නේ ඒ පන්සලේ තිබෙන අවුලක් ගැන නොවෙයි. ඒ පන්සල පිහිටි භූමිය අන්තිම අපිරිසිදු වෙලා, පොලිතීන්, ප්ලාස්ටික්, අරවා මේවා ඔක්කෝම එතැන තිබෙනවා. මම මේ මහියංගනය විහාරස්ථානය ගැන විශේෂ විවේචනයක් කරනවා නොවෙයි. අපේ බොහෝ බෞද්ධ විහාරස්ථානවලට ගියත්, කෝවිල්වලට ගියත්, පල්ලිවලට ගියත් අපට දකින්න පුළුවන්, එම ස්ථාන ප්ලාස්ටික් සහ පොලිතින් උවදුරට විශාල ලෙස ගොදුරු වෙලා තිබෙන බව.

ශ්‍රී පාදස්ථානය දිහා බලන්න. විවිධ ආගම්වලට අයත් පිරිස් දහස් ගණනින් ඒ පූජනීය ස්ථානයට යනවා. ඒ ප්‍රදේශය, ප්ලාස්ටික් සහ පොලිතින් නිසා සම්පූර්ණයෙන්ම විනාශ වෙලායි තිබෙන්නේ. මම ඉල්ලා සිටිනවා, ලෝක උරුම ලෙස නම් කර තිබෙන ප්‍රධාන සංස්කෘතික ස්ථානවලට මේ ප්ලාස්ටික් සහ පොලිතින් ගෙන යෑම තහනම් කරන්න කියලා. එහෙම තහනම් කරන්නේ මිනිසුන්ට දඩ ගහන්න නොවෙයි නේ. හැතැප්මක් විතර ගියාට පස්සේ බෑග් අරගෙන එන්න කියලා මිනිසුන්ට harass කරන්නේ නැතිව, ටිකට් ගන්න තැන්වලදීම, පරීක්ෂා කරන තැන්වලදීම ඒ පොලිතින්, ප්ලාස්ටික් අරගන්න. එහෙම අරගෙන, ඔවුන්ට එතැනදීම කඩදාසි බෑග් එකක් දෙන්න, ඒ අයගේ දේවල් ගෙනයන්න. අඩුම තරමින් එවැනි දෙයක්වත් කරන්න.

පුරාවිද්‍යාත්මක ස්ථාන රාශියක් අපේ රටේ තිබෙනවා. ඒවා සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂා කළ යුතු ස්ථාන. නමුත් ඒ ස්ථාන සියල්ලම ආරක්ෂා කරන්න තරම් සම්පත් අපේ රටට නැහැ. ඒකත් ඇත්ත ප්‍රශ්නයක්. නමුත්, මෙම ස්ථානවල තිබෙන වැදගත්කම මොකක්ද කියලා සාමාන්‍ය දරුවෙකුට, සාමාන්‍ය මනුෂ්‍යයෙකුට දැනගැනීමේ හැකියාව මෙවැනි ස්ථාන කීයක තිබෙනවාද? මේ බොහෝ තැන්වල යකඩවලින් තනන ලද බෝඩ් එකක ගහලා තිබෙනවා, "මේක පුරාවිද්‍යා ස්ථානයක්" කියලා. ඒකේ තිබෙන්නේ, ඒ ස්ථානවලට හානි කිරීම පුරාවිද්‍යා නීතිය අනුව දඬුවම් ලැබිය හැකි වරදක් කියන එක විතරයි. එහෙම නැතිව මේක හැදුවේ කවුද, මෙහි වැදගත්කම මොකක්ද කියන එක පිළිබඳව එක වාක්‍ය 10ක්වත් මේ කිසිම ස්ථානයක ලියා තබලා නැහැ. අනුරාධපුරයේ මධ්‍යම සංස්කෘති අරමුදල යටතේ තිබෙන ස්ථානවලත් එහෙම සඳහනක් කරලා 15 වැනි පිටුවට

> "හැමදාම, මිනිස්සු සිය දහස් ගණනින් අනුරාධපුරයට යනවා. පුරුද්දට, ඔහේ යන්නන් වාලේ යනවා මිසක්, ඒ අයට ඒ ස්ථාන ගැන දැනුමක් තිබෙනවාද? නමුත්, ඒ අතරේදී අපට මිනිසුන්ට යම් දෙයක් දිය හැකියි. අඩුම තරමින් ප්‍රධාන සංස්කෘතික මධ්‍යස්ථානවලවත් යම් පුවරුවක් හදලා, මිනිසුන්ට විනාඩි දෙක තුනකින් බලා ගන්න පුළුවන් වෙන විධියට එම ස්ථානය ගැන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් යම් විස්තරයක් ඇතුළත් කර තැබිය යුතුයි"

කවුළුව හැරීම් තබමි

# රෙදි ඇඳගෙන අමු හෙළුවෙන්...

කෝප් කමිටු ප්‍රශ්න කිරීම් හා හෙළිදරව් කිරීම් ඉදිරියේ මේ දිනවල දේශපාලුවන්ගේ හා රාජ්‍ය උසස් නිලධාරීන්ගේ කෙරුවාවල් වැල නොකැඩී හෙළිදරව් වෙමින් තිබේ. ඔවුන්ගේ රෙදි එකින් එක ගැලවී යන අතර ඒ දෙස බලා සිටීම පවා මහත් අපුල දනවන කාරණයක් බවට පත්වී ඇත. ටයිකෝට් දමාගෙන විත් මේ පල්හෝරුන් නාන නැම දුටුවිට ඔවුන්ට අනුබල දුන් දේශපාලුවන්ගේද මුඛ සහ අධෝමුඛ දෙකම ගල්වී යනු ඇත. විලි ලැජ්ජාවක් ගෑවිලාවත් තිබේ නම් අඩුම තරමේ මේ සාපරාධී හොරකම්වලට හවුල් වූ දේශපාලුවන් හා ඔවුන්ගේ ආවතේවකරුවන් බවට පත්වූ මේ අම්බරු නිලධාරීන් මුළු රටෙන්ම ප්‍රසිද්ධියේ සමාව ගත යුතුය.

කෝප් කමිටුවට කළ හැක්කේ මේ ජනතා මුදල් සිතූසේ ගසා කෑ පල්හෝරුන් හෙළිදරව් කිරීම පමණි. ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම රජය සහ අධිකරණය සතු වගකීමකි. එහෙත් රටක බලය මං පහරන්නන් පිරිසකට භාරදී ඇති තතු යටතේ මේ පල්හෝරුන්ට නම් අබමල් රේණුවකවත් සීරීමක් පළුද්දක් නොවනු ඇත. මේ සියල්ලටම වන්දි ගෙවීමට සිදුවන්නේ රටේ ජනතාවටය.



කෝප් සභාපති හඳුන්නෙත්ති සහෝදරයාගේ බලවත් ප්‍රයත්නය පිට දැන් මේ හොරකම් හා හොරු සියල්ලම මුළු රටටම දැනගත හැකිවී තිබේ. කෝප් කමිටුවේ සමහර පක්ෂවල දේශපාලුවන් තම ජාම බේරා ගැනීමට පමණක් සිනිඳුවට ප්‍රශ්න කරන විට ඔවුන්ගේ තරාතිරමද රටට දැන් හෙළිදරව් වී හමාරය.

හඳුන් සහෝදරයාගේ කාර්යභාරය ගැන දැන් බොහෝ තැන්වලින් ප්‍රශංසා ගලාඒමට පටන් ගෙන ඇත. මේ සියල්ල තුළ ගම්‍ය වන්නේ වංචා නැතිව රට ගොඩනැගීමට නම් එහි පාලනය භාරදිය යුත්තේ කවුරුන්ටද යන්න නොවේද?

# ඇමෙරිකානු බඩු ගැන කියන අපූරු බඩ්ඩ



ගෝඨා වෙනුවෙන් නිදි වරාගෙන කඩේ යන මලයාට මේ දිනවල එකසිය ගණන් මලපැනලාය. වසුරු ගොඩවල්වල වෙස් නැටුම් නටා මනා පරිචයක් ලබා ඇති මේ මලයාට මුළු ඇමෙරිකාවම පොළොවට සමතලා කරන අන්දමේ කෝපාග්නියක් මේ දිනවල ඇතිවී තිබේ. ඒ ඇමෙරිකන්කාරයින් කිහිපදෙනෙක් රේගුවටද පාට්එක දමා සූට්කේස් වගයක් කිසිදු පරීක්ෂාවකින් තොරව නිදැල්ලේ රට තුළට ගෙනඒම පිළිබඳවය. දැන් ඔහුගේ අධිරාජ්‍ය විරෝධී මෙහෙයුම වී ඇත්තේ එම බඩු ගැන සොයා නොබැලූ රේගු නිලධාරීන්ට හා දේශපාලන බලවතුන්ට විරුද්ධවය.

පොහොට්ටුවේ ප්‍රබලයන් ඉදිරියේ තබාගෙන පැවැත්වූ සමුළුවකදී ඔහු මේ ගැන පොළොවේ පස් කමින් බෙරිහන් දෙන අන්දම පසුගියදා රූපවාහිනී නාලිකාවලින්ද රටේ ජනයාට නැරඹීමට හැකිවිය.

මෙහිදී ජනයාට මතුවන උභතෝකෝටික ගැටලුව නම් පොහොට්ටුවේ ඇමෙරිකානු පුරවැසි ප්‍රබල බඩු දෙකක්ම ඉදිරියේ තබාගෙන ඔවුන්ට රටේ පාලන බලය ලබාදෙන ලෙස ඉල්ලමින් ඇමෙරිකානු බඩු ගැන මාරාවේශ විරෝධයක් පෑමය. රටට වින කටින, සියලු "බඩුවලට" ජනයා විරෝධය පෑ යුතුය. ඒ ගැන කිසිදු ප්‍රශ්නයක් නැත. ඒත් ප්‍රශ්නය වන්නේ ඔරිජිනල් ඇමෙරිකානු බඩු දෙකක් ඉදිරියේ තබාගෙන ඔවුන්ට බලය දෙන ලෙස රටෙන් ඉල්ලා සිටීමය.


මේ පුබ්බරුවන් වීරයන්ට අඳින කාලයයි. මෙවර ජනාධිපතිවරණයේදීවත් මේ දේශපාලන පුබ්බරුවන් නිරුවත් කිරීමට රටේ ජනයා තීන්දු කරයි නම් එය රටේම භාග්‍යයකි. සියොළඟ තවරාගෙන වසුරු බුදීමට ඔවුන්ට ඉඩදී රටේ අනාගතයට ඉඩක් පාදා ගැනීමට මෙතැනදීවත් පෙරට ඒමට රටේ ජනයාට මොළය පෑදේවායි අපි ඉතසිතින්ම ප්‍රාර්ථනය කරමු.

# ඇත්ත භූතයින් කවුදැයි පෙන්වා දුන් කාලෝ

ශ්‍රී ට සති කිහිපයකට පෙර කාලෝ ෆොන්සේකා නම් මානවවාදී වාමාංශිකයා අපෙන් සමුගත්තේය. ඔහුගේ විශේෂත්වය නම් ඔහු වාමාංශිකයෙකු පමණක් නොව උසස් මානවවාදියෙකුද වීමය. ලාංකේය සමාජයට උරුම වී ඇති ජාන ගතිය අනුව රට නොදත් ඔහුගේ මානව ගුණයන් එළියට ආවේ ඔහු මිය ගිය පසුය.

සමස්ත ලාංකේය සමාජයම වෙළාගෙන ඇති මිත්‍යාවට එරෙහිව ඔහු දුන් ප්‍රහාරය ඔහු නොමියෙන මිනිසකු බවට පත්වීමට ප්‍රමාණවත්ය. ආචාර්ය ඒබ්‍රහම් ටී. කොවූර් සමග එක්වී මීට කලකට ඉහත සමාජය වෙළාගත් දැඩි මිථ්‍යා මතිමතාන්තරවලට ඔහු දුන් අති ප්‍රබල ප්‍රහාරය හමුවේ මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ හා ඒවා පතුරුවන්නන්ගේ දැඩි වෛරයට පාත්‍රවීම හා ඔවුන් බියට පත්වීමම කාලෝට ගෞරව පිණිස වන්නේය.

භෞතිකවාදයත්, මානවවාදයත්, වෛද්‍ය විද්‍යාවත් මේ සියල්ල සමාජ සංවර්ධනය වෙනුවෙන් යොදාගත යුතු බව අවධාරණය කරමින් ඔහු ගෙනගිය අරගලය වඩ වඩා උත්කෘෂ්ඨයට පත්වන්නේ මෙවැනි ජරපත් සමාජයක සිට උඩුගං බලා පිහිනීමට නම් දැඩි ආත්ම ශක්තියක්, එඩියක්, සවියක් මිනිසෙකු තුළ අනිවාර්යයෙන්ම පිහිටිය යුතු නිසාවෙනි. ඔහු අඩුපාඩු නැත්තකු නොවේ. කාටත් පොදු දේ ඔහුටද තිබුණි. එහෙත් එම අඩුපාඩුවලින් ඔහු කළ යුතු මෙහෙවර කිසිදා ආපස්සට ඇද දැමිය නොහැක. කාලෝ, ඔබට අපේ ආචාරය...!



# මේ රට හදන්න බැරිනම් හදන්න රටක් නැහැ

## ජාතික ජන බලවේගයේ ජනාධිපතිධුර අපේක්ෂක අනුර කුමාර දිසානායක සහෝදරයා




ශ්‍රී ලංකාවට තවදුරටත් පවතින ආකාරයෙන් ඉදිරියට යා නොහැකි බවත් රටේ ගමන නව දිශාවකට යොමු කළ යුතු බවත් ප්‍රකාශ කළ ජාතික ජන බලවේගයේ ජනාධිපතිධුර අපේක්ෂක අනුර දිසානායක සහෝදරයා තමන් සහතික වශයෙන්ම රට සෞභාග්‍යයේ මාවතට ගෙන යන බවට පොරොන්දු වන බව අවධාරණය කළේය. "මේ රට හදන්න බැරිනම් හදන්න රටක් නැහැ. අප මේ රටේ වැඩකරන ජනතාවට ආයාචනය කරන්නේ මේ රට ගොඩනගන මාවතට එකතු වන ලෙසයි." අනුර දිසානායක සහෝදරයා මේ ආරාධනය කළේ පසුගිය 12වැනි දින කොළඹ සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණයේ පැවති වැඩකරන ජනතා සමුළුව අමතමිනි.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"සාමාන්‍යයෙන් මැතිවරණයකදී අපේක්ෂා කරන්නේ එලඹෙන වසර පහක කාලය සඳහා රටේ පාලනය සඳහා තෝරා ගන්නේ කවර කණ්ඩායමද යන්න තීරණය කර ගැනීමයි. නමුත් අපේ රටේ ජනතාව මීට පෙර අවස්ථාවලදී ඒ සඳහා හොඳම තෝරා ගැනීම සිදුකර ගැනීමට අසමත්ව තිබෙනවා. ඔවුන් තෝරා ගත් නායකයින්, කණ්ඩායම් රට ගෙනගොස් තිබෙන්නේ විනාශකාරී අන්තයකටයි. මේ රටට තවදුරටත් ඒ විනාශය අත්වීමට ඉඩ දිය යුතු නැහැ. අප විසින් මේ රට භාරගත යුතුයි. මේ රට හැදිය හැකි රටක්. රටක් ගොඩනැගීම සඳහා මැජික්කරුවෙකු නැහැ. රට ගොඩනැගීම තනි පුද්ගලයෙකුගේ ඉන්ද්‍රජාලික ක්‍රියාවලියක් නෙමෙයි; සාමූහික ක්‍රියාවලියක්. ලොව සෑම රාජ්‍යයක්ම ගොඩනගා තිබෙන්නේ සාමූහික ක්‍රියාවලියක් තුළයි. රටට නායකත්වය දෙන අදූෂිත දේශපාලනයේ, රට ගොඩනගන දැනුම ලබාදෙන වෘත්තීයවේදීන්ගේ සහ රට මෙහෙය වන වැඩකරන ජනතාවගේ මැදිහත්වීම ඊට අවශ්‍යයි.

මේ රටේ ධනය නිෂ්පාදනය කරන්නේ ඔබයි; වැඩකරන ජනතාවයි. වාර්ෂිකව ඇ.ඩො. බිලියන 88ක ධනයක් ඔබ විසින් නිෂ්පාදනය කරනවා. මේ ධනය උත්පාදනය වන්නේ වැඩකරන ජනතාව හෙළන ශ්‍රමයෙනුයි. මේ රටේ ජාතික ධනය නිෂ්පාදනය කිරීමේ ගෞරවනීය කොටස්කරුවන් ඔබයි. රට ගොඩනැගීම සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා වතු ක්ෂේත්‍රය නියෝජනය කරන වැඩකරන ජනතාව වැඩ කරන්නේ දේශපාලන නායකත්වය විසින් සකස් කරන සැලැස්මකට අනුවයි. නමුත් මෙතෙක් රටේ දේශපාලන නායකත්වය විසින් මේ රාජ්‍ය ආයතන පද්ධතිය විනාශ කරනු ලැබ තිබෙනවා. 2018 වසරේ විදුලිබල මණ්ඩලයේ පාඩුව රු. මිලියන 29,000යි, තෙල් සංස්ථාවේ පාඩුව මිලියන 10,400යි, ජලසම්පාදන මණ්ඩලයේ පාඩුව මිලියන 598යි, එයාර්ලංකා පාඩුව මිලියන 17,000යි, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ පාඩුව මිලියන 1024යි, මිල්කෝ ආයතනයේ පාඩුව මිලියන 670යි, අයිටීඑන් පාඩුව මිලියන 327යි, සතොස පාඩුව මිලියන 2000යි, රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ පාඩුව මිලියන 406යි.

සැබැවින්ම මෙසේ වී තිබෙන්නේ දේශපාලන නායකත්වයේ වැරදි තීන්දු තීරණ නිසයි. අර්ධ රාජ්‍ය ආයතන පාඩු ලබද්දී මෙතෙක් පැවති ආණ්ඩු විසින් කළේ එම ආයතන ඇවර කිරීමයි. මෙම තත්වය අපි නිසැක ලෙසම නතර කරනවා. මෙම රාජ්‍ය ආයතන නිවැරදි කළමනාකාරිත්වයක් අතට පත් කළ යුතුයි. මිල්කෝ ආයතනය අපේ යටතට පත් වන විට රු. මිලියන 500ක බැංකු ණය අයිරාවක් පැවතියා. එහෙත් අප ආණ්ඩුවෙන් ඉවත් වන විට රු. මිලියන 200ක ස්ථාවර තැන්පතුවක් එම ආයතනයට තිබුණා. දේශපාලන හිතවත්කම්වලට, ඥාතිකම්වලට තනතුරු භාරදීම අවසන් කළ යුතුයි. දැන් අර්ධ රාජ්‍ය ආයතන දේශපාලන පත්වීම්වලින් පුරවන ස්ථාන බවට පත් කරනු ලැබ තිබෙනවා. ඇමතිවරුන් විවිධ මිලදී ගැනීම් හා ඉදිකිරීම් මගින් විශාල මුදලක් හොරකම් කරනවා. මෙම තත්වය නතර කළ යුතුයි.


වැඩකරන ජනතාවට තෘප්තිමත්ව සේවය කළ හැකි ආකාරයට, වැඩිවන ජීවන අංකයට ගැලපෙන වැටුප් වැඩිවීමක් ලැබෙන පරිදි නීති සංශෝධනය කරනවා. වැඩකරන ජනතාව පෙළන මැන්පවර් වහල් වෙළඳාම නතර කිරීමටත් ස්ථිර පත්වීම් කොන්ත්‍රාත් පදනමින් පිරවීම නතර කිරීමටත් පියවර ගන්නවා. උපාධිධාරීන් රාජ්‍ය සේවය තුළ ඵලදායී ලෙස සේවයේ නියුක්ත කරවීමට කටයුතු කරනවා. කම්කරු ජනතාවට ජීවත්වීමට සරිසන වැටුපක් සහතික කිරීමටත් ඔවුන්ට යහපත් ජීවන තත්වයක් උරුම කර දීමටත් කටයුතු කරන බවට පොරොන්දු වනවා. රාජ්‍ය සේවය තුළ පඹ ගාලක් බවට පත්කොට ඇති වැටුප් අවුල සීරුවෙන් නිරාකරණය කරනු ලබන බවට පොරොන්දු වෙනවා.

වැඩකරන ජනතාව ලෙස ඔබ සෑම දෙනාම විවිධ වෘත්තීන්වල නියැලෙමින් පෞද්ගලික කාර්යයක නිරත වන බව පෙනුණත් ඔබ කරන්නේ සමාජමය කාර්යයක්. ඒ නිසාම එම කාර්යයේ නියුතුව සිට විශ්‍රාම ලැබූ විට බලා ගැනීම සමාජමය කාර්යයක්. සේවක අර්ථ සාධක අරමුදල කියන්නේ එවැනි සමාජ ආරක්ෂණ අරමුදලක්. 2008-2012 කාල පරිච්ඡේදය තුළ තමන්ගේ ගජමිතුරන්ට ලාභ ලැබීම සඳහා ඊපීඑෆ් අරමුදල කොල්ලකෑවා. පාඩුව කෝටි 2800යි. 2015 මහ බැංකු බැඳුම්කර සිදුවීමේදී අරමුදලට කෝටි 2000ක පාඩුවක් සිදුකළා. අපේ පාලනයක් යටතේ එම අරමුදල සුරක්ෂිත කොට වැඩි ප්‍රතිලාභ වැඩකරන ජනතාවට ලබා දෙන බවට පොරොන්දු වෙනවා.

අද වැඩකරන ජනතාවට තමන්ගේ පඩිපත ප්‍රමාණවත් නොවන නිසා වැඩි වේලාවක් අතිකාල වැඩකිරීමට සිදුව තිබෙනවා. ඔවුන්ට දිනකට පැය 10-12ක් වැඩ කිරීමට සිදුව තිබෙනවා. අනෙක් අතට අකාර්යක්ෂම පොදු ප්‍රවාහන සේවය නිසා වැඩකරන ජනතාව හෙම්බත් වී තිබෙනවා. බොහෝ දෙනෙකු විශාල අමතර පීඩනයකට පත්ව තිබෙනවා. වැඩකරන ජනතාවට මහමගදී අනවශ්‍ය කාලයක් ගතකිරීමට සිදුවීම නතර කොට ඔවුන් වෙනුවෙන් කාර්යක්ෂම පොදු ප්‍රවාහන සේවයක් ස්ථාපිත කරනු ලබන බවට පොරොන්දු වෙනවා.

පඩිපතින් සෞඛ්‍යයට හා අධ්‍යාපනයට විශාල පංගුවක් වෙන් කිරීමට වැඩකරන ජනතාවට සිදුව තිබෙනවා. මෙම තත්වය වහා නතර කළ යුතුයි."

## ජනාධිපතිවරණ අභියෝග... 03 පිටුවෙන්




අමතරව දේශපාලන කුහකත්වයන්ද තිබිය හැක. මේ නිසා පාලක හා ධනවාදී කඳවුරට එරෙහි ජනතා කැමැත්ත කුඩා කොටස්වලට බෙදීමට දරන ප්‍රයත්නයන් පරාජය කිරීම නව විකල්ප බලවේගය ඉදිරියේ ඇති අභියෝගයක් වේ.

අනෙක් අතට 'ජාතික ජන බලවේගය' ඉතා ඉක්මනින් ගම් මට්ටමට, බිම්මට්ටමට රැගෙනයාමේ අභියෝගයද එයට තිබේ. බිම් මට්ටමේ ජනයාට මෙම අලුත් පණිවිඩය, නව බලවේගය පිළිබඳ සුභාරංචිය ඉක්මනින් ගෙන යා යුතුය. මෙම අභියෝග ජයගන්නා ප්‍රමාණය මත නව බලවේගයේ ජයග්‍රහණයේ ප්‍රමාණය තීරණය වේ.


කෙසේ වෙතත් සාම්ප්‍රදායික දේශපාලන පක්ෂ හා නායකයන් කෙරේ ජනතාව තුළ පවතින කලකිරීමත්, නව වෙනසක අවශ්‍යතාවයත්, ධනවාදී කඳවුරේ පක්ෂ තුළ පවතින අභ්‍යන්තර අර්බුද හා එම පක්ෂවල අපේක්ෂකයන්ගේ දුර්වලතාත් මගින් ජාතික ජන බලවේගය වෙත හොඳ අවස්ථාවක් ලැබී තිබෙන අතර එය අත්පත්කර ගැනීමේදී මතුවන අභියෝගද හඳුනාගෙන ක්‍රියාත්මක වන්නේ නම් විශේෂයෙන් එහි අපේක්ෂක අනුර දිසානායක සහෝදරයා කෙරේ ඇති ජන ප්‍රසාදය විශ්වාසය හා ඔහුගේ හැකියාවත් හොඳින් යොදාගන්නේ නම් මේ ජනාධිපතිවරණය තුළ 'වෙනසක්' කිරීමේ ඉඩ තිබෙන බව ඉතා පැහැදිලිය.

## පරිවර්තනය ආරම්භ කිරීමට... 05 පිටුවෙන්



කියන්නේ නැහැ. හැමදෙනාම ඉන්නේ පීඩාවක, අර්බුදයක. හැමෝම මේ ක්‍රමයේ බේදවාචකයේ ගොදුරු බවට පත් වෙලා. ඒත් එකම ගැටලුව මෙය වෙනස් කළ යුතුයි හෝ වෙනස් කළ හැකිය කියල තවමත් සමහරු හිතන්නේ නැහැ. ඒ නිසා අප ඉල්ලා සිටින්නේ මේ රටේ දැනුම් තේරුම් ඇති මේ වැරදි ක්‍රමය වෙනස්කළ යුතුයි කියල සත්‍ය ලෙසම විශ්වාස කරන හැමදෙනාම දැන් පෙරමුණට එන්න ඕනෑ. රට තුළ ගැඹුරු සමාජ ආර්ථික දේශපාලන හා සංස්කෘතික වෙනසක් පරිවර්තනයක් කිරීම ආරම්භ කිරීමට හොඳම අවස්ථාව දැන් අපට, රටට ලැබී තියෙනවා. ඒ නිසා අවංකව හිතන හැමදෙනාම හැම සංවිධානයක්ම ඒ වෙනුවෙන් තම තමන්ට පුළුවන් ආකාරයෙන් මැදිහත් වුණොත්, ජනතාවගේ හිතනවිදිය වෙනස් කළොත් ජනතාවට, රටට නිසැක ලෙසම ජයග්‍රහණයක් තියෙනවා. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, අපේ රටේ අවංක හා සැබෑ වාමවාදී ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රගතිශීලී දේශප්‍රේමී හැමදෙනාගෙන්ම ජාතික ජන බලවේගය සමග එක්වෙන්න කියලා. ඔබට ජාතික ජන බලවේගය සමග නිල ලෙස එකතුවීමට නොහැකි නම් ඔබ හැම ස්වාධීන ලෙස ඔබ හැමට හැකි තැන්වල හැකි විදිහට මේ සටන දිනවීමට කටයුතු කරන්න කියලා අපි සැමගෙන් ඉල්ලනවා. රට දිනවන මෙම සටනේදී හැම දෙනාම ස්වේච්ඡාවෙන් කටයුතු කරන ක්‍රියාධරයන් වුණොත්, ජාතික ජන බලවේගය සමග සම්බන්ධවී හෝ එසේ නැතිව පවා ක්‍රියාශීලී ලෙස කටයුතු කළොත් රටේත් ජනතාවගේත් ජයග්‍රහණය ස්ථිරයි. ඒ සඳහා ක්‍රියාශීලී වන්න. ඔබේ යුතුකම ඉටුකරන්න කියල හැමදෙනාගෙන්ම අපි ඉල්ලා සිටිනව.

## සමාජවාදී රටක... 09 පිටුවෙන්



කරන බටහිර විරුද්ධවාදීන් ගෙන යන ප්‍රචාරය මින් අසත්‍යයක් බව ඔප්පු වෙයි.

සෝවියට් සංගමයේ වැඩි දෙනෙක් භාෂා දෙකක් කතා කරති. රටේ නොයෙක් ජනරජවලට ගිය මට වැඩ කරන ස්ථානවල, ගෙවල් දොරවල්වල හා විවේක ස්ථානවල සිටින අය ඉතා පහසුවෙන් රුසියන් බස සමග තමන්ගේ මව් බස කතා කරන බව මම දුටිමි. සමහරු තමන්ගේ මව් බස සමග රුසියන් බස මිශ්‍ර කොට කතා කරති.

පාසල්වල ඉතා සුළු භාෂාවන් පවා විශේෂ සැලකිල්ලකින් යුතුව උගන්වනු ලැබේ. පාසල්වල භාෂා 52ක් උගන්වන අතර, එම භාෂා 52න්ම පාසල් පොත් මුද්‍රණය කරනු ලැබේ. සුප්‍රසිද්ධ චිත්‍ර ශිල්පීන්ගේ උසස් චිත්‍ර ඇතුළත් පොතක් මුද්‍රණය කිරීමට යන වියදම කිසියම් භාෂාවක් උගන්වන පළමුවන පොත මුද්‍රණය කිරීමට වැය වෙයි. කෙතරම් වියදම් වුවත් ළමයින්ට පොත් දෙන්නේ නොමිලයේය. රුසියන් බස රුසියාව තුළ වෙසෙන විවිධ ජාතීන් ස්වකීය අදහස් හුවමාරු කර ගැනීමට පාවිච්චි කරන භාෂාව පමණක් නොව, එක්සත් ජාතීන්ගේ මණ්ඩලය, යුනෙස්කෝ ආයතනය ආදී විවිධ ජාත්‍යන්තර සංවිධානවලද පාවිච්චි කරන භාෂාවකි. බොහෝ රටවල් රුසියන් බස කෙරෙහි වැඩි වැඩියෙන් සැලකිලිමත් වන්නේ ඒ නිසාය. රටවල් 100කට වැඩි ගණනක නොයෙක් සංවිධාන මගින් රුසියන් බස උගන්වනු ලැබේ. රටවල් 54ක රුසියන් බස පාසල්වලද තවත් රටවල් 79 ක උසස් අධ්‍යාපන ආයතනවලද උගන්වනු ලැබේ. කෙටියෙන් කියතොත් පනස් කෝටියක් පමණ දෙනා රුසියන් බස පිළිබඳ එක්තරා ප්‍රමාණයක දැනුමක් ලබාගෙන සිටිති.

## බැංකුව විකිණීමේ... 07 පිටුවෙන්




ආර්ථික සූරාකෑම ලාංකේය භූමිය තුළ ව්‍යාප්ත කිරීමේ වත්මන් අවදියේදී, ඉතිහාසයේ ඔවුන් විසින්ම සකස් කළ නීති පද්ධති පවා වත්මන් අර්බුදයේ හිල් වැසීමට ප්‍රමාණවත් නොවන බවය; බාධාකාරී බවය. විවෘත කිරීමේ පළමු පියවරේදී අවශ්‍ය වූ නීති විවෘත කිරීමේ තුන්වන පියවරේදී බාධාකාරී වී තිබේ. මේ සියලු වෙනස්කම් ජනතාවගේ යහපතට නොව කොල්ලකාරී ධනවාදයේ ප්‍රතිලාභ භුක්ති විඳින සුළු පිරිසක් වෙනුවෙනි. ඒ නිසාම මෙම කුමන්ත්‍රණයන් පරාජය කළ හැක්කේ පුළුල් ජනතා පෙළගැස්මකින් හා ජනතාවාදී පාලනයකින්ම පමණකි. නැතහොත් මේ දක්වාත් ජනතාවාදී අරගලයන්ගේ ප්‍රතිඵල ලෙස ආරක්ෂා කරගත් බොහෝ දේ අහිමිවිය හැකිය. හේතුව බිඳවැටෙන ධනවාදී යාන්ත්‍රණය අන්තිම පැයේදී ඉතාම බිහිසුණු වීමය; තමන්ම ගොඩනගන දේ පවා විනාශ කිරීමට උත්සාහ ගැනීමය.

## විශේෂ අධිකරණ... 13 පිටුවෙන්



ඕනෑ නම් මම උදාහරණ දෙන්නම්. අනුරාධපුරය, මොණරාගල, අම්පාර වැනි දිස්ත්‍රික්කවල මහාධිකරණ විනිශ්චයකාරවරුන්, පළාත්බද මහාධිකරණ විනිශ්චයකාරවරුන් තවත් උසාවිවල වැඩ බලනවා; උසාවි දෙක-තුනක වැඩ කරනවා. ඒවාට අවශ්‍ය කරන මහාධිකරණ විනිශ්චයකාරවරුන් බඳවා ගැනීම හරියාකාරව කරලා නැහැ. බඳවා ගත් මහාධිකරණ විනිසුරුවරුන්ට යම්කිසි දීමනාවක් දෙනවා; පඩියක් දෙනවා. ඒ අයට පෙට්‍රල් ලීටර් 225ක දීමනාවක් දුන්නා. පෙට්‍රල් ලීටර් 225කට රුපියල් 90,000ක් වියදම් යනවා. ආණ්ඩුව මොකක්ද කළේ? එකටත් සියයට 24ක් බදු ගහනවා. මහාධිකරණ විනිශ්චයකාරවරුන්ට සහ අනෙක් විනිශ්චයකාරවරුන්ට පෙට්‍රල් දීමනාව කියලා දීමනාවක් ලබාදීලා, එම දීමනාවෙන් සියයට 24ක් බදු විධියට ආපසු අය කරගන්නවා. එතකොට ඇත්තටම මහාධිකරණ විනිසුරුවරුන්ට ලැබෙන්නේ රුපියල් 68,400යි. ඒ නිසා මහාධිකරණ විනිශ්චයකාරවරුන් රවටන ආණ්ඩුවක් මේ තිබෙන්නේ.

උසාවි පද්ධතියේ ඉන්න සේවකයන් පිළිබඳ කාරණයක් මම මේ අවස්ථාවේදී මතු කරන්න කැමතියි. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවක් තිබෙනවා. 1982 දී නිකුත් කළ ගැසට් පත්‍රයට අනුව බඳවා ගත් ඒ නිලධාරීන් ප්‍රමාණයක් ඉන්නවා. දැනට සේවකයන් 7,000ක් විතර අධිකරණ පද්ධතියේ වැඩ කරනවා. 1982 දී මේ අය බඳවා ගන්නකොට, සාමාන්‍ය රජයේ සේවකයන්ට වඩා එක් ශ්‍රේණියක් ඉහළින් තමයි බඳවා ගත්තේ. එහෙම බඳවා ගන්න හේතුව වුණේ, රෙජිස්ට්‍රාර්වරයාගේ සිට මේ නිලධරයන්ගේ රාජකාරිය අධිකරණ සේවා කොමිෂන් සභාව යටතේ තිබීමයි. අධිකරණ සේවා කොමිසම යටතේ රාජකාරි කරනකොට ඔවුන්ට සීමා තිබෙනවා. ඔවුන්ට දේශපාලන අයිතිවාසිකම් නැහැ; අතිකාල දීමනා නැහැ; වෙනත් දීමනා නැහැ. ඒ විතරක් නොවෙයි, ඔවුන්ට සීමා තිබෙනවා. ඔවුන්ට උසස්වීම් ලබා දෙන්නේත් නැහැ; රජයේ වෙනත් ආයතනවලට ස්ථාන මාරුවීම් ලබා දෙන්නෙත් නැහැ. උපරිම වශයෙන් ඔවුන්ට ලැබෙන්නේ එක් අධිකරණයක සිට තවත් අධිකරණයකට ස්ථාන මාරුවක් විතරයි. නමුත්, අද වනතුරු මේ විශේෂ උපලේඛනගත රජයේ සේවකයන්ට උසස්වීම් පටිපාටියක් නැහැ; ඔවුන්ට දේශපාලන අයිතිවාසිකම් නැහැ; අතිකාල දීමනා නැහැ; විශේෂ දීමනා නැහැ. වෙනත් රජයේ ආයතනයකට මාරුවීමක් කර ගන්න බැහැ. මේ කිසිදු දීමනාවක් නැත්නම්, දේශපාලන අයිතිවාසිකමක්වත් නැත්නම්, අඩු ගණනේ ඔවුන්ට උසස්වීමේ පටිපාටියක්වත් තිබෙන්නෙ ඕනෑ. ඒකවත් හදලා නැහැ.

රාජ්‍ය සේවයේ සිටින අනික් අය ලබන අයිතිවාසිකම් මේ අයට නැති නිසා, ඔවුන් තුළ මානසික අතෘප්තිමත් භාවයක් ඇති වෙලා තිබෙනවා. ඇත්තටම, ඔවුන් එහෙම සීමාසහිත, සංවෘත- සේවාවක තබාගෙන ඇත්තේ රහස්‍යභාවය ආරක්ෂා කරන්නත්, නඩු පිළිබඳව තිබෙන තොරතුරු වෙනත් තැන්වලට යන එක වළක්වා ගන්නත් වෙන්න පුළුවන්. ඒක එහෙම වීම සාධාරණයි. එහෙම වෙනවා නම්, ඔවුන්ට උසස්වීමේ පටිපාටියක් සැදිය යුතුයි. උසස්වීමේ පටිපාටියක් ක්‍රියාත්මක නොවී, සංවෘතව මේ සේවාවට බඳවාගෙන, ඒක දිගටම ඒ විධියට තියා ගත්තාම, ඔවුන් තුළ රාජකාරියේ තෘප්තිමත්භාවය ඇති වන්නේ නැහැ. එතකොට, අධිකරණ පද්ධතියේ කාර්යක්ෂමතාව ඇති වන්නේ නැහැ.

අද ගෙන එන මේ නියෝගය මගින් අධිකරණ ක්‍රියා පටිපාටියේ යම් සංශෝධනයක් වෙනවා. ඒක හොඳ දෙයක්. හැබැයි, ඒක විතරක් මදි. අපි හරයාත්මක වෙනස්කම්ද කළ යුතුයි. හරයාත්මක සංශෝධනවලට යනවා නම්, මම මේ සඳහන් කළ දේවල් වහාම ක්‍රියාත්මක කළ යුතුයි. එහෙම නොකළොත්, අපි බලාපොරොත්තු වෙන කාර්යක්ෂමතාව ලැබෙන්නේ නැහැ.

රටේ නඩු කල් යෑම ගැන අමුතුවෙන් කථා කරන්න දෙයක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ, අර දින 52 කුමන්ත්‍රණය වෙලාවේ මුළු රටම, ලෝකයම දැක්කා, මිරිස් කුඩු ගහලා, මෙතැන තිබෙන පොදු දේපළ කඩා බිඳදැමූ ආකාරය. කෝ, පොදු දේපළ පනත යටතේ නඩු දමලා ඒ අයට දඬුවම් දුන්නාද? අපේ මැති ඇමතිවරුන්ට මිරිස් කුඩු ගැහුවා. මටත් මිරිස් කුඩු ගැහුවා. කෝ, ඒ ගැන නඩු ඇහුවාද? ඒ පිළිබඳව පොලීසියට පැමිණිලි කළා; මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ 4 වැනි තට්ටුවට ගිහිල්ලා පැමිණිලි කළා. අද වෙනතුරු ඒවාට නඩු දැම්මාද? උත්තරීතර යැයි කියා ගන්නා පාර්ලිමේන්තුවේ සිදුවූ මහා අපරාධයට නීතිය ක්‍රියාත්මක නොවීම තුළ සාමාන්‍ය, අහිංසක ජනතාව වෙනුවෙන් යුක්තිය පසිඳලීම පිළිබඳ විශ්වාස නැති වෙනවා. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කරන්න මතුපිටින් පුංචි පුංචි පැලැස්තර දමලා කරන්න බැහැ. හරයාත්මක සංශෝධනයකින්, හරයාත්මක වෙනස්කමකින් පමණයි, ඒක කරන්න පුළුවන් වන්නේ.

## සංස්කෘතික උරුමයන්...



නැහැ. හැමදාම, මිනිස්සු සිය දහස් ගණනින් අනුරාධපුරයට යනවා. පුරුද්දට, ඔහේ යන්නන්වාලේ යනවා මිසක්, ඒ අයට ඒ ස්ථාන ගැන දැනුමක් තිබෙනවාද? මම කියන්නේ නැහැ. මිනිස්සු පාඩම් කරන්න සංස්කෘතික මධ්‍යස්ථානවලට, පන්සල්, පල්ලිවලට යනවා කියලා. වෙන වුවමනාවකටයි ඒ අය යන්නේ. නමුත්, ඒ අතරේදී අපට මිනිසුන්ට යම් දෙයක් දිය හැකියි. අඩුම තරමින් ප්‍රධාන සංස්කෘතික මධ්‍යස්ථානවලවත් යම් පුවරුවක් හදලා, මිනිසුන්ට විනාඩි දෙක තුනකින් බලා ගන්න පුළුවන් වෙන විධියට එම ස්ථානය ගැන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් යම් විස්තරයක් ඇතුළත් කරන්න.

සංස්කෘතික උරුමය කිව්වාම, සිංහල, බෞද්ධ සිද්ධස්ථාන විතරද අයිති වෙන්නේ? ඒ ගැන අපේ රටේ සිංහල දරුවන් එච්චර දන්නේ නැහැ කියලා මම හිතනවා. මොකද, අච්චු පොත් බැලුවාම, මේ රටේ දෙමළ සංස්කෘතික උරුමය ගැන ඒ සමහර අච්චු පොත්වල නැහැ. මම මීට අවුරුදු ගණනකට කලින් තලවිල පල්ලියට ගියාට පස්සේ තමයි දැනගත්තේ, ඒක අපේ රටේ පුරාවිද්‍යාත්මක වශයෙන් සංරක්ෂණය කළ අවුරුදු සිය ගණනක් පැරණි සංස්කෘතික උරුමයක් කියලා. එක රටක් ඇතුළේ සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනාම ජීවත් වෙන නිසා, යුද්ධ කරගත්තත් අවසානයේ නැවත සිංහල, දෙමළ, මුස්ලිම් කාටත් අපට එකට ඉන්න වෙනවා කියලා පිළිගන්නා නිසා, අනිවාර්යයෙන්ම සංස්කෘතික කටයුතු වෙනුවෙන් මුදල් වෙන් කරනවාත් ඇති. අපේ රටේ සිංහල බෞද්ධ සංස්කෘතික උරුමයන් තමයි වැඩිපුර තිබෙන්නේ. ඒ ගැන විවාදයක් නැහැ. නමුත්, ඒ අතරේ කතෝලික, ඉස්ලාම්, හින්දු ආගමික උරුම පිළිබඳවත් ජනතාවට අවබෝදයක් ලබාදිය යුතුයි; පාසල් අච්චු පොත්වල පාඩම්වලට ඒවා හඳුන්වා දිය යුතුයි.

සංස්කෘතික උරුමය කියන්නේ ආගමික උරුමය විතරක් නොවෙයි කියන කාරණයත් මම කියන්න ඕනෑ. අපේ රටේ ආගමික නොවන සංස්කෘතිකාංග හුඟක් තිබෙනවා. පැරණි දේවල් තිබෙනවා. අපේ රටේ හිටපු පැරණි විද්‍යාඥයන් ගැන අපි දන්නේ නැහැ. අපේ රටේ ඉඳලා තිබෙන්නේ පැරණි ස්වාමීන් වහන්සේලා විතරක් නොවෙයි නේ. පැරණි ගණිතඥයෝ ඉඳලා තිබෙනවා. එහෙම නැත්නම්, මේ විධියේ irrigation projects කරන්න බැහැ. ඔබතුමා හිතනවාද, ඒ වාගේ අය නැතිව ඔය වැව් හදන්න පුළුවන් කියලා. ඒකට ගණිතඥයෝ ඕනෑ. සමහරවිට, "ගුණසේකර" හෝ "මයිල්වාගනම්" කියලා ගණිතඥයෙක් ඉන්න පුළුවන්. භෞතික විද්‍යාඥයන් ඉන්න පුළුවන්. බරණ ගණිතයා ගැන අපි අහලා තිබෙනවානේ. අන්‍යාගමික සංස්කෘතික උරුමය ගැනත් ජනතාවට ඉගැන්වීමේ වගකීමක් ඔබතුමාට තිබෙනවා. අතීතයේ මිනිස්සු හැම වෙලාවේම පන්සල ඇතුළේ හිටියේ නැහැ. ඒ ගොල්ලෝ කුඹුරු වැඩ කළා. ඒ වාගේම ඒ ගොල්ලෝ විනෝද වුණා. සින්දු කිව්වා. ගහගත්තා. එහෙම දේවල් සිදුවුණා. අන්‍යාගමික සංස්කෘතික උරුමයකුත් තිබුණා. විශේෂයෙන්ම, අනුරාධපුරයේ CCF එක ගොඩක් active නිසා ඒවා මතු කරන්න.

මේ සංස්කෘතික උරුම ජාතිවාදයට පාවිච්චි කරනවා අප දැක තිබෙනවා. "රාවණා " ගත්තාම, ලංකාවේ සිංහල අය හිතාගෙන ඉන්නවා එයා "සිංහල රාවණා " කියලා. කෝනේෂ්වරම් කෝවිලට ගියාම අපට පෙනෙනවා, එයා "දෙමළ රාවණා" කියලා. ඒ නිසා, අපට අපේ දරුවන්ට උගන්වන්න ලොකු දෙයක් තිබෙනවා. මොකක්ද? අපි අද විවිධ විධියට බෙදිලා හිටියාට, මීට අවුරුදු 2000කට, 3000කට විතර පෙර අපි සියලුදෙනාම මිනිස්සු විධියට තමයි ඉඳලා තිබෙන්නේ. ඒ කාලයේ, රාවණා දෙමළ කථා කළාද, සිංහල කථා කළාද, එයා පන්සිල් ගත්තාද කියලා කාටවත් කියන්න බැහැනේ. මෙන්න මේ සංස්කෘතික උරුමවලට, දායාදවලට ජාතිවාදී, ආගම්වාදී අර්ථයන් දෙන්නේ නැතිව, ඒවා මිනිසුන්ගේ ජයග්‍රහණ ලෙස, නිර්මාණ ලෙස, අපේ මුතුන් මිත්තන්ගේ නිර්මාණ ලෙස හඳුනා ගන්න විධියේ මැදිහත්වීමක් කරන්න කියලා ඉල්ලා සිටිනවා."

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




අපේක්ෂාවේ අපේක්ෂකයාට වැඩකරන ජනතා සහය ...



ග්‍රීසියේ කොමියුනිස්ට් තරුණ උළෙලට සහභාගි වෙමින්...



පරිසර විනාශයට එරෙහිව ඇල්ල ජනතාව දැනුවත් කරමින්...



හම්බන්තොට මහගෙදරට ගෙවැදී...



වතුකර කඳුළු පිස දමනු වස්..



දේශීය වෛද්‍ය විද්‍යායතන ගැටලු විමසා ...

# සතුට පිරුණු ජීවිතයක් සියලු දෙනාටම ලබා දෙනවා

**ජාතික ජන බලවේගයේ ජනාධිපති ධුර අපේක්ෂක** **අනුර කුමාර දිසානායක සහෝදරයා**

සහතික වශයෙන්ම මේ රට ගොඩනගා සතුට පිරුණු ජීවිතයක් සියලු දෙනාට ම ලබා දෙන බවට සපථ කළ ජාතික ජන බලවේගයේ ජනාධිපති ධුර අපේක්ෂක අනුර කුමාර දිසානායක සහෝදරයා එය කළ හැක්කේ අදූෂිත ව්‍යාපාරයකට පමණක් බවත් එම නැවුම් පණිවුඩය රට පුරා ගෙනයාමට හැකියාව ඇත්තේ ජාතික ජන බලවේගයට පමණක් බවත් අවධාරණය කළේය.

අනුර දිසානායක සහෝදරයා මෙසේ අදහස් දැක්වූයේ පසුගිය පසුගිය 28වැනි දින රුහුණු විශ්වවිද්‍යාලයේ තාගෝර් ශාලාවේදී පැවති මාතර ජනතා සභාවේදීය. තවදුරටත් අදහස් දක්වමින් අනුර සහෝදරයා මෙසේද කියා සිටියේය.

මේ සභාවේ අහපු ප්‍රශ්නවලින් හුගක් ඇහුවේ බලයට ආවාට පස්සේ කරන දේවල් ගැන. ඒ කියන්නේ, ජයග්‍රහණය පිළිබඳව තියෙන විශ්වාසය. ඒක හොඳ දෙයක්. අපේ පාලනයක් යටතේදී අනිවාර්යයෙන් ම හොරුන්ට දඬුවම් කරනවා. ඒ විතරක් නොවෙයි, හොරකමත් නතර කරනවා.

ඊළඟට මෙතැන දී ඇහුවේ, පළාත් සභා ශක්තිමත් වෙලාවක විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම භයානකයි නේ ද කියලා. පළාත් සභාවලට ජනාධිපතිවරයාගේ බලය ගැටග ැහිලා තියෙන්නේ, ආණ්ඩුකාරවරයාගෙ න්. අපි ඉදිරිපත් කර තිබෙන විසිවැනි සංශෝධනයේ ජනාධිපතිවරයාට ආණ්ඩුකාරවරුන් පත් කිරීමට තිබෙන බලය කිසිසේත්ම අහෝසි වෙන්නේ නැහැ.

ලෝකයේ රටවල් ණය ගන්නේ ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් සහ තාක්‍ෂණ අවශ්‍යතා වෙනුවෙන්. අපේ රට ණය අරගෙන ප්‍රාග්ධනය වශයෙන් යොදවලා වත්කම් උපයලා නැහැ. ඒ නිසා ණය උගුලක අහුවෙලා ඉන්නේ. අපි හිතාගෙන හිටියේ, ණයවලින් අතුරුදන් කර ඇත්තේ, සියයට දහයක් කියලයි. නමුත්, විගණකාධිපතිවරයා කියන්නේ රුපියල් කෝටි එකොළොස් ලක්‍ෂයක් ණය අරගෙන උපයලා තියෙන්නේ, කෝටි එක්ලක්‍ෂ අසූදාහක් කියලයි. ඒ කියන්නේ, කෝටි නවලක්‍ෂ විසිදහසක් අතුරුදන්. ණය උගුලක් වෙලා තියෙන්නේ ඒ නිසා. අපේ පාලනයක් යටතේ මේ ණය ගෙවීම් සමාලෝචනය කර ගන්න ඕනෑ. අනෙක ණය ගන්නේ නිෂ්පාදන කර්මාන්තවලට. මේ ආර්ථිකය ගොඩනගන මූලික පදනම ඒක.

නිෂ්පාදන කර්මාන්ත බිහි කරන්නේ කොහොම ද? එදා ඉඳලා ම අපි කුරුඳු අපනයනය කළේ මිටි බැඳලා. අදත් එහෙමයි. මේකෙන් නව නිෂ්පාදන කර්මාන්තයක් හදන්න පුළුවන්. අලුත් ලෝකයට ගැළපෙන අලුත් නිෂ්පාදනයක් කරන්න පුළුවන්. අපේ මිනිරන් අදත් යවන්නේ කුට්ටි පිටින්. ටොන් එකක් ඩොලර් දෙදහයි. කෝප් කමිටුවේ දී ම ඒ සමාගම පිළිගත්තා මේවා පිරිසිදු මිනිරන් බවට නිස්සාරණය කර කිලෝවක් ඩොලර් පන්දහසකට විකුණන්න පුළුවන් කියලා. පුල්මුඩේ ඛනිජවැලි සම්පතෙන් වාර්ෂිකව ටොන් ලක්‍ෂ විස්සක් ගන්නවා. දැන් වැලි පටවනවා. ඒවා නිස්සාරණය කරලා සිය ගුණයක වටිනාකම් එකතු කරන්න පුළුවන්. පොස්පේට් නිධියත් එහෙමයි. අන්න ඒ වාගේ කර්මාන්ත ඇති කර ජාතික නිෂ්පාදනය වැඩි කරන්නයි, ණය යොදවන්න ඕනෑ. තාක්‍ෂණය ගේන්න ඕනෑ කරන්නේ ඒ කර්මාන්තවලට. ඒ වාගේ ම නව ව්‍යවසායකයන් ලක්‍ෂ දෙකක් ගොඩනගන්න ඕනෑ. අන්න ඒ වෙනුවෙනුයි ප්‍රතිපත්ති හදන්න ඕනෑ. සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත බිහි කර ඔවුන්ගෙන් සාධාරණ බද්දක් රජයට ගන්න ඕනෑ. අන්න එතකොට ජනතාව මත බදු බර නොපටවා, රාජ්‍ය ආදායම් ඉහළ දමා ගන්න පුළුවන්.



සමහර අය අහනවා, ඔක්කොම ප්‍රතිපත්ති හොඳයි, ඔය අය දිනයිද කියලා. ඔව්. අපට දිනන්න අවස්ථාව තියෙනවා. මේ අවස්ථාවේ ඒක යොදා ගන්නේ නැතිව පවුලකට බලය දෙන්න නම්, ඒකටත් අවස්ථාව තියෙනවා. තව පැත්තකින් හොඳට නිදිමරන්නෙක් තෝරා ගන්න ඕනෑ නම්, ඒකටත් අවස්ථාව තියෙනවා. නමුත්, ජනතාව තෝරා ගන්නේ තමන්ගේ පාලකයෙක් නම්, ඒ ජාතික ජන බලවේග යේ නියෝජිතයා ම පමණයි. පවුලකින් තෝරන අපේක්ෂකයෙක් හරි රණ්ඩු වෙලා අපේක්ෂකකම් ගන්න කෙනෙක් හරි නොවෙයි. සාමූහිකත්වයෙන් විතරයි, මේක ජයග්‍රහණය කරන්න පුළුවන්. ඒ සාමූහික ප්‍රයත්නය තියෙන්නේ, ජාතික ජන බලවේගයේ පමණයි."

# අනුර සහෝදරයා ඔබේ ජනාධිපති සහෝදරයා බවට පත් කර ගන්න

**ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික** **සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**

ලෝකය පුරා සිටින ශ්‍රී ලාංකිකයන් මේ වන විට ජාතික ජන බලවේගයේ අපේක්ෂකයා වෙනුවෙන් ප්‍රචාරක කටයුතුවල නිරත වී සිටින බව අනාවරණය කළ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, මෙතෙක් ජාතික ජන බලවේගය වටා එක් නොවූ සියලු දෙනාට ජනාධිපති ධුර අපේක්ෂක අනුර දිසානායක සහෝදරයා තමන්ගේ ජනාධිපති සහෝදරයා බවට පත් කර ගන්නා ලෙසට ආරාධනා කළේය.

සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 28වැනි දින රුහුණු විශ්වවිද්‍යාලයේ තාගෝර් ශාලාවේදී පැවති මාතර ජනතා සභාව අමතමිනි. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මෙසේද පැවසීය.

"ජාතික ජන බලවේගයේ අපේක්ෂක අනුර දිසානායක සහෝදරයා ජයග්‍රහණය කිරීම වෙනුවෙන් ජනතාව පෙළගැසෙමින් සිටිනවා. කොළඹ ගෝල්ෆේස් පිටියේදී, දඹුල්ලේදී, තංගල්ලේදී වාගේම අද මාතරදීත් සනාථ කරන්නේ, ඒ අධිෂ්ඨානයයි. උතුරේ සහෝදරවරු ඉල්ලන්නෙත්, පේදුරුතුඩුවට අනුර සහෝදරයාව ගේන්න කියන එකයි. අවුරුදු හැත්තෑඑකක් රැවටුණු ජනතාව ඒකෙන් මිදෙන්න මුළු රට පුරාම බලාගෙන ඉන්නවා. සිංහල, දෙමළ, මුස්ලිම් භේදයකින් තොරව ජනතාව දේශපාලනිකව වෙනස් වෙමින් ඉන්නවා. ඒ ජනතාවට අලුත් නායකත්වයක්, අලුත් මගපෙන්වීමක් දෙන්න ජාතික ජන බලවේගය පෙරට ඇවිත් තියෙනවා. ඒ බලවේගයේ අපේක්ෂක අනුර සහෝදරයා මේ රටේ ඉතිහාසයේ වැටුප් නොගන්නා ජනාධිපති හැටියට ජනතාව තෝරා පත් කර ගන්නා බව ස්ථිරයි. වැටුප් නොගන්නා මන්ත්‍රීවරු හැදුවා වාගේම ජනතා විමුක්ති පෙරමුණේ වැටුප් නොගන්නා ජනාධිපතිවරයා බිහි කරන බව කියන්න ඕනෑ. ඔහු මේ විධායක ජනාධිපති ධුරය අහෝසි කරන බවටත් සහතික වෙනවා.



අද අලුත් දේශපාලන තත්ත්වයක් නිර්මාණය වෙමින් තිබෙනවා. මේ තත්වය වර්ණවත් කරන්න විදේශගත වී ඉන්න අපේ ජනතාව පවා පෙළගැසී ඉන්නවා.

# කෘෂිකර්මාන්තයේ නව ප්‍රබෝධමත් යුගයක් ඇරඹීමට අප සූදානම්

**ජාතික ජන බලවේගයේ ජනාධිපති ධුර අපේක්ෂක** **අනුර කුමාර දිසානායක සහෝදරයා**

රටට අවශ්‍ය ආහාර නිෂ්පාදනය කර දෙන්නේ ගොවි ජනතාව බැවින් ලෝකයේ සෑම රාජ්‍යයක්ම පාහේ ගොවි ජනතාවට විශාල සමාජ වටිනාකමක් ලබාදී තිබෙන නමුත් ලංකාවේ ගොවිතැනෙන් පමණක් ජීවිකාව සපුරාගත නොහැකි බවත් සමාජ වටිනාකම නිර්මාණය නොවන බවත් පෙන්වා දුන් ජාතික ජනබලවේගයේ ජනාධිපති ධුර අපේක්ෂක අනුර කුමාර දිසානායක සහෝදරයා, කෘෂිකර්මාන්තයේ නව පරිවර්තනයක් ඇති කිරීමටත් ගොවි ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමටත් කටයුතු කොට ඔවුන්ට හිමි සමාජීය තත්වය අත්පත්කරදීම වෙනුවෙන් කෘෂිකර්මාන්තයේ නව ප්‍රබෝධමත් යුගයක් ඇරඹීමට සූදානම් යැයි ප්‍රකාශ කළේය.

අනුර කුමාර දිසානායක සහෝදරයා මේ අදහස් දැක්වූයේ පසුගිය 24වැනි දින දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන භූමියේ පැවති සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික මහා සමුළුව අමතමිනි. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද කියා සිටියේය.

"නව වගා සැලසුම්, නව වගා ක්‍රම, වගාවට නව තාක්ෂණය කැඳවාගෙන එන නව ප්‍රතිපත්තියක් අපි නිර්මාණය කරන්න ඕනෑ. ගොවි ජනතාව එකතු වුණු සාමූහික කෘෂිකර්මාන්තයක් ගැන කල්පනා කරන්න ඕනෑ යුගය ඇවිල්ල තියෙන්නේ. තවදුරටත් මේ බිම් කට්ටි කුඩාවෙමින් කෘෂිකර්මාන්තය මේ යන ගමන නතර කරන්න ඕනකම තිබෙනවා. ඒ සඳහා නව වගා සැලැස්මක් අපි ජනතාවට දෙන්න සූදානම්. ගොවි ජනතාවට තමන් නෙළන අස්වනු සාධාරණ මිලකට විකුණා ගැනීමේ හැකියාව, පාරිභෝගික ජනතාවට




ස්ථාවර මිලකට භාණ්ඩ මිලදීගැනීමේ හැකියාවත් අපි නිර්මාණය කරන්න ඕනෑ. කෘෂිකර්මාන්තයේ එවැනි පරිවර්තනයක් කරන්න අපි ලෑස්තියි. කෘෂිකර්මය කියන්නෙ අපේ රට ගොඩනැගීමේ මාවතේ ඉතාමත් වැදගත් ක්ෂේත්‍රයක්. ඒ නිසා මෙය ගෙඩනැගිය හැකි ගොඩනැගීමට අවශ්‍ය වන දක්ම වැඩපිළිවෙළ අප සතුව තිබෙනවා."


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.